# PAYPAL පරිශීලක ගිවිසුම

## ඔබේ ගිණුම පිළිබඳව

මෙම පරිශීලක ගිවිසුම 2021 සැප්තැම්බර් 10 වන දින සිට සියලු පරිශීලකයන් සඳහා බල පවත්වනු ඇත.

### PayPal වෙත සාදරයෙන් පිළිගනිමු!

මෙම පරිශීලක ගිවිසුම, ඔබ සහ සිංගප්පූරු සමාගමක් වන PayPal Pte. Ltd. අතර ඇති කරගත්, ඔබගේ PayPal ගිණුම සහ PayPal සේවාවන් භාවිතා කිරීම පාලනය කරන ගිවිසුමකි. ඔබ තනි පුද්ගලයකු නම්, PayPal ගිණුමක් විවෘත කර PayPal සේවා භාවිතා කිරීම සඳහා, ඔබ **ලෝකව්‍යාප්ත PayPal** පිටුවෙහි ලැයිස්තුගත කර ඇති රටවල්/කලාපවලින් එකක පදිංචිකරුවකු සහ වයස අවුරුදු 18ට වැඩි අයකු හෝ ඔබ පදිංචි රටෙහි/කලාපයෙහි වැඩිහිටි වයසට පත් අයකු විය යුතු යි. ඔබ ව්‍යාපාරයක් නම්, PayPal ගිණුමක් විවෘත කර PayPal සේවා භාවිතා කිරීම සඳහා, ව්‍යාපාරය **ලෝකව්‍යාප්ත PayPal** පිටුවෙහි ලැයිස්තුගත කර ඇති රටවල්/කලාපවලින් එකක සංවිධානගතව, ක්‍රියාකාරීව හෝ ස්ථානගතව තිබිය යුතු යි.

PayPal ගිණුමක් විවෘත කර භාවිතා කිරීම මගින් ඔබ මෙම පරිශීලක ගිවිසුමේ සියලු නියම හා කොන්දේසි පිළිපැදීමට එකඟ වෙයි. ඔබ විසින් පහත ඒවා ඇතුළුව, පහත අතිරේක ප්‍රතිපත්ති හා ඔබට අදාළ වන නෛතික ගිවිසුම් පිටුව මත ඇති එක් එක් වෙනත් ගිවිසුම්වලට ද අනුකූල වීමට එකඟ වෙයි:

- පිළිගත හැකි භාවිත ප්‍රතිපත්තිය
- විකල්ප ගෙවීමේ ක්‍රම නියම

කරුණාකර මෙම පරිශීලක ගිවිසුමේ සියලු නියම හා කොන්දේසි, මෙම ප්‍රතිපත්තිවල හා ඔබට අදාළ වන එක් එක් ගිවිසුම්වල නියම ප්‍රවේසමෙන් කියවන්න.

අප විසින් කලින් කලට මෙම ගිවිසුම හා ඉහත ලැයිස්තුගත කර ඇති ප්‍රතිපත්තිවලින් ඕනෑම එකක් සංශෝධනය කරනු ලබනු හැකිය. වෙනත් අයුරකින් දන්වා නැතිනම්, සංශෝධිත අනුවාදය අප එය අපේ වෙබ් අඩවියේ පළ කරන අවස්ථාවේ දී බලාත්මක වනු ඇත. අපගේ වෙනස් කිරීම් මගින් ඔබේ අයිතීන් අඩු කරන්නේ නම් හෝ ඔබේ වගකීම් වැඩි කරන්නේ නම් අපි අපේ වෙබ් අඩවියේ ප්‍රතිපත්ති යාවත්කාලීන කිරීම් පිටුව මත නිවේදනයක් පළ කර ඔබට යටත් පිරිසෙයින් දින 14ක දැනුම්දීම් කාල සීමාවක් ලබා දෙන්නෙමු. ඔබ විසින් PayPal සේවා සඳහා ලියාපදිංචි වූ අවස්ථාව වන විටත් නෛතික ගිවිසුම් පිටුවෙහි පළ කර ඇති ප්‍රතිපත්ති යාවත්කාලීන කිරීම් පිටුව මත දක්වා ඇති සියලු ඉදිරි වෙනස් කිරීම් මෙම පරිශීලක ගිවිසුමට යොමු කිරීම මගින් ඇතුළත් කර ඇති අතර ප්‍රතිපත්ති යාවත්කාලීනය තුළ දක්වා ඇති පරිදි බලාත්මක වනු ඇත.

ඔබ සංශෝධිත නියම හා කොන්දේසිවලට එකඟ නොවන්නේ නම්, ඔබ විසින් PayPal සේවා භාවිතය නවත්වා, ඔබේ ගිණුම වසා පිරිවැයක් හෝ දඩ රහිතව අප සමග ඔබට ඇති සම්බන්ධතාව අවසන් කළ යුතුය. මෙම පරිශීලක ගිවිසුම සේවාවන්හි ඔබේ පෙර භාවිතාවන්ට ද අඛණ්ඩව අදාළ වනු ඇත.

## අපගේ ප්‍රධාන ව්‍යාපාරය පිළිබඳව

PayPal යනු ගෙවුම් සේවා සැපයුම්කරුවකු වන අතර අන්තර්ජාලය ඔස්සේ ඔබ වෙත අපේ PayPal සේවා නිර්මාණය, කළමනාකරණය, පවත්වාගැනීම හා සපයා දීම මගින් එසේ ක්‍රියා කරයි. අපගේ සේවා මගින් ඔබට PayPal ගිණුමක් ඇති ඕනෑම අයකු වෙත ගෙවීම් යැවීමට හා, ලද හැකි ඕනෑම ස්ථානයකින් ගෙවීම් ලබා ගැනීමට පුළුවන. අපගේ සේවා ලද හැකි බව රට/කලාපය අනුව වෙනස් වේ. ඔබට ඔබේ PayPal ගිණුමට ලොගින් වීම මගින් ඔබේ රට/කලාපය තුළ ලද හැකි සේවා මොනවාදැයි යන්න බැලිය හැකිය.

PayPal සේවා PayPal Pte. Ltd මගින් පිරිනැමේ.

මෙම පරිශීලක ගිවිසුම PayPal සේවාවන්හි යාචනයක් නොවන අතර PayPal මෙම පරිශීලක ගිවිසුම ඔස්සේ කිනම් හෝ රටක්/කලාපයක් හෝ වෙළෙඳපොළක් ඉලක්ක නොකරයි.

## ගිණුමක් විවෘත කිරීම

අපි ගිණුම් වර්ග දෙකක් පිරිනමන්නෙමු: පුද්ගලික ගිණුම් හා ව්‍යාපාර ගිණුම්.

සියලුම PayPal ගිණුම් මගින් ඔබට පහත ආකාරයේ කටයුතු කිරීමට ඉඩ සලසයි:

- ගෙවීම් යවන්න සහ ලබන්න.
- ජංගම උපාංග භාවිතයෙන් මාර්ගගතව හෝ අලෙවිසැල් තුළ භාණ්ඩ මිල දී ගන්න.
- ඔබේ ණයපත, හර පත, බැංකු ගිණුම, PayPal ශේෂය, ඉ-චෙක්පත හෝ වෙනත් ගිණුම් ක්‍රම භාවිතයෙන් ගෙවීම් සිදු කිරීම.
- ණයපත, හර පත, බැංකු ගිණුම, PayPal ශේෂය, ඉ-චෙක්පත හෝ වෙනත් ගිණුම් ක්‍රම භාවිතයෙන් සිදු කරන ලද ගෙවීම් අන් අය වෙතින් පිළිගැනීම.

සියලු ID, මුරපද, පුද්ගලික හඳුනාගැනීමේ අංක හෝ ඔබ විසින් PayPal ගිණුම හා PayPal සේවා වෙත ප්‍රවේශ වීමට ඔබ භාවිතා කරන වෙනත් කවර හෝ කේතයක් වෙත ප්‍රමාණවත් ආරක්ෂාවක් හා පාලනයක් සැපයීම ඔබේ වගකීම වේ.

PayPal ගිණුමක් විවෘත කර පවත්වාගෙන යාම සඳහා, ඔබ ඔබේ නිවැරදි රට/කලාපය දක්වා අප වෙත පුද්ගලික තොරතුරු, මූල්‍ය තොරතුරු, හෝ ඔබට හෝ ඔබේ ව්‍යාපාරවලට අදාළ වෙනත් තොරතුරු සහ ඒවාට පමණක් සීමා නොවූ තවත් තොරතුරු ද ඇතුළුව, නිවැරදි හා යථාවත් ගිණුම් තොරතුරු සැපයිය යුතුය.

ඔබ ඔබේ තැපැල් ලිපිනය, ඊමේල් ලිපිනය හා වෙනත් සබඳතා තොරතුරු ඔබේ PayPal ගිණුම් පැතිකඩ තුළ යථාවත්ව පවත්වා ගත යුතුය.

### පුද්ගලික ගිණුම්

ඔබට මූලිකව මිල දී ගැනීම් සිදු කිරීමට හා මිතුරන් හා පවුලේ අය වෙත ගෙවීම් යැවීමට උවමනා නම්, ඔබට පුද්ගලික ගිණුමක් ගැළපෙනවා ඇත. පුද්ගලික ගිණුමක් සමගින් ඔබට කළ හැකි දෑ:

- භාණ්ඩ හා සේවා මිල දී ගැනීම.
- මිතුරන් හා පවුලේ අයට මුදල් යැවීම හා මුදල් ඉල්ලුම් කිරීම.

භාණ්ඩ හා සේවා අලෙවි කිරීම සඳහා ගෙවීම් ලබා ගැනීමට ද ඔබට පුද්ගලික ගිණුමක් භාවිතා කළ හැකි නමුත්, ඔබ ඔබේ PayPal ගිණුම මූලිකව භාවිතා කිරීමට අදහස් කරන්නේ යම් යම් දෑ විකිණීමට නම්, ඔබ විසින් ව්‍යාපාර ගිණුමක් විවෘත කිරීම පිළිබඳ සලකා බැලිය යුතුය. තත්ත්වන් වෙනස් වුවහොත්, ඔබට ඔබේ PayPal ගිණුම පුද්ගලික ගිණුමකින් ව්‍යාපාර ගිණුමකට පරිවර්තනය කළ හැක.

**ව්‍යාපාර ගිණුම්**

මූලිකව භාණ්ඩ හෝ සේවා විකිණීමට PayPal භාවිතා කරන පුද්ගලයින් හා සංවිධාන සඳහා, ඔබේ ව්‍යාපාරය සංස්ථාපිත එකක් නොවුව ද ව්‍යාපාර ගිණුම් භාවිතා කිරීම අපි නිර්දේශ කරමු. ව්‍යාපාර ගිණුමක් සමගින් ඔබට කළ හැකි දෑ:

- ඔබේ PayPal ගිණුමෙහි නම ලෙස ව්‍යාපාර හෝ සමාගම් නමක් භාවිතා කිරීම.
- ඔබේ PayPal ගිණුමේ ඇතැම් විශේෂාංග වෙත සේවකයින්ට ප්‍රවේශ වීමට ඉඩ ලබා දීම.
- ඔබේ ව්‍යාපාර අවශ්‍යතා සපුරාලන PayPal නිෂ්පාදන සඳහා ලියාපදිංචි වන්න.

ව්‍යාපාර ගිණුම් පුද්ගලික ගිණුම්වවලට අදාළ වන ගාස්තුවලින් වෙනස් වන ගාස්තුවලට යටත් විය හැක.

**ව්‍යාපාර ගිණුමක් විවෘත කිරීමෙන් හෝ පුද්ගලික ගිණුමක් ව්‍යාපාර ගිණුමකට හැරවීමෙන්, ඔබ එය මූලිකව ව්‍යාපාර හෝ වාණිජමය අරමුණක් සඳහා භාවිතා කරන බව අපට සහතික කරයි. ගිණුම ඇරඹීමේ දී, ඔබ යම් යම් නව නිෂ්පාදන ඉල්ලුම් කරන විට සහ ඔබේ ව්‍යාපාර ගිණුමෙහි ඉහළ අවදානම් මට්ටමක් ඇති බවට අප විසින් සාධාරණව විශ්වාස කරන ඕනෑම අවස්ථාවක ණය වාර්තාකරණ නියෝජ්‍යායතනයකින් ඔබේ පුද්ගලික හා/හෝ ව්‍යාපාර ණය වාර්තාවක් PayPal මගින් ලබා ගැනීමට ද ඔබ එකඟ වෙයි.**

**වාණිජ්‍ය අස්ථිත්ව ගිවිසුම**

ඔබේ ඕනෑම PayPal ගිණුමක ක්‍රියාකාරීත්වය යම් යම් සීමාවන්වලට ළඟා වන්නේ නම් හෝ එය යම් යම් ව්‍යාපාර අංශ හෝ ක්‍රියාකාරීත්වයන්ට සම්බන්ධ වන්නේ නම්, ඔබට අඛණ්ඩව Visa හා MasterCard පිළිගැනීමට ඉඩ සලසා දීම සඳහා ඔබ විසින් වාණිජ්‍ය අස්ථිත්ව ගිවිසුමකට එකඟ වීම කාඩ්පත් ජාලය මගින් නියම කරයි. මේ කරුණ සම්බන්ධයෙන්, මෙකී [වාණිජ්‍ය අස්ථිත්ව ගිවිසුම්] PayPal මගින් ඔබ වෙනුවෙන් සිදු කරන ලද ඕනෑම ගෙවීමකට අදාළ වන අතර මෙම පරිශීලක ගිවිසුමේ කොටසක් බවට පත්වනු ඇත.

**තෙවැනි පාර්ශ්වීය අවසර**

ඔබ ඔබේ PayPal ගිණුමේ ප්‍රතිලාභී හිමිකරු විය යුතු අතර ඔබ වෙනුවෙන් පමණක් ව්‍යාපාර සිදු කළ යුතුය.

ඔබ වෙනුවෙන් යම් යම් කටයුතු ඉටු කිරීම සඳහා ඔබ විසින් ප්‍රකාශිතව අවසර ලබා දීම, ඉවත් කිරීම හා කළමනාකරණය සිදු කළ හැකිය. ඇතැම් අවස්ථාවල දී, ඔබට මෙය ඔබ ඔබේ PayPal ගිණුමට ලොගින් වී ඇති විට සිදු කළ හැකි අතර – වෙනත් අවස්ථාවල දී, ඔබට සෘජුවම මෙය තෙවැනි පාර්ශ්වයක් සමග සිදු කළ හැකිය. ඔබ වෙනුවෙන් කටයුතු ඉටු කිරීම සඳහා ඔබ විසින් තෙවැනි පාර්ශ්වයකට අවසර ලබාදෙන්නේ නම්, අප මෙම තෙවැනි පාර්ශ්වය වෙත ඔබේ PayPal ගිණුම් පිළිබඳ යම් යම් තොරතුරු අනාවරණය කරනු ලැබිය හැකි බවට ඔබ පිළිගනී.

අදාළ නීති මගින් බලපත්‍ර ගැන්වූ තෙවැනි පාර්ශ්වීය සේවා සැපයුම්කරුවන්ට පහත දෑ සඳහා අවසර දීමට ඔබට හැකිය:

- ඔබ වෙනුවෙන් ඔබේ ගිණුම පිළිබඳ තොරතුරු වෙත ප්‍රවේශ වීම සඳහා ගිණුම් තොරතුරු සේවා සැපයීමට;
- කාඩ්පත් මූලික වූ ගනුදෙනුවක් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය යම් මුදලක් ඔබේ ගිණුමේ තිබේ දැයි යන්න තහවුරු කර ගැනීමට; හෝ
- ඔබ වෙනුවෙන් ඔබේ ගිණුම වෙතින් ගෙවීම් ආරම්භ කිරීමට ගෙවීම් ඇරඹීමේ සේවා සැපයීමට.

මෙම පරිශීලක ගිවිසුම යටතේ ඔබේ වගකීම් කිසිවකින් ඔබව මුදා නොහරින කවර හෝ ආකාරයකින් තෙවැනි පාර්ශ්වයකට ඔබේ PayPal ගිණුමට ප්‍රවේශ වීමට අවසර ලබා දීම. ඔබ විසින් තෙවැනි පාර්ශ්වයන්ට සිදු කිරීමට අවසර දෙන ක්‍රියා සඳහා ඔබ අපට වග කිව යුතු වේ. ඔබේ අනිවාර්ය නෛතික අයිතීන්වලට යටත්ව, ඔබ දෙන ලද අවසර සම්බන්ධයෙන් එකී තෙවැනි පාර්ශ්වයන්ගේ ක්‍රියා හෝ නොකර හැරීම්වලින් පැන නඟින කවර හෝ වගකීමකට ඔබ අපව වගකීමෙන් බැහැර කොට නිදහස් කරයි.

## ඔබේ PayPal ගිණුම වැසීම

ඔබට ඕනෑම මොහොතක පිරිවැයක් හෝ දඩයක් නොමැතිව ඔබේ ගිණුම වසා දමා අප සමග ඇති සම්බන්ධතාව අවසන් කළ හැකි නමුත්, ඔබේ PayPal ගිණුම වැසීමෙන් පසුව ද ඔබේ PayPal ගිණුම ආශ්‍රිත සියලු වගකීම්වලට ඔබ තව දුරටත් බැඳී සිටිනු ඇත. ඔබ ඔබේ PayPal ගිණුම වසා දමන විට, අපි සැලසුම් කළ හෝ අසම්පූර්ණ ගෙවීම් සියල්ල අවලංගු කරන්නෙමු. ඔබේ PayPal ගිණුම වසා දැමීමට පෙර කිනම් හෝ PayPal ශේෂයක් ආපසු ගැනීම හෝ මාරු කිරීම සිදු කළ යුතුය. PayPal ඩිජිටල් ත්‍යාග ඔස්සේ මිල දී ගෙන ඔබේ PayPal ගිණුමට ගෙවීමේ ක්‍රමයක් ලෙස සබැඳි කර ඇති ඩිජිටල් ත්‍යාග සහතික පත්/කාඩ්පත් ආපසු ගැනීමට හෝ මාරු කිරීමට ඔබට නොහැකිය. කෙසේ වුවත්, ඔබට ඔබේ PayPal ගිණුම නොමැතිව ද, මිල දී ගැනීම් සිදු කිරීම සඳහා ඔබ එම ත්‍යාග සහතික පත්/කාඩ්පත් මිල දී ගැනීමේ දී ඊමේල් ඔස්සේ ලැබුණු කේත තවදුරටත් භාවිතා කිරීමට ඔබට හැකිය.

පහත ඒවා ඇතුළත් යම් යම් තත්ත්වයන් යටතේ, ඔබට ඔබේ PayPal ගිණුම වැසිය නොහැක:

- පරීක්ෂණයක් මග හැරීමට.
- ඔබට ගෙවිය යුතු ගනුදෙනුවක් හෝ විවෘත මතභේදයක් හෝ හිමිකම් පෑමක් තිබේ නම්.
- ඔබේ PayPal ගිණුමෙහි ඍණ ශේෂයක් තිබේ නම්.
- ඔබේ PayPal ගිණුම රඳවුමකට, සීමා කිරීමකට හෝ වෙන් කිරීමකට යටත් නම්.

## ගෙවීමේ ක්‍රමයක් සබැඳි හෝ සබැඳිහරණය කිරීම

ඔබට ඔබේ PayPal ගිණුමට ගෙවීමේ ක්‍රමයක් ලෙස ණයපතක්, හර පතක් හෝ බැංකු ගිණුමක් සබැඳි කිරීමට හෝ සබැඳිහරණය කිරීමට හැකිය. කරුණාකර ඔබේ ගෙවීමේ ක්‍රම තොරතුරු යථාවත්ව පවත්වා ගන්න (එනම්, ණයපත් අංකය හා කල් ඉකුත් වන දිනය). මෙම තොරතුරු වෙනස් වුවහොත්, අපට ලද හැකි තොරතුරු හා තෙවැනි පාර්ශ්වීය මූලාශ්‍ර භාවිතයෙන් ඔබේ පාර්ශ්වයෙන් කවර පියවරක් හෝ නොගෙන අප විසින් ඒවා යාවත්කාලීන කරනු ලැබිය හැකිය. ඔබේ කාඩ්පත් තොරතුරු අප විසින් යාවත්කාලීන කරනවාට ඔබ අකමැතිනම්, ඔබට ඔබේ PayPal ගිණුම වෙතින් ඔබේ ගෙවීමේ ක්‍රමය ඉවත් කිරීමට හැකිය. අපි ඔබේ ගෙවීමේ ක්‍රමය

යාවත්කාලීන කළහොත්, අපි එම ගෙවීමේ ක්‍රමයට අදාළ කරන ලද කිනම් හෝ අභිමත සැකසුමක් වෙනස් නොකර තබන්නෙමු. කාඩ්පත වලංගු බවත් කාඩ්පතේ හිමිකරු ඔබ බවත් අපට සත්‍යාපනය කරගත හැකි වන ලෙස ඔබට ඔබේ කාඩ්පත තහවුරු කිරීමට තේරිය හැක.

## PayPal ශේෂයක් රඳවාගෙන සිටීම

ඔබ විසින් රඳවා ගන්නා කිනම් හෝ PayPal ශේෂයක් PayPal වෙත සුරක්ෂිත නොවූ හිමිකම් පෑමක් නියෝජනය කරයි. PayPal ඔබේ ශේෂය වෙනත් පරිශීලකයින්ගේ ශේෂය සමග ඒකාබද්ධ කර එම අරමුදල් ද්‍රවශීලී ආයෝජනයන්හි යොදවයි. මෙම සංචිත මුදල් PayPalහි සංස්ථානික අරමුදල්වලින් වෙන්ව පවත්වාගෙන යන අතර PayPal විසින් මෙම අරමුදල් එහි මෙහෙයුම් වියදම් හෝ කවර හෝ ආයතනික අරමුණක් සඳහා භාවිතා කරන්නේ හෝ බංකොලොත්භාවයකට පත් වීමක දී ස්වේච්ඡාවෙන් සිය ණයහිමියන්ට මෙම මුදල් ලද හැකි කරන්නේ හෝ නැත. ඔබේ ශේෂයේ ඇති මුදල් සඳහා ඔබට පොළියක් හෝ වෙනත් ආදායමක් නොලැබෙනු ඇත. මෙම ආයෝජනවලින් ලැබෙන පොළී හෝ වෙනත් ආදායම් PayPal සතු වන බවට ඔබ එකඟ වෙයි. ඔබේ අරමුදල්වලින් ලැබෙන කිනම් හෝ පොළියක් සඳහා වන කවර හෝ අයිතියක් PayPal වෙත පැවරීමට ඔබ එකඟ වෙයි.

## අරමුදල් එක් කිරීම හෝ ආපසු ගැනීම

### ඔබේ ශේෂයට අරමුදල් එක් කිරීම

ඔබට ඔබේ PayPal ගිණුමට සබැඳි කර ඇති ගෙවුම් ක්‍රම ඔබ ඔබේ PayPal ගිණුම භාවිතයෙන් සිදු කරන ගනුදෙනුවලට මුදල් සැපයීම සඳහා භාවිතා කළ හැක. යමක් මිල දී ගැනීමට හෝ ගෙවීම් යැවීමට ඔබට PayPal ශේෂයක් අවශ්‍ය නොවේ. ඔබේ PayPal ගිණුම වෙත විද්‍යුත් මුදල් හුවමාරුවක් ඉල්ලුම් කිරීමෙන් ඔබට ඔබේ PayPal ගිණුමට සබැඳි කර ඇති බැංකු ගිණුම වෙතින් ඔබේ PayPal ගිණුම වෙත අරමුදල් එක් කළ හැක. මාරු කරන ලද මුදල ඔබේ PayPal ගිණුමෙහි ශේෂයක් ලෙස රඳවා ගැනෙනු ඇත. ඔබේ PayPal ශේෂය වෙත අරමුදල් එක් කිරීම සඳහා ණයපත් භාවිතා කළ නොහැක.

### ඔබේ ශේෂයෙන් අරමුදල් ආපසු ගැනීම

ඔබ සතුව PayPal ශේෂයක් තිබේ නම්, පහත මුදල් ආපසු ගැනීමේ විකල්පවලින් ඔබේ රට/කලාපය තුළ ලද හැක්කේ මොනවාදැයි බැලීමට ඔබේ PayPal ගිණුමට ලොගින් වන්න:

- එය ඔබේ PayPal ගිණුමට සබැඳි කළ බැංකු ගිණුමකට මාරු කිරීම; හෝ
- ලද හැකි විට, එය ඔබේ ණයපතට හෝ හර පතට මාරු කිරීම; හෝ
- ලද හැකි විට, තැපැල් මාර්ගයෙන් භෞතික චෙක්පතක් ඉල්ලීම.

ඔබේ ගිණුම ලියාපදිංචි කර ඇති රට/කලාපය මත පදනම්ව තෙවැනි පාර්ශ්වීය සේවා සම්පාදකයකු ඔස්සේ ඔබට ඔබේ අරමුදල් ආපසු ගැනීමට හැකිය. ව්‍යවහාර මුදල් පරිවර්තනය පිළිබඳ තොරතුරු සඳහා කරුණාකර එබඳු තෙවැනි පාර්ශ්වයන්ගේ නියම බලන්න.

අපව හා අපේ පරිශීලකයන්ව පාඩුවලින් ආරක්ෂා කර ගැනීම සඳහා ඔබ විසින් මුදල් ආපසු ලබා ගැනීමට අවසර ලබා දී ඇති දැය තහවුරු කර ගැනීමට අපට අවශ්‍ය නම් හෝ ඔබේ PayPal ගිණුම වෙත වන වෙනත් ගෙවීම් ප්‍රතිවර්තනයකට යටත් කර ඇත්නම් (උදාහරණ ලෙස, නැවත අය කිරීමක්, බැංකු නැවත අය කිරීමක් හෝ මිල දී ගන්නකුගේ මතභේදයක් හේතුවෙන්) ඇතුළු යම්

යම් අවස්ථාවල දී අප විසින් මුදල් ආපසු ගැනීමක් ප්‍රමාද කරනු ලැබිය හැකිය. අපි ඔබේ PayPal ගිණුමට සීමාවක් පනවන්නේ නම්, ගෙවීමක් රැඳවුමකට යටත් වන්නේ නම්, හෝ PayPal ගිණුම වෙතින් මුදල් ආපසු ගැනීමක් සිදු වීමට තිබිය දී කිනම් හෝ මුදල් වර්ගයකින් ඔබේ ගිණුමෙහි හෝ ආශ්‍රිත ගිණුමක සෘණ ශේෂයක් පවතින්නේ නම්, ඔබට සීමාව හෝ රැඳවුම ඉවත් කළ විට හෝ සෘණ ශේෂය සම්පූර්ණයෙන් ගෙවා අවසන් කළ විට ඔබට මුදල් ආපසු ගැනීම නැවත ඇරඹීමට සිදු වේ.

අපට ඔබේ මුදල් ආපසු ගැනීම්වලට සීමා පැනවිය හැකි අතර ඔබට ඔබේ PayPal ගිණුම වෙත ලොගින් වීමෙන් කවර හෝ මුදල් ආපසු ගැනීමේ සීමාවක් බැලීමට හැකිය. පහත පියවර අනුගමනය කිරීම අපට ඔබගේ PayPal ගිණුම සත්‍යාපනය කිරීමට උපකාර වන අතර ඉන් අපට කිනම් හෝ මුදල් ආපසු ගැනීමේ සීමාවක් ඉවත් කිරීමට ඉඩ සලසයි:

- ඔබේ බැංකු ගිණුම තහවුරු කිරීම; සහ
- ඔබේ ණයපත් හෝ හර පත් තොරතුරු සම්බන්ධ කිරීම සහ තහවුරු කිරීම.

ඔබේ බැංකු ගිණුමට මාරු කිරීමට අප විසින් ගාස්තුවක් අය කරනු ලැබේ. ඔබේ හරපත ඔබේ PayPal ගිණුමෙන් මුදල් ලබා ගැනීමට යෝග්‍ය වන්නේ නම්, ඔබ ඔබේ PayPal ශේෂයෙන් අරමුදල් සම්ප්‍රේෂණය කළ කරන විට එය භාවිතා කිරීමට ශේෂය සම්ප්‍රේෂණය කිරීමට ගාස්තු (පුද්ගලික ගිණුම් සඳහා) පිටුව සහ ශේෂය සම්ප්‍රේෂණය කිරීමට ගාස්තු (ව්‍යාපාරික ගිණුම් සඳහා) පිටුව තුළ සොයාගත හැකිවනු ඇති එම මාරු කිරීම්වලට අදාළ ගාස්තුවලට යටත්ව විකල්පය ඔබ වෙත ලබා දෙනු ඇත. ඔබ එසේ මුදල් ආපසු ගැනීමක් ආරම්භ කරන සෑම විටම අදාළ ගාස්තුව කලින් ඔබට පෙන්වනු ඇත.

සාමාන්‍යයෙන්, අපට තහවුරු කළ PayPal ගිණුමක් තිබුණහොත් හැර, අපි තහවුරු කළ ලිපිනවලට පමණක් චෙක්පත් තැපැල් කරමු. අපි තැපැල් පෙට්ටි අංකවලට චෙක්පත් නොයවමු. මෙම නිර්ණායක නොසපුරන ලිපිනයකට චෙක්පත් යැවීමට ඔබට අවශ්‍ය නම්, පාරිභෝගික සේවා අංශය අමතා අප ඉල්ලා සිටින ලිපිනය තහවුරු කිරීමේ ලේඛන ලබා දිය යුතුය. නිකුත් කර දින 180 ක් ඇතුළත ඔබට චෙක්පතක් මුදල් කර ගැනීමට නොහැකි වුවහොත්, අප ඔබේ ශේෂයට (ගාස්තුව අඩු කර) අරමුදල් නැවත එවමු.

## මුදල් වර්ග වැඩි ගණනක් ඇති විට ඔබේ ශේෂය කළමනාකරණය කිරීම

### මුදල් වර්ග ගණනාවක් තිබීම

ඔබේ PayPal ශේෂය PayPal විසින් පිළිගන්නා ඕනෑම මුදල් වර්ගයකින් තිබිය හැකි අතර, මෙම ඕනෑම මුදල් වර්ග එකකට වැඩි ගණනකින් ඔබට ශේෂය තබා ගත හැක.

ඔබේ PayPal ගිණුමේ ශේෂයක් තිබේ නම්:

- ශේෂය වෙනත් විනිමය වර්ගයට හැරවීමට අපි ඔබට ඉඩ ලබාදිය හැකිය. ඔබ ඔබේ ගිණුමේ ඇති ශේෂය පරිවර්තනය කළොත්, PayPalහි ගනුදෙනු විනිමය අනුපාතය (අපගේ ව්‍යවහාර මුදල් පරිවර්ත්‍ය අනුපාතය ද ඇතුළුව) භාවිතා කරනු ඇත. අපගේ අභිමතිය පරිදි ඔබට පරිවර්තනය කළ හැකි ශේෂය ප්‍රමාණය හෝ කළ හැකි පරිවර්තන ගණන සම්බන්ධයෙන් සීමා පැනවිය හැක.
- ඔබේ ගිණුමේ ආරම්භක ශේෂය තිබූ ව්‍යවහාර මුදල් වර්ගයෙන් හෝ ඔබ ලියාපදිංචි රටේ/කලාපයේ PayPal විසින් පිළිගන්නා වෙනත් මුදල් වර්ගයකින් පමණක් ඔබට

ශේෂය ආපසු ලබා ගත හැක. වෙනත් මුදල් වර්ගයකින් ඇති ශේෂයක් ආපසු ලබා ගැනීමට ඔබ විසින් මුදල් වර්ගය ඔබේ ගිණුමේ ආරම්භක මුදල් වර්ගයට පරිවර්තනය කළ යුතු අතර, එසේ නොකළහොත් එය ආපසු ලබා ගන්නා විට පරිවර්තනය කරනු ඇත. අපේ වාවහාර මුදල් පරිවර්තා අනුපාතය ඇතුළුව, PayPalහි වාවහාර මුදල් පරිවර්තා අනුපාතය භාවිතා කෙරෙනු ඇත.

ඔබේ ගිණුමෙන් දැනට ලබා ගැනීමට වින්‍යාස කර නොමැති මුදල් වර්ගයකින් අරමුදල් ලබා ගැනීමට PayPal ගිණුමේ එම මුදල් වර්ගයෙන් ශේෂයක් ඇති කිරීමට හෝ ශේෂය වෙනත් මුදල් වර්ගයකට හැරවීමට සිදු විය හැක. සමහර මුදල් වර්ග ලබා ගත හැක්කේ PayPal විසින් ඔබට තබා ගැනීමට ඉඩදී ඇති මුදල් වර්ගයකට ශේෂය හැරවීමෙන් පමණි. ශේෂය පරිවර්තනය කළහොත්, PayPalහි ගනුදෙනු විනිමය අනුපාතය (අපගේ වාවහාර මුදල් පරිවර්තන අනුපාතය ඇතුළුව) භාවිතා කෙරෙනු ඇත.

ඔබගේ PayPal ගිණුමේ මුදල් වර්ග ගණනාවක් පවත්වා ගැනීමේ ඇති අවදානම් සියල්ල සඳහා ඔබ වගකිව යුතු වෙයි. සමපේක්ෂණ වෙළඳාම් කිරීමේ අරමුණු, පරිවර්තන පරස්පර, පරිවර්තන විකල්ප හෝ PayPal විසින් වාවහාර මුදල් පරිවර්තන මත මුදල් ඉපයීමේ අරමුණ සඳහා බවට නිගමනය කරන වෙනත් කිසිම ක්‍රියාවක් සඳහා මුදල් කළමනාකරණය හෝ පරිවර්තනය කිරීම ඔබ විසින් නොකළ යුතුය. මෙම ප්‍රතිපත්තිය කඩ කරන බවට අප විසින් තීරණය කරන ඕනෑම ගනුදෙනුවක් නැවැත්වීම, අවලංගු කිරීම හෝ ආපසු හැරවීම PayPal විසින් කළ හැක.

**අපි මුදල් පරිවර්තනය කරන ආකාරය**

PayPal විසින් වාවහාර මුදල් පරිවර්තනය කළහොත්, එය අදාළ වාවහාර මුදල් පරිවර්තනය සඳහා අප විසින් සකස් කර ගෙන ඇති ගනුදෙනු විනිමය අනුපාතය අනුව සම්පූර්ණ කෙරෙනු ඇත. ගනුදෙනු විනිමය අනුපාතය නිතිපතා සකසා ඇති අතර ඔබේ පරිවර්තනයට අදාළ අනුපාතය සැකසීම සඳහා මූලික විනිමය අනුපාතයක් මත අප විසින් අයදුම් කරන ලද සහ රඳවා ගන්නා වාවහාර මුදල් පරිවර්තා අනුපාතයක් ඇතුළත් වේ. මූලික විනිමය අනුපාතය පදනම් වන්නේ පරිවර්තන දිනයේ හෝ පෙර වැඩ කරන දිනයේ තොග මුදල් වෙළඳපොළ තුළ ඇති අනුපාත මත ය; නැතහොත්, නීතියෙන් හෝ රෙගුලාසියකින් අවශ්‍ය කෙරෙන්නේ නම්, අදාළ රජයේ යොමු අනුපාත(ය) අනුව නියම කෙරේ.

ඔබගේ PayPal ගිණුම්වල යම් යම් භාවිතයන් සඳහා, වාවහාර මුදල් පරිවර්තනය අත්‍යාවශ්‍ය බව PayPal විසින් තීරණය කරනු ඇත. අදාළ වන වාහාර මුදල් පරිවර්තනය වාවහාර මුදල් පරිවර්තා අනුපාතය යන ශීර්ෂය යටතේ ඇති අපගේ ගාස්තු පිටුවෙන් දැන ගත හැකිය.

**වාවහාර මුදල් පරිවර්තන තෝරා ගැනීම්**

ඔබගේ ගෙවීම සඳහා මුදල් ලබා දෙනුයේ හරපතකින් හෝ ණයපතකින් නම් සහ ඒ සඳහා PayPal විසින් සිදු කරනු ලබන වාවහාර මුදල් පරිවර්තනයක් සම්බන්ධ වේ නම්, ඔබගේ ණයපත් හෝ හරපත් නිකුත් කරන්නා වෙනුවට අප විසින් කරනු ලබන වාවහාර මුදල් පරිවර්තනයක් සිදු කිරීම සඳහා ඔබ විසින් එකඟතාවය සහ අනුමැතිය ලබා දේ. එම කාඩ්පත් නිකුත් කරන්නා සහ ජාලය සඳහා යෝග්‍ය වේ නම්, ඔබට වාවහාර මුදල් පරිවර්තනය ඔබගේ කාඩ්පත් නිකුත් කරන්නා ලවා ඉටු කරවා ගැනීමේ අයිතිය තිබිය හැකි ය. මෙම අභිරුචි වාහාර මුදල තෝරා ගැනීම ඔබ වෙත ආකාර කිහිපයකින් ඉදිරිපත් කළ හැකි අතර, ඔබේ කාඩ්පතේ වාවහාර මුදල් වර්ගය සැකසීම, ගනුදෙනුව සඳහා භාවිතා කෙරෙන මුදල් වර්ගය කුමක් ද, පරිවර්තනය සිදු කරනු ලබන්නේ PayPal විසින් ද නැතහොත් ඔබගේ කාඩ්පත් නිකුත් කරන්නා විසින් ද යන්න, හෝ

ගනුදෙනුව සඳහා භාවිතා කෙරෙනුයේ කුමන පරිවර්තා අනුපාතය ද යන්න තේරීම සහ තවත් කරුණු ඊට ඇතුලත් වේ. ඔබගේ කාඩ්පත් නිකුත් කරන්නා විසින් මුදල් පරිවර්තනය සිදු කරන්නේ නම්, ව්‍යවහාර මුදල් පරිවර්තා අනුපාතය සහ ඔවුන් අය කළ හැකි ගාස්තුව තීරණය කරනු ලබන්නේ ඔබගේ කාඩ්පත් නිකුත් කරන්නා විසිනි.

ඔබ විසින් ඔබගේ දැනට තිබෙන PayPal ශේෂය හෝ ඔබේ සම්බන්ධ කර ඇති බැංකු ගිණුම ගෙවීමේ ක්‍රමය ලෙසට භාවිතා කිරීමේදී PayPal විසින් හැමවිටම ගනුදෙනු සඳහා වන පරිවර්තනයන් සිදු කරනු ඇත.

### ගිණුම් ප්‍රකාශන

#### ගිණුම් ප්‍රකාශනය

ඔබේ PayPal ගිණුමේ ක්‍රියාකාරීත්වය පෙන්වන ගිණුම් ප්‍රකාශනයක් ලබා ගැනීමට ඔබට අයිතිය තිබේ. ඔබේ PayPal ගිණුම වෙතට ලොගින් වී ඔබට ඔබගේ PayPal ගිණුම් ප්‍රකාශනය දැක ගත හැකිය.

# PAYPAL පරිශීලක ගිවිසුම

## ගෙවීම් යැවීම සහ මිල දී ගැනීම

### හෝ පවුලේ සාමාජිකයෙකුට ගෙවීම් යැවීම හෝ ගෙවීම් ලබා ගැනීම

#### ගෙවීම් යැවීම

සමහර රටවල/කලාපවල, ඔබට ඔබගේ PayPal ගිණුමේ ගෙවීම් යවන්න විශේෂාංගය (සමහරවිට පුද්ගලික ගෙවීම් හෝ මිතුරු-මිතුරු ගෙවීම්/P2P ගෙවීම්) භාවිතා කරමින් මිතුරෙකුට හෝ පවුලේ සාමාජිකයෙකුට ඔබේ PayPal ගිණුම වෙතින් මුදල් යැවිය හැකිය.

ඔබ ජීවත් වන රටේ/කලාපයේ කුමන සේවා තිබේද යන්න බැලීමට අපගේ [පදිංචි රට/කලාපය අනුව තිබෙන සේවා] බලන්න, එසේ නැතහොත් ඔබගේ PayPal ගිණුමට ලොගින් වන්න.

ඔබ ඔවුන්ට අරමුදල් යවන අවස්ථාව වන විට PayPal ගිණුමක් නොමැති වුවත් ඔබට ඔබේ මිතුරෙකුට හෝ පවුලේ සාමාජිකයෙකුට ඔවුන්ගේ ඊමේල් ලිපිනය හෝ ජංගම දුරකථන අංකය භාවිතා කරමින්, PayPal භාවිතා කරන කිසියම් මුදල් වර්ගයක් මඟින් අරමුදල් යැවීමට හැකි අතර, කුමන ගෙවීමේ ක්‍රමය ඔබට භාවිතා කිරීමට අවශ්‍යදැයි ඔබට තේරිය හැකිය. ඔබ අරමුදල් යවන පුද්ගලයාට PayPal ගිණුමක් නොමැති නම්, ඔවුනට PayPal ගිණුමක් විවෘත කර එම මුදලට හිමිකම් පෑ ගත හැකිය. ඔවුන් එම මුදල් සඳහා හිමිකම් නොපෑවහොත්, එම මුදල් ඔබ වෙත නැවත ගෙවනු ලැබේ. මිතුරෙකුගෙන් හෝ පවුලේ සාමාජිකයෙකුගෙන් අරමුදල් ලැබීම [අරමුදල් ලබා ගැනීම] යටතේ විස්තර කර තිබේ.

අප විසින්, අපගේ අභිමතය පරිදි, මිලට ගැනීම් සඳහා යවන අරමුදල්ද ඇතුළුව, ඔබට යැවිය හැකි අරමුදලේ ප්‍රමාණය සම්බන්ධයෙන් සීමා පැනවීමට අපට හැකි වේ. ඔබේ PayPal ගිණුම වෙතට ලොගින් වීමෙන් ඔබට ඕනෑම යැවීමේ සීමාවක් දැකගත හැකිය. ආපසු මුදල් ලබා ගැනීම සඳහා

වන සීමාවන් ඉවත් කිරීම හා අදාළව අවශ්‍ය ඔබේ තොරතුරු තහවුරු කිරීමට සමාන පියවරවල්ම ඔබ සම්පූර්ණ කළහොත් අපට ඔබගේ මුදල් යැවීමේ සීමාවන් ඉහළ දැමීමට හැකි වනු ඇත.

ඔබ විසින් ඔබගේ මිතුරෙකුට හෝ පවුලේ සාමාජිකයෙකුට අරමුදල් යවන විට, මේ දේවල් තුනෙන් එකක් සිදු විය හැකිය: ඔවුන් විසින් අරමුදල් භාර ගැනීම, ප්‍රතික්ෂේප කිරීම හෝ හිමිකම්පෑමට නොහැකි වීම. ඔවුන් විසින් අරමුදල් ලබා ගැනීම ප්‍රතික්ෂේප කළහොත් හෝ මුදල් යැවූ දින සිට දින 30 ක් තුළ එම මුදල්වලට හිමිකම් නොපෑවහොත්, එම අරමුදල් (ඔබගේ අය කරන ලද ගාස්තුද ඇතුළුව) ඔබට ආපසු ගෙවනු ඇත:

- ඔබ විසින් ගෙවීමේ ක්‍රමය ලෙස ණයපතක්, හර පතක් හෝ PayPal ක්‍රෙඩිට් භාවිතා කර ඇත්නම්, ඔබ ගනුදෙනු සඳහා භාවිතා කළ මුල් ගෙවීම් ක්‍රමය, හෝ
- ගෙවීමේ ක්‍රමය ලෙස ඔබ ඔබේ PayPal ශේෂය හෝ ගෙවීමේ ක්‍රමය ලෙස බැංකු ගිණුමක් භාවිතා කර ඇත්නම් සහ අපට ඔබගේ බැංකු ගිණුමට ආපසු ගෙවීමට නොහැකි නම්, ඔබගේ PayPal ශේෂය.

**ගෙවීම් ලබා ගැනීම**

මිතුරෙකු හෝ පවුලේ සාමාජිකයෙකු ඔබට අරමුදල් එවන්නේ නම්, එම අරමුදල් ඔබගේ PayPal ශේෂයෙහි දිස් වනු ඇත. අරමුදල් ලබා ගැනීම සඳහා ඔබේ ගිණුම සකස් කර නොමැති මුදල් වර්ගයකින් මුදල් ලබා ගැනීමට, එම මුදල් වර්ගයෙන් ශේෂයක් නිර්මාණය කිරීමට හෝ අරමුදල් වෙනත් මුදල් වර්ගයකට පරිවර්තනය කිරීමට අවශ්‍ය විය හැකිය. සමහර මුදල් වර්ග ලබා ගත හැක්කේ PayPal විසින් ඔබට තබා ගැනීමට ඉඩදී ඇති මුදල් වර්ගයකට ශේෂය හැරවීමෙන් පමණි. ශේෂය පරිවර්තනය කළහොත්, PayPalහි ගනුදෙනු විනිමය අනුපාතය (අපගේ ව්‍යවහාර මුදල් පරිවර්තන අනුපාතය ඇතුළුව) භාවිතා කෙරෙනු ඇත.

## මිතුරන් සහ පවුලේ අය වෙත ගෙවීම් යැවීම සඳහා ගාස්තු

අරමුදල් යැවීමට අදාළ ගාස්තු අපගේ අරමුදල් යැවීම පිළිබඳ වගුවෙහි තිබෙන අතර, මිතුරෙකුට හෝ පවුලේ සාමාජිකයෙකුට අරමුදල් යැවීමට ආරම්භ කරන සෑම අවස්ථාවකම කල්තියා ඔබ වෙත හෙළිදරව් කරනු ඇත. ඔබ එක් මුදල් වර්ගයකින් අනෙක් මුදල් වර්ගයට ඔබගේ PayPal ශේෂය පරිවර්තනය කළහොත්, PayPalහි ගනුදෙනු විනිමය අනුපාතය (අපගේ ව්‍යවහාර මුදල් පරිවර්ත්‍ය අනුපාතය ඇතුළුව) භාවිතා වනු ඇත.

ඔබ තෙවන පාර්ශ්ව (PayPal නොවන) වෙබ් අඩවියක් හරහා හෝ තෙවන පාර්ශ්ව නිෂ්පාදනයක් හෝ සේවාවක් හරහා ඔබේ මිතුරෙකුට හෝ පවුලේ සාමාජිකයෙකුට අරමුදල් යවන්නේ නම්, එවිට ගාස්තුව ගෙවනු ලබන්නේ යවන්නා විසින්ද ලබන්නා විසින්ද යන්න තීරණය කරනු ඇත. ගෙවීම සිදු කිරීමට පෙර තෙවන පාර්ශ්වය විසින් මෙය ඔබට හෙළිදරව් කරනු ඇත.

# PayPal පිළිගනු ලබන අලෙවිකරුවෙකු වෙතින් යමක් මිලට ගැනීම හෝ ඔහු වෙත පරිත්‍යාගයක් කිරීම හෝ යමක් ආපසු යැවීම

**යමක් මිලට ගන්නේ හෝ පරිත්‍යාග කරන්නේ කෙසේද?**

ඔබට ඔබේ PayPal ශේෂයේ ඇති අරමුදල් භාවිතයෙන් හෝ ඔබේ PayPal ගිණුමට සම්බන්ධ කර ඇති ඕනෑම ගෙවීම් ක්‍රමයක් භාවිතයෙන් PayPal පිළිගන්නා විකුණුම්කරුවකු වෙතින් යමක් මිල

දී ගැනීමට හෝ ලබන්නා විසින් පිළිගන්නා සහ PayPal විසින් සහාය දක්වන ඕනෑම මුදල් වර්ගයකින් පරිත්‍යාගයක් කිරීමට පුළුවන. නිදසුන් ලෙස, මීට අයත් වන්නේ:

- ඔන්ලයින් සිල්ලර වෙළෙන්දෙකුගේ වෙබ් අඩවියෙන් යමක් මිලට ගැනීම සහ මුදල් ගෙවන අවස්ථාවේදී ඔබගේ ගෙවීමේ ක්‍රමය ලෙස PayPal තේරීම.
- භාණ්ඩ හෝ සේවා සඳහා අලෙවිකරු වෙත මුදල් යැවීම.
- අලෙවිකරුවෙකුගේ භෞතික සාප්පුවෙන් ඔබගේ PayPal ගිණුම භාවිතා කර යමක් මිලට ගැනීම.
- PayPal භාවිතයෙන් පරිත්‍යාග කිරීම.

ඔබ මිලදී ගන්නා අලෙවිකරු භාණ්ඩ හෝ සේවා අලෙවි කරන්නේ නම් සහ එම අලෙවිකරුට දැනට PayPal ගිණුමක් නොමැති නම්, ඔවුන්ට PayPal ගිණුමක් විවෘත කිරීමෙන් ඔබේ ගෙවීමට හිමිකම් පෑමට හැකිය. ඔවුන් දින 30ක් ඇතුළත PayPal ගිණුමක් විවෘත නොකළහොත් ඔබේ මිලට ගැනීම සඳහා ආපසු මුදල් ගෙවනු ඇත.

අවදානම කළමනාකරණය කිරීමට, ඔබ යමක් මිලට ගන්නා විට හෝ පරිත්‍යාගයක් කරන විට PayPal විසින් ගනුදෙනුවක් සඳහා ඇති ගෙවීම් ක්‍රම සීමා කළ හැකිය. ඊට අමතරව, ඇතැම් තෙවැනි පාර්ශ්වීය වෙබ් අඩවි හෝ යෙදුම් භාවිතයෙන් කරන ලද PayPal ගෙවීම් ඇතුළුව යම් යම් විකුණුම්කරුවන් හා ලබන්නන් සඳහා ගෙවීම් ක්‍රම සීමා විය හැකිය, නිදසුන් වන්නේ:

- වෙළඳ නාම සහිත ගුවන් සේවා සහ සමහර සංචාරක වෙළෙන්දන් වැනි සමහර වෙළෙන්දන්ට ගෙවීමේ කිරීමට American Express භාවිතා කිරීමට නොහැක;
- සූදු කර්මාන්තයේ සිටින අය වැනි සමහර වෙළන්දන්ට ගෙවීමේ කිරීමට සමහර ණයපත් භාවිතා කළ නොහැකිවිය හැකිය; සහ
- සමහර පුද්ගලික ගෙවීම් කිරීමට හෝ ඔබේ PayPal ශේෂය ඉහළ දැමීමට ණයපත් භාවිතා කළ නොහැකිවනු ඇත

PayPal පිළිගන්නා අලෙවිකරුවකුට ඔබ ගෙවීමබට අවසර දෙන විට ගනුදෙනුව සම්පූර්ණ කිරීමට සමහර අලෙවිකරුවන් දින 30 ක් දක්වා කල් ගත හැක. මෙවැනි අවස්ථාවලදී, ඔබේ ගෙවීම ඔබේ PayPal ගිණුමේ අවසන් නොවූ ඇනවුමක් ලෙස පෙන්වනු ඇත. එවැනි අවස්ථාවක, ඔබ විසින් ගෙවීමට බලය ලබාදීම අලෙවිකරු විසින් ගනුදෙනුව සම්පූර්ණ කරන තෙක් වලංගුව පවතිනු ඇත (එහෙත් දින 30 ට වැඩි කාලයක් ගත නොහැක). ඔබ ගෙවීමේ ක්‍රමය ලෙස හරපතක් හෝ ණය පතක් භාවිතා කළා නම් ඔබගේ ණයපත නිකුත් කරන්නා රඳවා තබා ගැනීම ඉවත් කරන තෙක් හෝ ගනුදෙනුව සම්පූර්ණ කරන තෙක් බලාත්මක කිරීම තවමත් අවසන් කර නැති බවට පණිවුඩයක් පෙන්වනු ඇත.

ඔබේ ගෙවීමට අප විසින් ව්‍යවහාර මුදල් පරිවර්තනය කිරීමක් කළ යුතු නම් [මුදල් පරිවර්තනය කරන ආකාරය](#) කොටසේ විස්තර කර ඇති පරිදි විනිමය අනුපාතය තීරණය කර යොදාගනු ඇති අතර ගෙවීම සිදුවන අවස්ථාවේදී එය තීරණය කරනු ඇත.

**ගාස්තු**

ඔබ PayPal පිළිගන්නා අලෙවිකරුවකුගෙන් යමක් මිලට ගන්නා විට හෝ පරිත්‍යාගයක් කරන විට ඔබ PayPal වෙත ගාස්තුවක් ගෙවන්නේ නැත. PayPal විසින් ඔබේ මිල දී ගැනීම හෝ පරිත්‍යාගය සඳහා ව්‍යවහාර මුදල් පරිවර්තනයක් කළහොත් PayPal හි ගනුදෙනු විනිමය අනුපාතිකය (අපේ [ව්‍යවහාර මුදල් පරිවර්තන අනුපාතය](#)ද ඇතුළුව) භාවිත කෙරෙනු ඇත.

ඔබේ හර පත හෝ ණයපත නිකුත් කරන්නාද ගනුදෙනු සඳහා ඔබගෙන් වෙනම ගාස්තුවක් අය කළ හැක.

**ගෙවීම් සමාලෝචනය**

PayPal විසින් කිසියම් අවදානමක් ඇති ගනුදෙනුවක් හඳුනා ගැනීමේදී, එයට ඉදිරියට යාමට ඉඩදීමට පෙර අපි ගනුදෙනුව වඩා සමීපව නිරීක්ෂණය කරමු. මෙය සිදු කරන විට, PayPal විසින් ගනුදෙනුව අත්හිටුවන අතර අයිතමය නැව්ගත කිරීම ප්‍රමාද කරන ලෙස අලෙවිකරුහට දැනුම් දෙනු ඇත. ගැනුම්කරුවෙකු ලෙස, ඔබ විසින් මිලට ගත් අයිතමය ලැබීම මෙයින් ප්‍රමාද කෙරෙනු ඇත. අප විසින් ගනුදෙනුව නිම කළහොත්, අපි ඒ බව අලෙවිකරු වෙත දැනුම් දෙනු ඇති අතර, අයිතමය නැව්ගත කරන ලෙස පවසමු. අප විසින් ගනුදෙනුව නිම නොකළහොත්, අප විසින් වෙනත් නෛතිකව ක්‍රියාමාර්ගයක් ගැනීමට අවශ්‍ය නම් හැර, අපි එය අවලංගු කර අරමුදල් ආපසු ඔබ වෙත එවමු.

**ස්වයංක්‍රීය ගෙවීම්**

එම අලෙවිකරුගෙන් අනාගත මිලදී ගැනීම් සඳහා ගෙවීම් ක්‍රමය ලෙස PayPal භාවිතා කිරීමට PayPal භාර ගනු ලබන අලෙවිකරුවෙකු සමඟ එකඟ වීමට ඔබට හැකි වේ. මෙම ගිවිසුම ඔබ සහ අලෙවිකරු අතර ඇතිවන අතර ඔබේ අවසරය ඇතිව ඔබේ PayPal ගිණුමෙන් එකවරක්, නිතිපතා හෝ වරින් වර අරමුදල් ලබා ගැනීමට අලෙවිකරුට ඉඩ දෙයි. අලෙවිකරුවෙකු හෝ PayPal සමඟ ඔබ විසින් සූදානම් කර ගෙන ඇති ස්වංක්‍රීය ගෙවීම් සඳහා නිදසුන්වලට PayPal විසින් "බිල්පත්කරණ ගිවිසුම," "දායකත්වය," "නැවත සිදු කෙරෙන ගෙවීම," "සඳැහුම් ගනුදෙනුව," "පූර්ව බලය ලබාදුන් හර හෝ PAD," "පූර්ව බලය ලබා දුන් සංක්‍රමනය," හෝ "පූර්ව අනුමැතිය සහිත ගෙවීම," ලෙස හඳුන්වන ගෙවීම් ක්‍රම ඇතුළත් වේ.

ඔබට ඔබගේ ගිණුම් සැකසුම්වලින් හෝ PayPal උපකාර මධ්‍යස්ථානය ඔස්සේ අප අමතා ඊළඟ ගෙවීම සිදු කිරීමට නියමිත දිනට වැඩ කරන දින 3 ක්ද ක්වා කාලයක් තුළදී ඔබට ස්වයංක්‍රීය ගෙවීමක් අවලංගු කිරීමට හැකි වේ. ස්වයංක්‍රීය ගෙවීමක් අවලංගු කළ පසුව, එම අලෙවිකරු සමඟ ඔබේ ගිවිසුම යටතේ ඇති සියලු අනාගත ස්වයංක්‍රීය ගෙවීම් නතර කෙරෙනු ඇත. ඔබ විසින් ස්වයංක්‍රීය ගෙවීමක් අවලංගු කළහොත්, මිලට ගැනීම සඳහා අලෙවිකරුට ඔබට තවමත් ගෙවීම් සිදු කිරීමට බැඳීමක් හෝ ඔබට ලැබෙන නමුත් තවමත් ගෙවීම් සිදු කර නොමැති භාණ්ඩ සහ සේවා කිසිවක් සඳහා වන වෙනත් අමතර බැඳීමක් ඔබට තිබිය හැකි අතර ඒවා සඳහා විකල්ප ආකාරයකින් ඔබ විසින් අලෙවිකරුට ගෙවීම් සිදු කළ යුතුය.

ඔබ විසින්, අලෙවිකරුවෙකුට හෝ PayPal වෙත පූර්ව බලය දීමක් සිදු කර ඇත්නම්, එමගින් අලෙවිකරුට ඔබේ PayPal ගිණුමෙන් නිත්‍ය පදනමකින් නිතර සිදු කෙරෙන මුදල් ලබා ගැනීමට අවසර (නිදසුනක් ලෙස, සෑම මාසයකදීම හෝ එසේ නැතහොත් නිත්‍ය බිල්කිරීම් චක්‍රයකදී) ලැබෙන අතර, එම ගෙවීම්වල ප්‍රමාණය එකිනෙකට වෙනස්වන්නේ නම්, සම්ප්‍රේෂණයේ මුදල සහ දිනය සම්ප්‍රේෂණය සිදු කෙරෙන දිනට අඩු වශයෙන් දින 10 කට පෙර අලෙවිකරු වෙතින් පූර්ව නිවේදනයක් ලබා ගැනීමේ අයිතිය ඔබට ලැබේ. අලෙවිකරු විසින් මෙම විකල්පය ඔබ වෙත ලබාදෙන්නේ නම්, ඔබ සහ අලෙවිකරු අතර ස්ථාපිත කර ඇති පරාසයෙන් පිටතට වැටෙන ඔබගේ ස්වයංක්‍රීය ගෙවීම සඳහා පමණක් මෙම පූර්ව නිවේදනය ලබා ගැනීම තෝරා ගැනීමට ඔබට පුළුවන.

ඔබ විසින් ස්වයංක්‍රීය ගෙවීමකට අවසරය දී ඇත්නම් සහ PayPal විසින් ස්වයංක්‍රීය ගෙවීම් ගනුදෙනුවක් සඳහා ව්‍යවහාර මුදල් පරිවර්තනයක් සිදු කරන්නේ නම්, ස්වයංක්‍රීය ගෙවීම්

ගනුදෙනුව සිදු කෙරෙන අවස්ථාවේ බලාත්මකව පැවති ගනුදෙනු විනිමය අනුපාතය (PayPalහි [ව්‍යවහාර මුදල් පරිවර්තන අනුපාතය]() ඇතුළුව) PayPal විසින් භාවිතා කරනු ඇත.

**ආපසු ගෙවන්න**

PayPal භාවිතා කරමින් ඔබ අලෙවිකරුවෙකු වෙතින් කිසියම් දෙයක් ඔන්ලයින් ලෙස මිලට ගන්නා විට සහ ගනුදෙනුව සඳහා අවසානයේදී නැවත මුදල් ලබා දීම සිදු කර ඇත්නම්, ඔබ ණයපතක්, හර පතක් හෝ PayPal ශේෂය භාවිතා කලේ නම්, ඔබ ගනුදෙනුව සිදු කිරීම සඳහා භාවිතා කළ මුල් ක්‍රමය වෙත සාමාන්‍යයෙන් ගෙවීම ආපසු යැවෙනු ඇත. ගනුදෙනුව සඳහා වන ගෙවීමේ ක්‍රමය ලෙස ඔබ බැංකු ගිණුමක් භාවිතා කර ඇත්නම්, අප විසින් ඔබගේ බැංකු ගිණුම වෙත නැවත මුදල් ලබා දීම සිදු කරනු ඇති අතර, එම මුදල ඔබගේ බැංකු ගිණුම වෙත ආපසු ගෙවිය නොහැකි නම් ඔබගේ PayPal ශේෂය වෙත ගෙවසු ලැබේ. ඔබගේ PayPal ගිණුම භාවිතා කරමින් ගෙවීම් සිදු කරන ලද අලෙවිකරුවෙකුගේ සාප්පුවකදී සිදු කරන ලද මිලදී ගැනීම් සඳහා, ගනුදෙනුව සඳහා වන නැවත මුදල් ලබා දී ඇත්නම්, ගෙවීම ඔබගේ PayPal ශේෂය වෙත ආපසු ගෙවනු ලැබේ.

ඔබේ ගනුදෙනුව සඳහා PayPal විසින් ව්‍යවහාර මුදල් පරිවර්තනයක් සිදු කර ඇත්නම් සහ නැවත මුදල් ලබා දීමක් නිකුත් කර ඇත්නම්:

- මුල් ගෙවීම සිදු කළ දින සිට දින 1 ක් තුළ, මුල් ගෙවීම සිදු කළ දින පැවති ගනුදෙනුවේ විනිමය අනුපාතය (අපගේ ව්‍යවහාර මුදල් පරිවර්තන අනුපාතය ඇතුළුව) අදාළ වනු ඇත.
- මුල් ගෙවීම සිදු කළ දින සිට දින 1 කට පසුව, ආපසු ගෙවීම සිදු කරන දිනට අනුරූපී PayPal හි ගනුදෙනු විනිමය අනුපාතය (අපගේ ව්‍යවහාර මුදල් පරිවර්තන අනුපාතය ඇතුළුව) අදාළ වනු ඇත. ගනුදෙනු විනිමය අනුපාතය වහාම අදාළ වනු ඇති අතර ඔබට ඒ පිළිබඳව කිසිදු දැනුම්දීමක් සිදු නොකෙරෙනු ඇත. ඉහතින් දක්වන ලද ගාස්තු සහ ව්‍යවහාර මුදල් පරිවර්තන ගාස්තුවේ උච්චාවචනයන් හේතුවෙන් ඔබ විසින් මුල් ගෙවීමේදී සිදු කළ මුළු මුදලම ආපසු ඔබට නොලැබෙනු ඇත.

ආපසු ගෙවීම සිදු කරනුයේ ඔබ විසින් ගෙවනු ලැබූ මුදල් වර්ගයෙන් වේ, එසේ නැතහොත් ඔබ විසින් ගෙවනු ලැබූ මුදල්වලින් ආපසු ගෙවීමට අපට නොහැකි නම්, ඔබේ මූලික රඳවා ගැනීමේ මුදල් වර්ගයෙනි.

## මගේ ගනුදෙනුව සඳහා භාවිතා කරන ගෙවීම් ක්‍රමය

**වඩා කැමති ගෙවීම් ක්‍රමයක් තේරීම**

සමහර රටවල, ඔබේ PayPal ගිණුමේ ඇති ගෙවීම් ක්‍රමවලින් ඕනෑම ක්‍රමයක් ඔබ වඩාත් කැමති ගෙවීම් ක්‍රමය ලෙස ඔබට තෝරාගත හැකිය. ඔබේ ගිණුම් වරණයන් අතුරින් වඩාත් කැමති ගෙවීම් ක්‍රමයක් ඔබට තෝරා ගැනීමට පුළුවන. ඔබගේ කැමති ගෙවීමේ ක්‍රමය භාවිතා කළ නොහැකි අවස්ථා තිබිය හැකිය, උදාහරණයක් ලෙස, ඔබ කල් ඉකුත් වූ ණයපතක් තෝරා ගන්නේ නම්.

ඔන්ලයින් ගනුදෙනු, සාප්පු තුළ ගනුදෙනු සහ අලෙවිකරුවකු සමග ස්වයංක්‍රීය ගෙවීම් සඳහා වඩාත් කැමති ගෙවීම් ක්‍රම ඔබට වෙන වෙනම සැකසිය හැකිය.

ඔබ විසින් වඩා කැමති ගෙවීම් ක්‍රමයක් තෝරා ඇත්නම්, එය මූලික ගෙවීම් ක්‍රමය ලෙස පෙන්වනු ඇත.

නිශ්චිත අලෙවිකරුවකු හෝ ඔබ ගනුදෙනුව සම්පූර්ණ කිරීමට භාවිතා කරන තෙවන පාර්ශ්ව වෙබ් අඩවි අනුව සමහර ගෙවීම් ක්‍රමවල ලද හැකියාව සීමා විය හැකිය.

ඔබ විසින් වඩා කැමති ගෙවීම් ක්‍රමයක් තෝරා නැත්නම්, හෝ ඔබගේ වඩාත් කැමති ගෙවීම් ක්‍රමය නොමැති නම්, ඔබ විසින් නිතරම භාවිතා කළ හෝ මෑතකදී භාවිතා කර ඇති ගෙවීම් ක්‍රමය ඇතුළුව, තිබෙන ගෙවීම් ක්‍රම, ගනුදෙනුව සිදු කෙරෙන අවස්ථාවේදී, අපි ඔබට පෙන්වමු. ඔබට තිබෙන සියලු ගෙවීම් ක්‍රම බැලීමට, හෝ අලුත් එකක් එකතු කිරීමට, සහ ගනුදෙනුව අතරතුර ගෙවීම් ක්‍රමයක් තේරීමට, ඔබට "කළමනාකරණය කරන්න" සබැඳිය ක්ලික් කිරීමට ද පුළුවන.

**උපස්ථ ගෙවීම් ක්‍රමය**

ඔබ විසින් තෝරන ලද ගෙවීම් ක්‍රමය හෝ වඩා කැමති ගෙවීම් ක්‍රමය නොමැති නම්, සමහර එකවර සිදු කරන ඔන්ලයින් ගෙවීම් සඳහා උපස්ථ ගෙවීම් ක්‍රමයක් භාවිතා කිරීමට අවශ්‍ය විය හැකිය. එවැනි අවස්ථාවලදී, ඔබ ගනුදෙනුව සම්පූර්ණ කිරීමට පෙර, ඔබට ඔබේ ගනුදෙනු සමාලෝචන පිටුවේ, උපස්ථ ගෙවීම් ක්‍රමය පෙන්වනු ඇත. මෙය අදාළ වනුයේ එක් වර සිදු කරන, ඔන්ලයින් ගනුදෙනු සඳහා පමණක් වන අතර ස්වයංක්‍රීය ගෙවීම් සඳහා නොවන බව සිහි තබා ගන්න. උපස්ථ ගෙවීමේ ක්‍රමයක්ද අවශ්‍ය ගනුදෙනුවක් සඳහා ව්‍යවහාර මුදල් පරිවර්තනයක් අවශ්‍ය බවට PayPal තීරණය කළහොත්, ඔබේ උපස්ථ ගෙවීමේ ක්‍රමය සම්බන්ධයෙන් වන ව්‍යවහාර මුදල් පරිවර්තනය සිදු කරන්නේ PayPal ද කාඩ්පත් නිකුත් කරන්නාද යන්න ඔබට වෙන වෙනම තේරීමට නොහැකි වනු ඇත.

**මිතුරන් සහ පවුලේ අය වෙත ගෙවීම් යැවීම**

ඔබේ PayPal ශේෂය (තිබේ නම්) හෝ ඔබේ බැංකු ගිණුම භාවිතා කරමින් ඔබ විසින් මිතුරන් සහ පවුලේ අය වෙත ගෙවීම් යවන විට, අප විසින් සියලු ගාස්තු අතහැර දමනු ලබන හෙයින්, ඔබට ඔබගේ ඔන්ලයින් මිලට ගැනීම් සඳහා වන වඩා කැමති ගෙවීම් ක්‍රමයක් සකසා තිබුණේ වුවද, පළමුව අප විසින් මෙම ගෙවීම් විකල්පයන් හැමවිටම ඔබට පෙන්වමු. ගෙවීම් යැවීම පිටුවේ ඇති "වෙනස් කරන්න" සබැඳිය ක්ලික් කර ඔබේ PayPal ගිණුමේ ඇති ඕනෑම ගෙවීම් ක්‍රමයක් තේරීමට ඔබට හැමවිටම ඉඩ තිබෙන බව මතක තබා ගන්න. ඔබ ගාස්තුවක් සහිත ගෙවීම් ක්‍රමයක් තේරුවහොත්, ඔබ ගෙවීම යැවීමට පෙර අප විසින් හැමවිටම ඔබට ගාස්තුව පෙන්වමු.

**ස්වයංක්‍රීය ගෙවීම්**

සිය වෙබ් අඩවිය හරහා කිසියම් මිලට ගැනීමක් කරන විට සමහර අලෙවිකරුවන් ගෙවීම සඳහා වන ක්‍රමය ලෙස PayPal ගබඩා කිරීමට ඉඩ ලබාදෙන අතර එවිට ඔබට වඩා වේගයෙන් ගෙවිය හැකිය. බොහෝ විට, ඔබ මිලදී ගැනීමක් සිදු කරන සෑම අවස්ථාවකම අපට ඔබගේ PayPal ගිණුමෙන් ගාස්තු අය කර ගැනීමට ඔවුනට අලෙවිකරු විසින් ඉල්ලා සිටින පරිදි අලෙවිකරු සමඟ වන ගිවිසුමක් ඇති වීම සඳහා හේතු වේ.

ගිවිසුම ඇති කර ගන්නා අවස්ථාවේදී හෝ ඔබේ ගිණුම් සැකසුම්හිදී කිසියම් විශේෂිත අලෙවිකරුවෙකු සමඟ අනාගත මිලට ගැනීම් සඳහා ගෙවීම් ක්‍රමයක් තෝරා ගැනීමට ඔබට හැකිය. නිදසුනක් ලෙස, ඔබට ඔබේ මාසික චිත්‍රපටි දායකත්ව සේවාවට මාසික ගාස්තුව සඳහා ණයපතින් ගාස්තු අය කර ගැනීමට උපදෙස් දීමට පුළුවන.

ඔබ විසින් තෝරන ලද ගෙවීමේ ක්‍රමය (උදා. ණයපත කල් ඉකුත්ව ඇත්නම්) නොමැති නම්, අලෙවිකරුවකු සමඟ වන නිශ්චිත ගිවිසුමක් මඟින් ගෙවීම් ක්‍රමයක් තීරණය කිරීමේ හැකියාව ලබා නොදේ නම්, එසේ නැතහොත් අලෙවිකරුවකු සමඟ අනාගත ගනුදෙනු සඳහා ගෙවීම් ක්‍රමයක් නියම කර නොමැති නම්, යොදා ගනු ලැබෙන ගෙවීම් ක්‍රමය පහත අනුපිළිවෙලට සිදු කෙරෙනු ඇත: 1. ශේෂය; 2. බැංකු ගිණුම (ක්ෂණික සම්ප්‍රේෂණය); 3. PayPal සහ-සන්නාම හර පත; 4. PayPal සහ-සන්නාම ණයපත; 5. හර පත; 6. ණයපත; සහ 7. ඉ-චෙක්පත.

ඔබගේ ගිණුම් සැකසුම්හිදී ඔබට ඕනෑම ගිවිසුමක් අවලංගු කිරීමට ඔබට පුළුවන.

**බැංකු ගිණුම් සම්ප්‍රේෂණ**

ඔබ ගෙවීමේ ක්‍රමයක් ලෙස ඔබගේ බැංකු ගිණුම භාවිතා කළ විට, ඔබ ඔබගේ බැංකු ගිණුමෙන් ග්‍රාහකයා වෙත සම්ප්‍රේෂණයක් සිදු කිරීමට PayPal හට ඉඩ ලබා දේ. මෙම ගනුදෙනු සඳහා, ඔබ විසින් නියම කරනු ලබන මුදලක් ඔබේ බැංකු ගිණුමෙන් PayPal විසින් විද්‍යුත් ආකාරයට සම්ප්‍රේෂණය කරනු ඇත. කවර හෝ හේතුවක් නිසා මුල් මුදල් මාරු කිරීම ඔබේ බැංකුව මගින් ප්‍රතික්ෂේප කරනු ලැබුවහොත් නැවතත් මෙම මාරු කිරීම සිදු කිරීමට උත්සාහ කිරීමට ඔබ PayPal වෙත බලය පවරයි.

**ඉ-චෙක්පත**

ඉ-චෙක්පත යනු ඔබ ඔබේ බැංකු ගිණුම ඔබේ ගෙවීමේ ක්‍රමය ලෙස භාවිතා කරන ගෙවීමේ ක්‍රමයක් වන අතර බැංකුව මගින් ගනුදෙනුව සකස් කරන තුරු ලබන්නාට ගෙවීම නොලැබේ. මෙම ක්‍රියාවලිය සඳහා සාමාන්‍යයෙන් වැඩ කරන දින 3-5 දක්වා කාලයක් ගත වන නමුත්, ගෙවීම එවන්නේ ඔබේ රට/කලාපයෙන් පිටත ඇති බැංකු ගිණුමක් වෙතින් නම් මේ සඳහා ගත වන කාලය මීට වඩා වැඩි වනු ඇත.

ඔබේ අභිමත ගෙවීම් ක්‍රමය වන්නේ ඉ-චෙක්පත් නම්, ඔබ සතුව ශේෂයක් තිබෙන විට වුව ද, ඔබේ PayPal ගෙවීමට මුදල් සැපයීම සඳහා එම ක්‍රමය භාවිතා වනු ඇත.

## PayPalහි වඩා ගැනුම්කරු ආරක්ෂණ වැඩසටහන

### PayPal ගැණුම්කරු ආරක්ෂාව

PayPal පිළිගන්නා වෙළෙන්දකු වෙතින් ඔබ යමක් මිල දී ගන්නා විට, ඔබ PayPal ගැනුම්කරු ආරක්ෂාව වැඩසටහන යටතේ මුදල් ආපසු ගෙවීමකට සුදුසුකම් ලැබිය හැක. අදාළ වන විට, PayPal ගැනුම්කරු ආරක්ෂාව වැඩසටහන යටතේ ඔබට අයිතමයේ සම්පූර්ණ ගැනුම් මිල සහ තිබේනම්, ඔබ ගෙවන ලද මුල් ප්‍රවාහනගත කිරීම් පිරිවැය ප්‍රතිපූරණය කර ගැනීමට අවස්ථාව හිමි වේ. ඔබේ හිමිකම් පෑම ගැනුම්කරු ආරක්ෂාව වැඩසටහනට සුදුසුකම් ලබන්නේ ද යන්න PayPal සිය පූර්ණ අභිමතිය යටතේ තීරණය කරයි. PayPalහි මුල් තීරණය අවසානාත්මක ලෙස සැලකෙන නමුත්, මුල් තීරණය ගන්නා අවස්ථාවේ ලද නොහැකි වූ නව හෝ වැදගත් තොරතුරු ඔබ සතුව තිබේ නම් හෝ තීරණය ගැනීමේ ක්‍රියාවලිය තුළ වරදක් තිබූ බවට ඔබ විශ්වාස කරන්නේ නම් ඔබට එම තීරණය පිළිබඳ අභියාචනයක් PayPal සමග ගොනු කළ හැකිය.

**වැදගත්:** ඔබේ හිමිකම් පෑම නිරාකරණය කිරීමේ කොටසක් ලෙස විකිණුම්කරු හෝ අනෙක් පාර්ශ්වය වෙත අයිතමය ආපසු ලබා දීමට ඔබට සිදු විය හැක. PayPal ගැනුම්කරු ආරක්ෂාව

වැඩසටහන යටතේ ඔබ විසින් දරන ආපසු භාර දීමේ ප්‍රවාහනගත කිරීමේ ගාස්තු ප්‍රතිපූරණය කර ගැනීම සඳහා ඔබට අවස්ථාව නොලැබේ.

ගනුදෙනුවක් සම්බන්ධයෙන් මෙම විශේෂිත ගැටලුවලට ඔබ මුහුණ දෙන විට PayPal ගැනුම්කරු ආරක්ෂාව වැඩසටහන අදාළ විය හැක:

- ඔබට වෙළෙන්දකු වෙතින් ඔබේ අයිතමය නොලැබිණි, ("අයිතමය නොලැබිණි" හිමිකම් පෑමක් ලෙස හඳුන්වනු ලැබේ) නැතහොත්
- ඔබට අයිතමයක් ලැබුණු නමුත් එය ඔබ ඇණවුම් කළ එක නොවේ ("සැලකිය යුතු ලෙස විස්තර කළ පරිදි නොවන" හිමිකම් පෑමක් ලෙස හඳුන්වනු ලැබේ).

ඔබේ PayPal ගිණුම ඔස්සේ සිදු කරන ලද ගනුදෙනුව ඔබ විසින් බලය පැවරූ එකක් නොවන බවට ඔබ විශ්වාස කරන්නේ නම්, ඒ ආකාරයේ හිමිකම් පෑම් ගැනුම්කරු ආරක්ෂා කිරීමේ වැඩසටහනට අදාළ නොවන අතර එය අනවසර ගනුදෙනු සඳහා බැඳීම යටතේ එය විස්තර කරනු ලැබේ.

**අයිතමය නොලැබීමේ හිමිකම් පෑම්**

පහත අවස්ථාවල දී අයිතමය නොලැබීමේ හිමිකම් පෑමක් සඳහා PayPalහි ගැනුම්කරු ආරක්ෂාව වැඩසටහන යටතේ ඔබේ හිමිකම් පෑම සුදුසුකම් *නොලබනු ඇත*:

- ඔබ විසින් පුද්ගලිකව අයිතමය ලබා ගන්නා හෝ, ඔබ විකිණුම්කරුවාගේ අලෙවිසැලක දී PayPal භාවිතා කරන්නේ නම් ඇතුළුව ඔබ වෙනුවෙන් එය ලබා ගැනීමට සැලසුම් කරන්නේ නම් හෝ

- විකුණන්නා විසින් ප්‍රවාහනගත කිරීමේ සාක්ෂි හෝ භාරදුන් බවට සාක්ෂි සපයා ඇත.

විකිණුම්කරු විසින් භාණ්ඩ ඔබේ ලිපිනයට භාර දුන් බවට සාක්ෂි සපයන්නේ නම්, ඔබ භාණ්ඩ නොලැබුණු බවට ප්‍රකාශ කළ ද PayPal විසින් අයිතමය නොලැබීමේ හිමිකම් පෑමක් සඳහා අලෙවිකරු නිදොස් කරනු ලබයි.

**සැලකිය යුතු ලෙස විස්තර කළ පරිදි නොවන හිමිකම් පෑම්**

අයිතමයක් සැලකිය යුතු ලෙස විස්තර කළ පරිදි නොවන ලෙස සලකනු ලැබිය හැක්කේ:

- අයිතමය විකුණුම්කරු එය විස්තර කළ අන්දමට වඩා සැලකිය යුතු ලෙස වෙනස් වන්නේ නම්.
- ඔබට සම්පූර්ණයෙන්ම වෙනස් අයිතමයක් ලැබුණි නම්.
- අයිතමයේ තත්ත්වය වැරදි ලෙස අර්ථ කථනය කරන ලද්දේ නම්. උදාහරණ ලෙස "අලුත්" ලෙස විස්තර කරන ලද අයිතමයක් භාවිතා කරන ලද එකක් වීම.
- අයිතමය සත්‍ය එකක් ලෙස ප්‍රචාරණය කර තිබුණ ද එය සත්‍ය එකක් නොවීම (එනම්, එය ව්‍යාජ එකකි).
- අයිතමයේ ප්‍රධාන කොටස් හෝ විශේෂාංග නොමැති අතර ඔබ විසින් එය මිල දී ගන්නා විට අයිතමය පිළිබඳ විස්තරයෙන් ඒ කරුණු අනාවරණය නොවීම.
- ඔබ යම් අයිතම සංඛ්‍යාවක් මිල දී ගත් අතර ඒ සියල්ල නොලැබීම.
- නැව්ගත කිරීම අතර අයිතමයට සැලකිය යුතු ලෙස හානි සිදු වීම.

- අයිතමය ලැබුණු තත්ත්වයෙන් ප්‍රයෝජනයට ගත නොහැකි අතර ඒ බව කලින් අනාවරණය නොකිරීම.

අයිතමයක් සැලකිය යුතු ලෙස විස්තර කළ පරිදි නොවන ලෙස සලකනු නොලැබිය හැක්කේ:

- අයිතමය සැලකිය යුතු ලෙස විකිණුම්කරු විසින් ඒ පිළිබඳ සැපයූ විස්තරයට සමාන නම්.
- විකිණුම්කරු විසින් අයිතමයේ ඇති දෝෂය අයිතමය පිළිබඳ විස්තරයේ නිවැරදිව විස්තර කර ඇති නම්.
- අයිතමය නිවැරදි ලෙස විස්තර කර තිබුණ ද ඔබට එය ලැබුණු පසු ඔබට එය නුවුමනා වූයේ නම්.
- අයිතමය නිවැරදි ලෙස විස්තර කර තිබුණ ද එය ඔබේ අපේක්ෂාවන් සපුරාලීමට අසමත් වීම.
- අයිතමයේ සුළු සීරීම් ඇති අතර "පාවිච්චි කළ" ලෙස විස්තර කරන ලද එකක් වූයේ නම්.

**යෝග්‍ය නොවන අයිතම සහ ගනුදෙනු**

PayPalහි ගැනුම්කරු ආරක්ෂණ වැඩසටහන සඳහා පහත අයිතම හෝ ගනුදෙනු සුදුසුකම් ***නොලබයි***:

- නේවාසික දේපළ ඇතුළු, දේපළ වෙළඳාම්
- බයිසිකල් සහ රෝද සහිත හොවර්බෝඩ් වැනි විනෝදාත්මක කටයුතු සඳහා භාවිතා කරන පුද්ගලිකව අතේ ගෙන යා හැකි සැහැල්ලු වාහන හැරුණු විට, මෝටර් වාහන, යතුරු පැදි, විනෝදාත්මක වාහන, ගුවන් යානා සහ බෝට්ටු ඇතුළු එහෙත් ඒවාට සීමා නොවන වාහන
- ව්‍යාපාර (ඔබ ව්‍යාපාරයක් මිලට ගන්නා විට හෝ ආයෝජනය කරන විට)
- නිෂ්පාදන සඳහා භාවිතා කරන කාර්මික යන්ත්‍රෝපකරණ
- ත්‍යාග කාඩ්පත් සහ පෙරගෙවුම් කාඩ්පත් වැනි ගබඩා කළ අගය අයිතම ඇතුළුව මුදල්වලට සමාන ගෙවීම්
- රත්රන් සඳහා ගෙවීම් (භෞතික ස්වරූපයෙන් හෝ හුවමාරු වෙළඳ ස්වරූපයෙන්)
- මූල්‍ය නිෂ්පාදන හෝ ඕනෑම ආකාරයක ආයෝජන
- ඇතුල් වීමේ ගාස්තුවක් සහ ත්‍යාගයක් සමග සූදුව, සූදු කෙළීම සහ/හෝ වෙනත් ක්‍රියාකාරකම්
- සමූහ අරමුදල් සපයන වේදිකාවල ගෙවීම් මෙන්ම සමූහ රැස්වීම් වේදිකාවල ගෙවීම් ඇතුළු පරිත්‍යාග
- රජය විසින් පවත්වාගෙන යනු ලබන ආයතනයකට (රජයට හිමි ව්‍යවසායන් හැර), රාජ්‍ය නියෝජිතායනයකට හෝ රාජ්‍ය ආයතන හෝ රජයේ නියෝජිතායන වෙනුවෙන් ක්‍රියා කරන තෙවන පාර්ශවයකට ගෙවීම්
- ඕනෑම බිල්පත් ගෙවීමේ සේවාවක් සඳහා ගෙවීම්
- සම්පූර්ණයෙන් ම හෝ අර්ධ වශයෙන් අභිරුචිය අනුව සාදන ලද අයිතම සඳහා සැලකිය යුතු ලෙස විස්තර කර ඇති ආකාරයෙන් නොමැති බවට වන හිමිකම් පෑම්
- ඔබ පෞද්ගලිකව එකතු කරන හෝ ඔබ වෙනුවෙන් එකතු කිරීමට කටයුතු කරන භෞතික, ස්පර්ශ්‍ය අයිතම සඳහා වන නොලැබුණු අයිතම සඳහා හිමිකම්. PayPal හි භාණ්ඩ හා සේවා QR කේතය භාවිතා කරමින් ඔබ පෞද්ගලිකව ගොස් ගනුදෙනුව සඳහා මුදල් ගෙවා ඇත්නම් හැර, විකුණුම්කරුගේ අලෙවිසැලක මිල දී ගත් අයිතම මෙයට ඇතුළත් වේ
- PayPal හි පිළිගත හැකි භාවිත ප්‍රතිපත්තිය මගින් තහනම් කර ඇති ඕනෑම දෙයක්
- PayPal ගෙවා දැමීම් භාවිතයෙන් කරන ලද ගෙවීම් (කලින් බහු ගෙවීම)

- එය PayPal හි මිතුරන් සහ පවුල ක්‍රියාකාරීත්වය භාවිතයෙන් කරන ලද පුද්ගලික ගෙවීම්
- PayPal ගිණුම භාවිතා කර ඔබ නොකරන ලද ගෙවීම්
- තනි අයිතම ගනුදෙනු හෝ අයිතම කිහිපයක් අයත් වන ගනුදෙනු ඇතුළුව නැවත අලෙවි කිරීම සඳහා අදහස් කරන ලද අයිතම

### PayPal හි ගැනුම්කරු ආරක්ෂා කිරීමේ වැඩසටහන සඳහා ගනුදෙනු සුදුසුකම්

PayPal ගැනුම්කරු ආරක්ෂණය සඳහා යෝග්‍ය වීමට ඔබ පහත සියලු අවශ්‍යතා සපුරාලිය යුතු යි:

- යහපත් තත්ත්වයේ පවතින PayPal ගිණුමක් තිබීම.
- යෝග්‍ය අයිතමය සඳහා ඔබේ PayPal ගිණුමෙන් ගෙවිය යුතුයි.
- විසඳුම් මධ්‍යස්ථානය හරහා PayPal හි මිල දී ගැනුම් ආරක්ෂාව යටතේ හිමිකම් පෑමක් ගොනු කිරීමට පෙර ඔබේ ගැටලුව විසඳා ගැනීම සඳහා විකිණුම්කරු ඇමතීමට උත්සාහ කළ යුතුයි.
- PayPal හි ලියකියවිලි හා අනෙකුත් තොරතුරු සඳහා වන ඉල්ලුමට කලට වේලාවට ප්‍රතිචාර දැක්විය යුතුයි.
- ඔබ විසින් ගෙවීම යැවූ දින සිට දින 180 ක් ඇතුළත විසඳුම් මධ්‍යස්ථානය තුළ මතභේදයක් විවෘත කර අපගේ මාර්ගගත මතභේද නිරාකරණ ක්‍රියාවලිය අනුගමනය කළ යුතුය.
- ප්‍රතිසාධනයක් නොලැබී ඇති හෝ වෙනත් මූලාශ්‍රයක් වෙතින් ඔබේ මිල දී ගැනීමට අදාළව විකල්ප නිරාකරණයකට එකඟ වී තිබීම.

#### අපගේ මාර්ගගත මතභේද නිරාකරණ ක්‍රියාවලිය

ඔබට විකිණුම්කරුවකු සමග සෘජුව ගනුදෙනුවක් ආශ්‍රිත ගැටලුවක් නිරාකරණය කර ගැනීමට නොහැකි නම්, අපගේ ගැනුම්කරු ආරක්ෂා කිරීමේ වැඩසටහන යටතේ හිමිකම් පෑමක් ඉදිරිපත් කිරීම සඳහා ඔබ විසින් නිරාකරණ මධ්‍යස්ථානය ඔස්සේ අපගේ මාර්ගත ආරවුල් නිරාකරණ ක්‍රියාවලිය අනුගමනය කළ යුතුය. අප අමතා නියෝජිතයකු හා කතා කිරීම මගින් ද ඔබට හිමිකමක් ගොනු කිරීමට හැකිය (පහත 2 වැනි පියවර). ඔබ විසින් අනුගමනය කළ යුතු පියවර පහතින් විස්තර කර ඇති අතර ඔබ මෙම පියවර අනුගමනය නොකළහොත් ඔබේ හිමිකම් පෑම ප්‍රතික්ෂේප විය හැක:

**1 පියවර:** ඔබ ගෙවිම සිදු කළ දින සිට දින 180 ක් ඇතුළත **මතභේදයක් විවෘත කරන්න**. මෙමගින් ඔබට විකුණුම්කරු සමග ගනුදෙනුව සම්බන්ධයෙන් ඔබට ඇති ගැටලුව පිළිබඳ සෘජු සාකච්ඡාවක් ඇරඹීමට අවස්ථාව ලැබෙන අතර එය මතභේදය විසඳා ගැනීමට උපකාරී වනු ඇත. ඔබට සෘජුවම විකුණුම්කරු සමග මතභේදය නිරාකරණය කර ගැනීමට නොහැකි නම් 2 වැනි පියවර වෙත යන්න. මතභේදය නිරාකරණය කර ගන්නා හෝ අවසන් වන තුරු අපි විකුණුම්කරුගේ PayPal ගිණුමෙහි ගනුදෙනුවට අදාළ සියලු අරමුදල් රඳවා ගන්නෙමු.

**2 පියවර:** මතභේදය විවෘත කර දින 20 ක් ඇතුළත ප්‍රතිපූරණය කිරීම සඳහා **මතභේදය හිමිකම් පෑමකට උද්ගමනය කිරීම** හෝ ඔබ හා විකුණුම්කරු එකඟතාවකට ඒමට අපොහොසත් වේ නම්, අපි ස්වයංක්‍රීය මතභේදය වසන්නෙමු. ඔබට නිරාකරණ මධ්‍යස්ථානය ඔස්සේ ඔබට මතභේදය ප්‍රතිපූරණය කිරීම සඳහා හිමිකම් පෑමකට උද්ගමනය කළ හැකිය. මෙම අවස්ථාවේ දී විකිණුම්කරුට හෝ PayPal හට ද මතභේදය හිමිකම් පෑමකට උද්ගමනය කළ හැකිය. ඔබ අයිතමය නොලැබීමේ හිමිකම් පෑමක් ඉදිරිපත් කරන්නේ නම්, මතභේදය උද්ගමනය කිරීම සඳහා යටත් පිරිසෙයින් දින 7 ක් සිටින ලෙස PayPal ඔබෙන් ඉල්ලා සිටීමට ඉඩ ඇත.

**3 පියවර:** ඔබ, විකුණුම්කරු හෝ PayPal ඔබේ මතභේදය ප්‍රතිපූරණය සඳහා හිමිකම් පෑමකට උද්ගමනය කිරීමෙන් පසු **ලියකියවිලි හෝ වෙනත් තොරතුරු සඳහා PayPal වෙතින් ලැබෙන ඉල්ලුම්වලට ප්‍රතිචාර දක්වන්න.** PayPal විසින් ඔබට ලදුපත්, තෙවැනි පාර්ශ්වීය ඇගයීම්, පොලිස් වාර්තා හෝ PayPal විසින් දක්වන වෙනත් ලේඛන සපයන ලෙස ඉල්ලා සිටිය හැක. ඔබ සමග සිදු කරන අපගේ ලිපි හුවමාරුවේදී ඉල්ලන පරිදි ඔබ මෙම ඉල්ලීම් වලට කාලීන ආකාරයකින් ප්‍රතිචාර දැක්විය යුතුය.

**4 පියවර:** ඔබ විසින් සැලකිය යුතු ලෙස විස්තර කළ පරිදි නොවන හිමිකම් පෑමක් ගොනු කරන්නේ නම්, **PayPal හි ප්‍රවාහනගත කිරීමේ ඉල්ලුම්වලට නිසි කලට අනුකූලතාව දක්වන්න.** අයිතමය නැවත ඔබේ වියදමින් විකිණුම්කරු, PayPal හෝ තෙවැනි පාර්ශ්වයක් (PayPal විසින් නියම කරනු ලබන) වෙත ප්‍රවාහනගත කර භාරදුන් බවට සාක්ෂියක් ඉදිරිපත් කරන ලෙස PayPal ඔබට නියම කරනු ලැබිය හැක.

**භාරදුන් බවට සාක්ෂිය යන්නෙන් අදහස් වන්නේ:**

$750 USD ට (හෝ පහත වගුවේ දැක්වෙන සමාන ව්‍යවහාර මුදල් සීමාවට) වඩා අඩු ගනුදෙනු සඳහා, යටත් පිරිසෙයින් නගරය/ හෝ තැපැල් කේතය, භාර දුන් දිනය හා ඔබ භාවිතා කළ නැව් සමාගමේ අනන්‍යතාව පෙන්වන භාර දුන් ලිපිනය ඇතුළත් මාර්ගගතව බැලිය හැකි තහවුරු කිරීමක්.

$750 USD ට (හෝ පහත වගුවේ දැක්වෙන සමාන ව්‍යවහාර මුදල් සීමාවට) වඩා අඩු ගනුදෙනු සඳහා, ඔබ විසින් භාර දීමේ අත්සන් කළ තහවුරු කිරීමක් සැපයිය යුතු වේ (පහත රටවල ලියාපදිංචි කරන ලද PayPal ගිණුමක් සහිත ගැනුම්කරුවන් හැර: ඇල්බේනියාව, ඇන්ඩෝරා, බොස්නියා හා හර්සිගොවීනා, ක්‍රොඒෂියාව, අයිස්ලන්තය, ඊශ්‍රායලය හෝ යුක්රේනය යන එබඳු අවශ්‍යතා අදාළ නොවන රටවල්). ගනුදෙනුව සිදු වී ඇත්තේ වගුවේ දක්වා ඇති ව්‍යාවහාර මුදල් වර්ගයකින් නොවේ නම්, ගෙවීම ගනුදෙනුව සකස් කරන වේලාවේ අදාළ වන PayPal විනිමය අනුපාතයට අනුව $750 USD ට සමාන අගයක් ඉක්මවන්නේ නම් අත්සන මගින් තහවුරු කිරීම අවශ්‍ය වේ.

| **අත්සන තහවුරු කිරීමේ මුදල් සීමාවන්** | | | |
|---|---|---|---|
| ව්‍යවහාර මුදල | ගනුදෙනු අගය | ව්‍යවහාර මුදල | ගනුදෙනු අගය |
| ඕස්ට්‍රේලියානු ඩොලර්: | 850 AUD | නවසීලන්ත ඩොලර්: | 950 NZD |
| බ්‍රසීල රියාල්: | 1,750 BRL | නෝර්වීජියානු ක්‍රෝනා: | 4,600 NOK |
| කැනේඩියානු ඩොලරය: | 850 CAD | පිලිපීන පෙසෝ: | 34,000 PHP |
| චෙක් කොරුනා: | 15,000 CZK | පෝලන්ත ස්ලොටික්: | 2,300 PLN |
| ඩැනිෂ් ක්‍රෝන්: | 4,100 DKK | රුසියානු රුබල්: | 48,000 RUB |

| අත්සන තහවුරු කිරීමේ මුදල් සීමාවන් | | | |
|---|---|---|---|
| යූරෝ: | 550 EUR | සිංගප්පූරු ඩොලර්: | 950 SGD |
| හොං කොං ඩොලර්: | 6,000 HKD | ස්වීඩන් ක්‍රෝනා: | 4,950 SEK |
| හංගේරියානු ෆොරින්ත්: | 170,000 HUF | ස්විස් ෆ්‍රෑන්ක්: | 700 CHF |
| ඊශ්‍රායල් ෂේකෙල්: | 2,700 ILS | තායිවානයේ නව ඩොලරය: | 23,000 TWD |
| ජපන් යෙන්: | 77,000 JPY | තායි බාත්: | 24,500 THB |
| මැලේසියානු රිංගිට්: | 3,100 MYR | එක්සත් රාජධානි ස්ටර්ලිං: | 450 GBP |
| මෙක්සිකානු පෙසෝ: | 10,000 MXN | ඇමෙරිකානු ඩොලර්: | 750 USD |

**5 පියවර: PayPal විසින් ඉහත දක්වා ඇති ආවරණය වීමේ හා** සුදුසුකම් සැපිරීමේ අවශ්‍යතා, මාර්ගගත ආරවුල් නිරාකරණ ක්‍රියාවලිය අතරතුර සපයන ලද කවර හෝ අතිරේක තොරතුරක් හෝ අදාළ තත්ත්වය යටතේ අදාළ හා යෝග්‍ය ලෙස සලකන කවර හෝ වෙනත් තොරතුරක් මත පදනම්ව එහි පූර්ණ අභිමතියට අනුව PayPal විසින් අවසන් තීරණයක් (ස්වයංක්‍රීයව කිනම් හෝ මතභේදයක් හෝ හිමිකම් පෑමක් වැසීම ඇතුළුව) ගනු ලබයි.

ඔබ විසින් ඩිජිටල් භාණ්ඩ ක්ෂුද්‍ර ගෙවීම් මිල දී ගැනීම් සිදු කරන විට අදාළ වන විශේෂ රීති තිබෙන බවත් අපට අපගේ අභිමතිය අනුව ඔබ විසින් තවත් යමක් කිරීමට අවශ්‍ය නොවී ගනුදෙනුව ප්‍රතිවර්තනය කරනු ලැබිය හැකි පූර්ව නිර්ණිත සීමාවන් ඊට අදාළ වන බව සලකන්න. ඔබට ප්‍රතිලාභ සැලසෙන ස්වයංක්‍රීය ප්‍රතිවර්තන සංඛ්‍යාව අප විසින් සීමා කරනු ලැබිය හැකි නමුත්, එවන් අවස්ථාවක දී වුව, ඔබට තවදුරටත් ඉහතින් විස්තර කර ඇති PayPalහි සම්මත ආරවුල් විසඳීමේ ක්‍රියාවලීන් අනුගමනය කිරීමට හැකියාව තිබේ.

PayPal විසින් ගැනුම්කරු හෝ විකුණුම්කරුගේ සුභ සාධනය සඳහා අවසන් තීන්දුවක් ගනු ලැබූ විටක පාර්ශ්ව දෙකම PayPal හි තීරණයට අනුකූලතාව දැක්විය යුතුය.

PayPal ගැනුම්කරුවකුගේ සුභ සාධනය සඳහා තීරණයක් ගනු ලැබුවහොත්, PayPal විසින් අයිතමයේ මුළු ගැනුම් මිල හා මුල් ප්‍රවාහනගත කිරීමේ පිරිවැය ගැනුම්කරු වෙත ප්‍රතිපූරණය කරනු ඇත.

විකිණුම්කරුවකු හිමිකම් පෑමකින් පාඩු ලැබුවහොත් විකිණුම්කරුට ගනුදෙනුව ආශ්‍රිත PayPal ගාස්තු මත ආපසු ගෙවීමක් නොලැබෙනු ඇත.

විකුණූ භාණ්ඩය ව්‍යාජ එකක් වීමේ හේතුව මත විකිණුම්කරුවකු විසින් සැලකිය යුතු ලෙස විස්තර කරන පරිදි නොවන හිමිකම් පෑමකින් පාඩු ලැබුවහොත්, විකිණුම්කරු ගැනුම්කරු වෙත සම්පූර්ණ මුදල ආපසු ගෙවිය යුතු අතර අයිතමය නැවත නොලැබෙනු ඇත.

**අප හෝ ඔබේ කාඩ්පත නිකුත් කරන්නා සමග මතභේදය**

ඔබේ PayPal ගිණුම ඔස්සේ සිදු කරන ලද ගනුදෙනුවකට ගෙවීමේ ක්‍රමය ලෙස ඔබ විසින් ණයපතක් හෝ හර පතක් භාවිතා කරන ලද්දේ නම් හා ඔබ ගනුදෙනුව පිළිබඳ අතෘප්තියට පත් වී ඇති නම්, ඔබ ඔබේ කාඩ්පත නිකුත් කරන්නා සමග ගනුදෙනුව පිළිබඳ මතභේදයක් ගොනු කිරීමට සුදුසුකම් ලැබීමට ඉඩ ඇත. අදාළ වන කාඩ්පත් නැවත අය කිරීමේ අයිතිවාසිකම් PayPal හි ගැනුම්කරු ආරක්ෂා කිරීමේ වැඩසටහන යටතේ ඔබට ලද හැකි අයිතීන්වලට වඩා පුළුල් විය හැකිය. උදාහරණ ලෙස, ඔබ ඔබේ කාඩ්පත් නිකුත් කරන්නා සමග ගනුදෙනුවක් සඳහා මතභේදයක් ගොනු කරන්නේ නම්, ඔබ තෘප්තියකට පත් නොවන අයිතම සැලකිය යුතු ලෙස විස්තර කළ පරිදි නොවන හිමිකම් පෑමක් ඉදිරිපත් කිරීම සඳහා සුදුසුකම් නොලබන්නේ වුව ද ඔබට ඒවාට ගෙවන ලද මුදල් ආපසු අය කරවා ගැනීමට හැකිය.

PayPal සමග අපගේ ගැනුම්කරු ආරක්ෂා කිරීමේ වැඩසටහන යටතේ මතභේදයක් ගෙන යනවා ද, නැතහොත් ඔබේ කාඩ්පත නිකුත් කරන්නා සමග මතභේදයක් ගෙන යනවා ද යන්න ඔබ තිරණය කළ යුතුයි. ඔබට එකවර මේ දෙකම කිරීමට හෝ ද්විත්ව අය කරවා ගැනීමක් සිදු කළ නොහැකියි. ඔබ අප සමග මතභේදයක්/හිමිකම් පෑමක් ගෙන යන්නේ නම්, හා එම ගනුදෙනුව සඳහාම ඔබ ඔබේ කාඩ්පත නිකුත් කරන්නා සමග ද ආරවුලක් ගෙන යන්නේ නම් අපි ඔබ සමග ඇති මතභේදය/හිමිකම් පෑම වසා දමන්නෙමු. මෙය ඔබේ කාඩ්පත නිකුත් කරන්නා සමග ඇති මතභේද ක්‍රියාවලියට බලපෑම් නොකරනු ඇත. ඊට අමතරව, ඔබ ඔබේ කාඩ්පත නිකුත් කරන්නා සමග මතභේදයක් ගෙන යන්නේ නම්, ඔබට පසුව අප සමග මතභේදයක්/හිමිකම් පෑමක් ගෙන යා නොහැකිය.

ඔබ PayPal සමග ගනුදෙනුවක් සඳහා මතභේදයක් ඇති කර ගැනීමට තීරණය කරන්නේ නම් අපි ඒ සම්බන්ධයෙන් ඔබට විරුද්ධව තීරණයක් ගන්නේ නම්, ඔබට පසුව ඔබේ කාඩ්පත් නිකුත් කරන්නා සමග මතභේදය නැවත ගොනු කිරීමට අවස්ථාව තිබේ. PayPal විසින් ඔබේ මතභේදය සඳහා අවසන් තිරණයක් ගැනීම ඔබේ කාඩ්පත් නිකුත් කරන්නාගේ මතභේදයක් ගොනු කිරීම සඳහා වන අවසන් දිනය පසුවන තෙක් සිදු නොකරයි නම්, හා අපගේ පාර්ශ්වයෙන් වන ප්‍රමාද කිරීමක් හේතුවෙන් ඔබ කාඩ්පත නිකුත් කරන්නා වෙතින් අය කර ගැනීමට සුදුසුකම් ලබන මුළු මුදලට අඩු අගයක් අය කර ගැනීමට ඔබට සිදු වේ නම්, අපි ඔබට පාඩු වූ අගය (ඔබ දැනටමත් විකිණුම්කරු හෝ ඔබේ කාඩ්පත නිකුත් කරන්නා විසින් අය කරවාගෙන ඇති කවර හෝ මුදලක් කපා හැර) ප්‍රතිපූරණය කරන්නෙමු. ඔබේ කාඩ්පත් නිකුත් කරන්නා ඇමතීමට හෝ PayPal සමග මතභේදයක් ගොනු කිරීමට පෙර ඔබ විසින් විකිණුම්කරුගේ ආපසු භාර දීමේ ප්‍රතිපත්තිය අනුව ඔබේ ගැටලුව විසඳා ගැනිම සඳහා විකිණුම්කරු ඇමතීමට උත්සාහ කළ යුතුය.

# PAYPAL පරිශීලක ගිවිසුම

## ගෙවීම් විකිණීම සහ භාර ගැනීම

### ගෙවීම් භාර ගැනීම

#### ගෙවීම් ලබා ගැනීම

ගෙවීම් ලබා ගැනීමට ඇති හැකියාව රට/කලාපය අනුව වෙනස් වේ. ඔබගේ PayPal ගිණුමට ලොගින් වීමෙන් ඔබට ගෙවීම් ලබා ගැනීමේ හැකියාව ඇත්දැයි යන්න ඔබට තීරණය කළ හැකිය.

ඔබ භාණ්ඩ හා සේවා විකිණීමට හෝ පරිත්‍යාග පිළිගැනීමට ඔබේ PayPal ගිණුම භාවිත කරන්නේ නම් ඔබ විසින් කළ යුතු දෑ:

- අරමුදල් ලබා ගැනීම සඳහා අදාළ වන කවර හෝ ගාස්තුවක් ගෙවීම.
- මිල දී ගැනීමක් සඳහා ඔබට පුද්ගලික ගෙවීමක් එවන ලෙස ඔබගේ ගැනුම්කරුගෙන් ඉල්ලා නොසිටීම. ඔබ එසේ කළ හොත්, PayPal විසින් පවුලේ අය හා මිතුරන් වෙතින් ගෙවීම් ලබා ගැනීමට ඔබේ PayPal ගිණුමට ඇති හැකියාව ඉවත් කිරීමට ඉඩ තිබේ.

PayPal ගිණුමක් රහිත ගෙවන්නෙකුට ඔබේ PayPal ගිණුම වෙත ගෙවීමක් එවීම සඳහා හැකියාව ලබා දීම අදහස් කරගත් කිනම් හෝ ක්‍රියාකාරීත්වයක් ඔබේ මාර්ගගත ගෙවීම/වේදිකාව වෙත ඒකාබද්ධ කිරීම මගින්, PayPal විසින් PayPal Braintree වෙබ් අඩවියෙහි ඇති ඕනෑම පිටුවක් මත (සංවර්ධකයන් සඳහා වන ඕනෑම පිටුවක් සහ අපගේ නෛතික ගිවිසුම් පිටුව ද ඇතුළත්ව) හෝ මාර්ගගත මණ්ඩපය මත ඔබට ලබා දෙන එකී ක්‍රියාකාරීත්වයේ සියලු ම වැඩිදුර භාවිත නියමයන්ට ඔබ එකඟ වෙයි. එබඳු වැඩිදුර නියමවලට PayPal විකල්ප ගෙවීම් ක්‍රම නියම ඇතුළත් වේ.

**අධිභාර ගාස්තු නැත**

PayPal ගෙවීමේ ක්‍රමයක් ලෙස පිළිගැනීම සඳහා ඔබ විසින් අධිභාරයක් හෝ වෙනත් කිසිඳු ගාස්තුවක් අය නොකරන බවට ඔබ එකඟ වෙයි. හසුරුවීමේ ගාස්තුව අධිභාරයක් ලෙස ක්‍රියාත්මක වන නොවන තාක් හා ඔබ විසින් PayPal නොවන ගනුදෙනු සඳහා අය කරන හසුරුවීමේ ගාස්තුවට වඩා එය ඉහළ නොවන තාක් ඔබට භාණ්ඩ හෝ සේවා විකිණීම සම්බන්ධව හසුරුවීමේ ගාස්තුවක් අය කළ හැකිය.

**PayPal ඉදිරිපත් කිරීම**

ඔබේ වෙබ් අඩවි හෝ ජංගම යෙදුම් ඇතුළුව PayPal හි සන්නම්ගත සේවා ඒකාබද්ධ කරන ඕනෑම තැනක ඔබ විසින් ඔබේ අලෙවි ස්ථානයේ පිරිනමන කිනම් හෝ ගෙවීම් ක්‍රමයකට යටත් පිරිසෙයින් සමාන ලෙස PayPal ගෙවීම් ක්‍රමය හෝ සලකුණු සැලකිය යුතුය. මීට යටත් පිරිසෙයින් සමාන හෝ වඩා හොඳ: ලාංඡන ස්ථානගත කිරීම, ඕනෑම අලෙවි ස්ථානයක ලැබෙන ස්ථානය, ගෙවීම් ප්‍රවාහය, නියම, කොන්දේසි, සීමා හා ගාස්තුවලට අදාලව සැලකීම සම්බන්ධයෙන් ඔබගේ අලෙවි ස්ථානයේ ඇති වෙනත් සලකුණු හෝ ගෙවීම් ක්‍රමවලට සාපේක්ෂව ඇතුළත් වේ. තව ද, ඔබ විසින් PayPalහි කිනම් හෝ සේවා හෝ සලකුණු ඉදිරිපත් කිරීම මගින් කිනම් හෝ ගෙවීමේ ක්‍රමයක් හෝ සලකුණක් ඉදිරියට ගෙන ඒමෙන් (හෝ ගෙවීමේ අත්දැකීමේ කලින් අවස්ථාවක දී) වැළකිය යුතුය.

අපගේ පාරිභෝගිකයන්ට නියෝජිතත්වය සැපයීමේ දී හෝ මහජන සන්නිවේදනවල දී, ඔබ විසින් කවර හෝ PayPal සේවාවක් ගෙවීමේ ක්‍රමයක් ලෙස වැරදි ලෙස විශේෂණය කිරීමෙන් හෝ කිනම් හෝ PayPal සේවාවකට වඩා වෙනත් ගෙවීමේ ක්‍රමයක් වෙත අභිමතයක් ප්‍රදර්ශිතයක් කිරීමෙන් වැළකිය යුතුය. අපගේ සියලු අලෙවි ස්ථාන ඇතුළත, ඔබගේ පාරිභෝගිකයින් PayPal භාවිතා කිරීමෙන් වැළැක්වීමට හෝ තහනම් කිරීමට උත්සාහ කිරීමෙන් හෝ පාරිභෝගිකයකු විකල්ප ගෙවීමේ ක්‍රමයක් භාවිතා කිරීමට දිරිගැන්වීමෙන් වැළකිය යුතු ය. ඔබ ඔබේ පාරිභෝගිකයින්ට PayPal සමග ඔබට ගෙවීමට හැකියාව ලබා දෙන්නේ නම්, ඔබ පිළිගන්නා ගෙවීම් ක්‍රම සංදර්ශනය හෝ ප්‍රදර්ශනය කරන ඕනෑම අවස්ථාවක (කිනම් හෝ අලෙවි ස්ථානයක් ඇතුළත හෝ ඔබේ අලෙවිකරණ ද්‍රව්‍ය, ප්‍රචාරණය හා වෙනත් පාරිභෝගික සන්නිවේදන තුළ) ඔබ විසින් PayPal සේවා යටත් පිරිසෙයින් ප්‍රමුඛ ලෙස දැක්වීමට ද, යටත්

පිරිසෙයින් ඔබ විසින් අනෙකුත් සියලු ගෙවීම් ක්‍රමවලට කරන ආකාරයේ සාධනීය ක්‍රමවේදයකින් කිරීමට ද ඔබ එකඟ වෙයි.

**බදු, තොරතුරු වාර්තාකරණය**

අපගේ ගාස්තුවලින් සමහරක් උදාහරණ ලෙස, අගය එකතු කළ බද්ද, විකුණුම් බද්ධ, ආදායම් බද්ධ, පරිශීලන හෝ රැඳවුම් බදු ඇතුළු ඕනෑම අධිකරණ බලයක් මගින් තක්සේරු කළ හැකි අදාළ බදු, අදායම් බදු, තීරුබදු, හෝ සමාන රාජ්‍ය තක්සේරු කිරීම්වලට (පොදුවේ "බදු") යටත් විය හැකි අතර ප්‍රකාශිතව සඳහන් කර ඇත්නම් විනා අපේ ගාස්තුවලට අදාළ බදු ඇතුළත් නොවේ. ඔබ සිදු කරන හෝ ඔබට ලැබෙන ගෙවීම්වලට කිනම් හෝ බද්දක් අදාළ වන්නේ නම්, ඒ කවර ඒවා දැයි යන්න නිර්ණය කර ගැනීම ඔබේ වගකීම වන අතර නිවැරදි බදු තක්සේරු කර, රැස් කර වාර්තා කර යෝග්‍ය අධිකාරිය වෙත ලබා දීම ඔබේ පූර්ණ වගකීමකි. ඔබේ ගනුදෙනුවලට කිනම් හෝ බද්දක් අදාළ වන්නේ ද යන්න නිර්ණය කිරිමට හෝ කවර හෝ ගනුදෙනුවකින් පැන නඟින බදු ගණනය, රැස් කිරීම, වාර්තා කිරීම හෝ ගෙවීම සඳහා PayPal වග කියනු නොලබයි.

**ඔබේ ආපසු ගෙවීමේ ප්‍රතිපත්තිය හා රහස්‍යතා ප්‍රතිපත්තිය**

ඔබ විසින් නීතියෙන් අවශ්‍ය කරන කල්හි ආපසු ගෙවීම් හා ආපසු යැවීමේ ප්‍රතිපත්තියක් මෙන්ම රහස්‍යතා ප්‍රතිපත්තියක් ද පළ කළ යුතුය.

**ගෙවීම් සමාලෝචනය**

PayPal මගින් යම් යම් අධික අවදානම් විය හැකි ගනුදෙනු සමාලෝචනය කරනු ලබයි. PayPal විසින් ස්වකිය පූර්ණ අභිමතය යටතේ, යම් ගනුදෙනුවක් අධික අවදානම් ලෙස තීරණය කරන්නේ නම්, අපි ගෙවීම රඳවා තබා අයිතමය ප්‍රවාහනගත කිරීම ප්‍රමාද කිරීම සඳහා ඔබට නිවේදනයක් නිකුත් කරන්නෙමු. PayPal විසින් සමාලෝචනයක් සිදු කර ගෙවීම සම්පූර්ණ කිරීම හෝ අවලංගු කිරීම සිදු කරනු ඇත. ගෙවීම සම්පූර්ණ කරනු ලැබුවහොත්, PayPal විසින් අයිතමය ප්‍රවාහනගත කරන ලෙස ඔබට දැනුම් දෙනු ඇත. එසේ නොවුණහොත්, නෛතික වශයෙන් වෙනත් පියවරක් ගැනීමට අපට සිදු වන්නේ නම් විනා, PayPal විසින් ගෙවීම අවලංගු කර ගැනුම්කරුවා වෙත අරමුදල් ආපසු ලබා දෙනු ලැබේ. මෙම ගෙවීම් සමාලෝචනය සම්පූර්ණ කරන සියලු ගෙවීම් PayPal විකුණුම්කරුවන් ආරක්ෂා කිරීමේ අවශ්‍යතා සම්පූර්ණ කරන්නේ නම් PayPal විකුණුම්කරුවන් ආරක්ෂා කිරීමේ ආවරණය ලැබීමට යෝග්‍ය වේ. අපි ඔබට ඊමේල් හා/හෝ ඔබේ PayPal ගිණුම ඔස්සේ දැනුම් දෙන්නෙමු.

**අලෙවිසැල තුළ ගෙවීම්**

ඔබ ඔබේ භෞතික අලෙවිසැල තුළ PayPal ගෙවීම් පිළිගන්නේ නම්, ඔබ විසින් ගනුදෙනුව සිදු වීමට පෙර පාරිභෝගිකයාට ගනුදෙනුවේ සම්පූර්ණ මුදල දැන්විය යුතුයි. ඔබ විසින් ඔබේ පාරිභෝගිකයාගේ ගිණුමෙන් අය කර ගත යුත්තේ ඔවුන් විසින් අවසර ලබා දී ඇති ගනුදෙනු සඳහා පමණයි. පාරිභෝගිකයා භෞතික කුවිතාන්සියක් ඉල්ලුම් කරන්නේ නම්, ඔබ විසින් එය සැපයිය යුතුයි. ඔබ විසින් සිදු කරන ඕනෑම ගනුදෙනුවකට මිල දී ගන්නා භාණ්ඩ හා සේවාවන්ගේ නිවැරදි හා සත්‍ය විස්තරයක් තිබිය යුතු බවට ඔබ එකඟ වෙයි.

**වෙළෙඳපොළ අලෙවිකරුවෝ**

ඔබ වෙළෙඳපොළක හෝ PayPal පිරිනමන තෙවැනි පාර්ශ්වීය යෙදුමක් ඔස්සේ අලෙවිකරුවෙක් වන්නේ නම්, ඔබ එම සංසදය ඔස්සේ සිදු කරන විකුණුම් සඳහා වෙළෙඳපොළට හෝ තෙවැනි පාර්ශ්වීය ගැනුම්කරු ආරක්ෂා කිරීමේ වැඩසටහනට අදාළ වන කිනම් හෝ රීතියකට අනුකූලතාව දැක්විය යුතුය. එවැනි කිනම් හෝ ආරක්ෂණයන් මගින් ඔබ විසින් යම් යම් පියවර ගැනීමට නියම කළ හැකි අතර හිමිකම් පෑම් පිළිබඳ කටයුතු කරන ආකාරයට බලපෑම් කරනු ඇත.

**කාඩ්පත රහිත ගනුදෙනු**

විකිණුම්කරුවකු ලෙසින් ඔබ වෙතින් යමක් මිල දී ගැනීම සඳහා ගැනුම්කරුවකු විසින් ඔවුන්ගේ ගිණුම භාවිතයෙන් ගෙවීම් ක්‍රමය ලෙස ණයපත හෝ හර පත භාවිතා කරන ඕනෑම අවස්ථාවක, ගැනුම්කරු ඔබේ වෙළෙඳසැල තුළ සිටිය දී කරන ගනුදෙනුවක දී වුව, ගනුදෙනුව "කාඩ්පත රහිත ගනුදෙනුවක්" ලෙස සකස් කරනු ලැබෙනු ඇත.

**කලින් අවසර දුන් ගෙවීම් පිළිගැනීම**

විකිණුම්කරුවකු ලෙස, ඔබට ගැනුම්කරුවකුගේ ගිණුමෙන් ඒක වාරික, ක්‍රමික හෝ අනියම් පදනමක් මත කලින් අවසර දුන් ගෙවීම් හරහා ගෙවීම් පිළිගැනීමට හැක. මෙම ආකාරයේ ගනුදෙනු ඇතැම් විට, "බිල් කිරීමේ ගිවිසුම", "දායකත්වය", "පුනරාවර්තන ගෙවීම", "සඳැහුම් ගනුදෙනුව", "කලින් අවසර දුන් හර හෝ PAD", "කලින් අවසර දුන් මාරු කිරීම", "කලින් අනුමත කළ ගෙවීම", හෝ "ස්වයංක්‍රීය ගෙවීම" ලෙස හැඳින්වේ.

| ඔබට ගැනුම්කරුවන් වෙතින් කලින් අවසර දුන් ගෙවීම් ලැබෙන්නේ නම්: | |
|---|---|
| ඔබ කළ යුතු දෑ: | ඔබ නොකළ යුතු දෑ: |
| මුදල, සංඛ්‍යාතය හා එවැනි ගෙවීමක කාල සීමාව සඳහා ගැනුම්කරුගේ පූර්ව බලය ලබාදීම ලබා ගැනීම. | ගැනුම්කරුවෙකු පූර්ව බලය ලබාදුන් ගෙවීමක් නවතා හෝ අවලංගු කර ඇත්නම්, ගැනුම්කරුගේ ලිඛිත බලය ලබාදීමකින් තොරව ඉදිරි ගෙවීම් නැවත ආරම්භ කරන්න. |
| ගැනුම්කරුවන් පෙර බලය ලබාදුන් මාර්ගගත ගෙවීම් සඳහා ලියාපදිංචි වුවහොත් සරල සහ පහසුවෙන් පිවිසිය හැකි මාර්ගගත අවලංගු කිරීමේ ක්‍රියා පටිපාටියක් සපයන්න. | |
| ගෙවීම සඳහා සැලසුම් කළ දිනට [වැඩ කරන දින](#) 3 කට පෙර එවැනි ගෙවීමක් නැවැත්වීමේ හැකියාව ගැනුම්කරුවන්ට ලබාදෙන්න. | |
| පෙර බලය ලබාදුන් ගෙවීම පෙර බලය ලබාදුන් මුදල් ප්‍රමාණයෙන් වෙනස් වන්නේ නම් හෝ (ගැනුම්කරුවන්ගේ තේරීම අනුව) පෙර තීරණය කරන ලද පරාසයෙන් ඔබ්බට යන කිසියම් ගෙවීමක් ඇත්නම් සෑම පෙර බලය ලබාදුන් ගෙවීමකම මුදල් ප්‍රමාණය සහ දිනයට දින 10 කට පෙරවත් ගැනුම්කරුවාට දැනුම් දෙන්න. | |

**ස්වයංක්‍රීය මාරුකිරීම් සිදුකරන රටවල්**

ඔබ ස්වයංක්‍රීය මාරු කිරීම් සිදුකරන රටක පදිංචිකරුවෙකු නම්, ඔබට ගෙවීම් ලැබීමට හැකියාව ඇති නමුත් ඔබ ඔබගේ ගෙවීමේ සම්පූර්ණ මුදල ලබාගත හැක්කේ ලද හැකි මුදල් ගැනීමේ ක්‍රමයක් හරහාය. ඔබ එසේ නොකරන්නේ නම්, නිත්‍ය පදනමකින් ඔබගේ මුදල් ආපසු ගැනීමේ

ක්‍රමය වෙත ඔබගේ PayPal ගිණුමෙන් ස්වයංක්‍රීයවම මුදල් ආපසු ලබාගනු ඇත. ස්වයංක්‍රීය මාරු කිරීම පිළිබඳ අතිරේක නියමයන් සඳහා කරුණාකර මෙතන ක්ලික් කරන්න.

## මාර්ගගත සහ අලෙවිසැල තුළ ගෙවීම් සඳහා ගනුදෙනු ගාස්තු

### සම්මත ගනුදෙනු ගාස්තු

ඔබේ PayPal ගනුදෙනු ගාස්තු ගැනුම්කරුගේ රට/කලාපය මත පදනම් වේ. භාණ්ඩ හෝ සේවා අලෙවි කිරීමේදී හෝ පරිත්‍යාග ලබා ගැනීමේ දී ඔබ ගෙවන ගාස්තුව සහ ගැනුම්කරුවන් විසින් සිය PayPal ගිණුම භාවිතයෙන් (හෝ වෙනත් බලයලත් වොලට්වුවක් භාවිත කර) ගෙවන ගාස්තුව වාණිජ ගෙවීම් ගාස්තු වගුව තුළ දැක්වේ. කරුණාකර සැලකිල්ලට ගන්න:

- PayPal භාවිතා කර ඔබ සකසන ඉදිරි ගනුදෙනුවලට අදාළ වන ලෙස අපි ගාස්තු සකස් කරන්නෙමු. කිසියම් ගාස්තුවක් වැඩි කිරීම හෝ නව වර්ගයේ ගාස්තුවක් හඳුන්වාදීම සම්බන්ධව අපි ඔබට දින 14 කට වත් කළින් දැනුම් දෙන්නෙමු.
- PayPal නිෂ්පාදනයක් භාවිතා කර ඔබ ගෙවීම් පිළිගන්නේ නම් (PayPal ගෙවීම් ප්‍රෝ වැනි), එම නිෂ්පාදනවලට අදාළ ගාස්තු ඔබගේ ගනුදෙනුවලට අදාළ වෙනු ඇත.

### ව්‍යාපාරික අනුපාතිකය

අපගේ ව්‍යාපාරික අනුපාතිකය සඳහා සුදුසුකම් ලැබීමට, ඔබ ඒක වාරික අයදුම්පතක් ඉදිරිපත් කළ යුතුය, සුදුසුකම් ලත් මාසික අලෙවි පරිමාවක් තිබිය යුතු අතර යහපත් තත්ත්වයේ ව්‍යාපාරික ගිණුමක් තිබිය යුතුය. ව්‍යාපාරික අනුපාතික නිර්ණායක බැලීමට මෙතැන ක්ලික් කරන්න.

ව්‍යාපාරික අනුපාතය ලබා ගත හැක්කේ ඇතැම් රටවල / කලාපවල ලියාපදිංචි PayPal ගිණුම් ඇති ව්‍යාපාරිකයන්ට පමණක් බව කරුණාවෙන් සලකන්න.

### ක්ෂුද්‍ර ගෙවීම් ගාස්තු

ඔබගේ ගනුදෙනු සාමාන්‍යයෙන් $10 USD කට වඩා අඩු සාමාන්‍යයක් ගන්නේ නම්, ඔබගේ PayPal ගිණුම හරහා භාණ්ඩ සහ අලෙවිය සඳහා ක්ෂුද්‍ර ගෙවීම් මිලකරණය ලැබීමට ඔබ සුදුසුකම් ලබනු ඇත. සුදුසුකම් ලැබීමට, ඔබට යහපත් තත්ත්වයේ PayPal ගිණුමක් තිබිය යුතු අතර (උදාහරණයක් ලෙස සීමාවන් නොමැති වීම සහ PayPal ශේෂය සෘණ අගයක් නොගැනීම) ගෙවීම් PayPal ගෙවීම් ප්‍රෝ භාවිතා කර සිදු නොකළ යුතුය, එමෙන්ම ඔබ අයදුම්පතක් ඉදිරිපත් කර අපගේ අනුමැතිය ලබා තිබිය යුතුය.

ඔබගේ PayPal ගිණුම ක්ෂුද්‍ර ගෙවීම් පිළිගැනීමට අනුමැතිය ලබා ඇත්නම්, ඔබගේ PayPal ගිණුම හරහා සිදු කෙරෙන භාණ්ඩ හා සේවා අලෙවි ගනුදෙනු සියල්ලටම, වාණිජ ගෙවීම් ගාස්තු වෙනුවට **ක්ෂුද්‍ර ගෙවීම් ගාස්තු වගුව** මත ඇති ගාස්තු අදාළ වෙනු ඇත. ඔබට PayPal ගිණුම් කිහිපයක් ඇත්නම්, ඔබගේ ක්ෂුද්‍ර ගෙවීම් ගනුදෙනු සුදුසු ගිණුම හරහා යොමු කළ යුතුය. ගනුදෙනුවක් සැකසුණු පසු, PayPal විසින් වෙනත් ගිණුමක් හරහා ඔබගේ ගනුදෙනුව නැවත යොමු නොකරනු ඇත.

ඩිජිටල් භාණ්ඩ සඳහා ක්ෂුද්‍ර ගෙවීම් අදාළ කරගැනීමෙන්, වගුවේ දක්වා ඇති මිල ගණන් දක්වා ඔබ ලබන ඩිජිටල් භාණ්ඩ ගනුදෙනු සඳහා ඔබ එය පිළිගන්නා අතර, ගැනුම්කරුවෙකු මතභේදයක් ආරම්භ කරන්නේ නම් PayPal විසින් ගනුදෙනුව ප්‍රත්‍යාවර්තනය කර

ගැනුම්කරුවාට මතභේදය හිමිකම් පෑමක් දක්වා ගෙන යාමට අවශ්‍ය නොකර ඔබගේ ගිණුමෙන් අරමුදල් ඉවත් කරනු ලැබේ.

## PayPal ගෙවා දැමීම්

ඔබ PayPal ගෙවීම් (මීට පෙර බහු ගෙවීම) භාවිත කරන්නේ නම්, PayPal ගෙවීම් ගිවිසුමේ නියමයන් අදාළ වනු ඇත.

### මිල නියම කිරීම හෝ ගාස්තු දෝෂ පිළිබඳ PayPal වෙත දැනුම් දීම ඔබේ වගකීමයි.

ඔබේ ව්‍යාපාර ගිණුම(ගිණුම්වල) ට අදාළව PayPal විසින් ඔබට ලබා දී ඇති කිසියම් ගිණුම් ප්‍රකාශ(යක්) හෝ වෙනත් ගිණුම් ක්‍රියාකාරීත්ව තොරතුරු වෙත ඔබට ප්‍රවේශය හිමි වූ විට, PayPal විසින් අය කරනු ලබන මිලකරණ හෝ වෙනත් ගාස්තු සම්බන්ධව කිසියම් දෝෂයක් හෝ විෂමතාවක් ඇත්නම්, ඒවා ලිඛිතව PayPal වෙත දැනුම් දීමට ඔබට දින හැට(60) ක කාලයක් ලැබෙනු ඇත. එවැනි කාල රාමුවක් තුළ ඔබ PayPal වෙත ඒ පිළිබඳ දැනුම් දීමක් නොකරන්නේ, ඔබ එම තොරතුරු නිවැරදි යැයි පිළිගන්නා අතර, අදාළ නීතියෙන් වෙනත් ආකාරයකින් අවශ්‍ය නොවන්නේ නම් කිසිදු නිවැරදි කිරීමක් කිරීමට PayPal හට බැඳීමක් නොමැත. මෙම විධිවිධානයේ අරමුණු සඳහා, එවැනි මිලකරණ හෝ ගාස්තු සම්බන්ධයෙන් වන දෝෂ හෝ විෂමතා, එක් එක් පරිශීලක ගිවිසුමේ දක්වා ඇති විවිධ දැනුම්දීම් කාලරාමුවලට යටත් වන බලය නොලත් ගනුදෙනු සහ වෙනත් විද්‍යුත් මාරු කිරීමේ දෝෂවලට වඩා වෙනස් වේ.

## ආපසු ගෙවීම්, හරවා යැවුම් සහ නැවත අය කිරීම්

### සාමාන්‍ය තොරතුරු

කිසියම් හේතුවක් නිසා පසුව අවලංගු කරන ලද හෝ නැවත මුදල් ලබා දෙන ලද භාණ්ඩ හෝ සේවාවක් අලෙවිය වෙනුවෙන් ඔබට ගෙවීමක් ලැබුණ හොත්, ඔබ වෙත එවන ලද ගෙවීම සහ කිසියම් ගාස්තුවක් ඇත්නම් (පහත විස්තර කර ඇති කිසියම් අදාළ නැවත අය කිරීමේ ගාස්තුවක් හෝ මතභේද ගාස්තුවක් ඇතුළුව) එය සම්බන්ධ සම්පූර්ණ වගකීම ඔබ සතු වේ. ගනුදෙනුවක මුදල ආපසු ලබාදෙන හෝ ආපසු හරවන ඕනෑම මොහොතක, PayPal විසින් මුල් ගනුදෙනුවට සමාන මුදලෙන්ම ඔබගේ PayPal ගිණුමෙන් ගනුදෙනුව ප්‍රතිවර්තනය කිරීම හෝ මුදල ආපසු ලබාදීම කරනු ඇත. මුදල් ආපසු ලබාදීම හෝ ප්‍රතිවර්තන මුදල ආවරණය කිරීමට යම් ව්‍යවහාර මුදලක් සඳහා PayPal ශේෂය ප්‍රමාණවත් නොවන්නේ නම්, ගනුදෙනුවට අදාළ මුදල නැවත ලබාදීම හෝ ප්‍රතිවර්තනය කිරීමට PayPal විසින් ව්‍යවහාර මුදල් පරිවර්තනයක් සිදු කරනු ඇත. මුදල් නැවත ලබා දීම හෝ ප්‍රතිවර්තනය සිදු කරන මොහොතේ ඇති PayPal ගනුදෙනු විනිමය අනුපාතය (අපගේ ව්‍යවහාර මුදල් පරිවර්තන අනුපාතය ඇතුළුව) භාවිතා කෙරෙනු ඇත.

ඔබ ගනුදෙනුවක් ආපසු ගෙවන්නේ නම්, අපගේ ගාස්තු පිටුවේ දක්වා ඇති පරිදි ඔබ ගෙවූ ගාස්තු අපි රඳවා ගන්නෙමු.

### අවලංගු කරන ලද හෝ ආපසු හරවන ලද ගෙවීම්

පහත තත්ත්වයන් යටතේදී ඔබට කෙරෙන ගෙවීම් PayPal විසින් අවලංගු කරනු හෝ ආපසු හරවනු ලැබේ:

- ගැණුම්කරුවෙකු විසින් අප වෙත ඉදිරිපත් කරන ලද PayPal ගැණුම්කරු ආරක්ෂණ හිමිකම් පෑමක්, කාලීනව ප්‍රතිචාර දැක්වීමට ඔබ අසමත් වීමේ ප්‍රතිඵලයක් ලෙස හා වෙනත් හේතු මත ඔබට අහිමි වීම.
- ඔබේ ගැනුම්කරු කාඩ්පත් අරමුදල් සපයන ගනුදෙනුවකට අදාළ නැවත අය කිරීමක් සිදු කරන අතර ගනුදෙනුව PayPal හි අලෙවිකරුගේ ආරක්ෂණය සඳහා සුදුසුකම් නොලබයි. කාඩ්පත් අරමුදල් සපයන ගනුදෙනුවකට අදාළ නැවත අය කිරීමක් සිදු කරන විට ගැනුම්කරුවෙකු සාර්ථක ද යන්න PayPal නොව කාඩ්පත් නිකුත් කරන්නා තීරණය කරයි.
- පොරොන්දු වූ පරිදි ඔබ ගනුදෙනුව ඉටු නොකිරීම හෝ අවශ්‍ය විටෙක ප්‍රවාහනගත කිරීම පිළිබඳ සාක්ෂි හෝ භාරදුන් බවට සාක්ෂි සැපයිය නොහැකි වීම.
- මුදල් ආපසු ගෙවීමේ සහතික කිරීමේ වැඩසටහන යටතේ eBay ඔබට එරෙහිව තීරණය කිරීම (සහ ඔබ ඉවත් වී නොමැති වීම).
- ගැණුම්කරුවෙකු හෝ ගැණුම්කරුගේ බැංකුව විසින් සිදුකරන ලද බැංකු ප්‍රතිවර්තනයක් පිළිබඳ අපගේ පරීක්ෂණයෙන් ගනුදෙනුව වංචනික බව පෙනී යාම.
- PayPal විසින් ඔබ වෙත ගෙවීම වැරදීමකින් යවා තිබීම.
- ගෙවීම බලය රහිත වීම.
- මෙම පරිශීලක ගිවිසුම, PayPal හි පිළිගත හැකි භාවිත ප්‍රතිපත්තිය හෝ ඔබ සහ PayPal අතර ඇති වෙනත් ගිවිසුමක් උල්ලංඝනය කළ ක්‍රියාකාරකම් සඳහා ඔබට ගෙවීම් ලැබුණි.

ඔබට ගෙවීමක් ලැබුණු විට, ඔබ වෙත එවන ලද ගෙවීම්වල සම්පූර්ණ මුදල සහ පසුව කිසියම් හේතුවක් නිසා ගෙවීම අවලංගු වුවහොත් ඕනෑම ගාස්තුවක් සඳහා ඔබ PayPal වෙත බැඳී සිටී. ගැනුම්කරු වෙනත් මුදලකින් ගෙවා ඇත්නම්, මුදල් ආපසු ගෙවීම හෝ ප්‍රතිවර්තනය සිදුකරන අවස්ථාවේදී PayPalහි ගනුදෙනු විනිමය අනුපාතය (අපගේ ව්‍යවහාර මුදල් පරිවර්තන අනුපාතය ඇතුළුව) භාවිතා කරමින් ඔබ වෙත එවන ලද ගෙවීම්වල සම්පූර්ණ මුදල එම මුදලින් ගණනය කළ හැකිය. ගෙවීම් මුදල සහ ගාස්තු සඳහා වන ඔබේ වගකීම ආවරණය කිරීමට ඔබේ PayPal ශේෂය ප්‍රමාණවත් නොවේ නම්, මෙය ඍණ PayPal ශේෂයකට හේතුවනු ඇත. ඕනෑම ඍණාත්මක PayPal ශේෂයක් මගින් නියෝජනය කරන්නේ ඔබ අපට ගෙවිය යුතු මුදලක් වන අතර, මෙම තත්වය තුළ, එය තුරන් කිරීම සඳහා ඔබ වහාම ඔබේ PayPal ශේෂයට අරමුදල් එකතු කළ යුතුය. ඔබ එසේ නොකරන්නේ නම් PayPal මෙසේ සිදු කිරීමට ඉඩ ඇත:

- ඔබේ ශේෂය හර කිරීමෙන් PayPal නිසා ගෙවිය යුතු මුදල් ආපසු අයකර ගැනීම;
- එවැනි මුදල් ඔබෙන් අයකර ගැනීමට එකතු කිරීමේ උත්සාහයන්හි නිරත වීම;
- PayPal වෙත ගෙවිය යුතු මුදල් යටතේ දක්වා ඇති ඕනෑම හා සියලු ක්‍රියාමාර්ග ගැනීම; හෝ
- සීමිත ක්‍රියාකාරකම් සහ රඳවා ගැනීම් යටතේ දක්වා ඇති පරිදි ඔබේ PayPal ගිණුමේ සීමාවක් පැනවීම හෝ වෙනත් ක්‍රියාමාර්ගයක් ගැනීම.

**මතභේද ගාස්තු**

ගැනුම්කරුවකුගේ PayPal ගිණුමකින් හෝ PayPal ආගන්තුක ගෙවා පිටවීම ඔස්සේ හෝ සකස් කරනු ලබන ගනුදෙනු සඳහා මාර්ගගත මතභේද විසඳුම් ක්‍රියාවලිය සඳහා පහසුකම් සපයනු වස් PayPal අලෙවිකරුවන් වෙතින් මතභේද ගාස්තුවක් අය කරනු ඇත. ගැනුම්කරුවා විසින් PayPal සමග ඍජුව හිමිකම් පෑමක්, සිය කාඩ්පත් නිකුත් කරන්නා සමග නැවත අය කිරීමක්, හෝ සිය බැංකුව සමග ප්‍රතිවර්තනයක් සඳහා කටයුතු කරන විට මතභේද ගාස්තුවක් අදාළ වේ. මතභේද ගාස්තුව එක්කෝ **සම්මත මතභේද ගාස්තු** අනුපාතිකයට අනුව හෝ **ඉහළ පරිමා මතභේද ගාස්තු** අනුපාතිකයට අනුව අය කරනු ලැබෙනු ඇත. මුල් ගනුදෙනු ලැයිස්තුගත කිරීම සඳහා ඔබ තෝරා

ගත් මුදලින් මතභේද ගාස්තු අය කෙරේ. ගනුදෙනුව ඇත්තේ මතභේද ගාස්තු වගුවේ ලැයිස්තුගත කර නොමැති මුදල් වර්ගයකින් නම්, අය කරනු ලබන ගාස්තුව ඔබේ ප්‍රාථමික රඳවා ගැනීමේ මුදලේ වේ. මතභේද ගාස්තුව හිමිකම් පෑම තීරණය කරනු ලැබීමෙන් පසුව ඔබේ PayPal ගිණුම වෙතින් අඩු කර ගනු ලැබේ.

මතභේදය තනනු ලැබූ පසු මතභේද ගාස්තු මුදල තීරණය කරනු ලැබෙනු ඇත. ගාස්තුව පසුගිය ලිත් මාස තුන සඳහා ඔබේ මුළු අලෙවි ප්‍රමාණයට සාපේක්ෂව සියලු ම නොලැබුණු අයිතම සහ සැලකිය යුතු ලෙස විස්තර කර ඇති ආකාරයෙන් නැති හිමිකම් සියල්ලේ මුළු ගනුදෙනු අගයේ අනුපාතය මත පදනම් වනු ඇත. ඔබගේ සම්පූර්ණ හිමිකම් පෑමට ලැබුනේ නැති සහ සැලකිය යුතු ලෙස විස්තර කර නොමැති හිමිකම් වෙත සෘජුවම ගොනු කර හෝ PayPal වෙත හෝ ගැනුම්කරුගේ කාඩ්පත් නිකුත් කරන්නා හෝ බැංකුව වෙත ගොනු කරනු ලැබේ. ඔබගේ සම්පූර්ණ හිමිකම් පෑමට බලය නොලත් ගනුදෙනු සඳහා හිමිකම් ඇතුළත් නොවේ. උදාහරණයක් ලෙස, සැප්තැම්බර් මාසය සඳහා, ඔබේ මතභේද අනුපාතය ගණනය කරනු ලබන්නේ ජූනි, ජූලි සහ අගෝස්තු මාසවල විකුණුම් අනුපාතය සඳහා වන ඔබේ මුළු හිමිකම් සලකා බැලීමෙනි. සැප්තැම්බර් සඳහා වන හිමිකම් අනුපාතය විසින් ඔක්තෝම්බර් මාසයේ දී ගොනු කරන ලද සියලු ම හිමිකම් සඳහා මතභේද ගාස්තුව තීරණය කරනු ඇත.

ඔබේ මතභේද අනුපාතිකය 1.5% හෝ ඊට වැඩි වන්නේ නම් හා ඔබට පසුගිය සම්පූර්ණ ලිත් මාස තුන තුළ විකුණුම් 100කට වඩා තිබිණි නම්, එක් එක් මතභේදය සඳහා ඔබෙන් **ඉහළ පරිමා මතභේද ගාස්තුව** අය කරනු ලැබේ. එසේ නැතහොත්, ඔබෙන් එක් එක් ගාස්තුව සඳහා **සම්මත මතභේද ගාස්තුව** අය කරනු ලැබේ.

ඔබෙන් **සම්මත මතභේද ගාස්තුවක්** අය නොකරන මතභේද වන්නේ:

- PayPal සමග වන හිමිකම් පෑමකට ඉහළට ඉදිරිපත් නොකරන ලද PayPalහි විසඳුම් මධ්‍යස්ථානයේ ඇති විමසුම්.
- සෘජුවම ඔබ හා ගැනුම්කරුවා අතර විසඳනු ලබන, PayPal සමග හිමිකම් පෑමක් සඳහා ඉහළට ඉදිරිපත් නොකරන මතභේද.
- ගැනුම්කරුවා විසින් අවසර නොගත් ගනුදෙනුවක් ලෙස සෘජුවම PayPal සමග ගොනු කරන ලද මතභේද.
- **PayPalහි අලෙවිකරුගේ ආරක්ෂා** වැඩසටහන සඳහා සුදුසුකම් ලබයි.
- **සම්මත මතභේද ගාස්තුවක** අගය මෙන් දෙගුණයකට වඩා අඩු වන ගනුදෙනු අගයක් සඳහා වන හිමිකම් පෑම්.
- PayPal හෝ ඔබේ කාඩ්පත් නිකුත් කරන්නා මගින් ඔබට ප්‍රතිලාභයක් අත්වන පරිදි තීන්දුවක් ලබා දුන් මතභේද.

ඔබෙන් **ඉහළ පරිමා මතභේද ගාස්තුවක්** අය නොකෙරෙන මතභේද වන්නේ:

- PayPalහි විසඳුම් මධ්‍යස්ථානයේ ඇති PayPal සමග හිමිකම් පෑමක් සඳහා ඉහළට ඉදිරිපත් නොකරන ලද විමසුම්.
- සෘජුවම ඔබ හා ගැනුම්කරුවා අතර විසඳනු ලබන, PayPal සමග හිමිකම් පෑමක් සඳහා ඉහළට ඉදිරිපත් නොකරන මතභේද.
- ගැනුම්කරුවා විසින් අවසර නොගත් ගනුදෙනුවක් ලෙස සෘජුවම PayPal සමග ගොනු කරන ලද මතභේද.

**ඉහළ පරිමා මතභේද ගාස්තු** අය කරන ලද විකුණුම්කරුවන්ට මතභේද අනුපාතික වැඩි කිරීමට හේතුව, මතභේද අවම කිරීමට ගන්නා ලද ක්‍රියා මාර්ග හා එකී ක්‍රියා සඳහා කාල රාමුව ඇතුළත් වන ප්‍රතිකර්ම සැලසුමක් ඉදිරිපත් කිරීමට සිදු විය හැක.

ඉහත දක්වා ඇති මතභේද සඳහා **සම්මත මතභේද ගාස්තුව** හෝ **ඉහළ පරිමා මතභේද ගාස්තුව** අය කරනු ලැබීමෙන් නිදහස් කරනු ලැබිය හැකි නමුත්, හිමිකම් පෑම තවදුරටත් ඔබේ මතභේද අනුපාතිකයේ සමස්ත ගණනය කිරීම තුළ ඇතුළත් වීමට ඉඩ තිබේ.

**නැවත අය කිරීම් ගාස්තු**

ගැණුම්කරුවෙකුගේ PayPal ගිණුමක් හරහා හෝ ආගන්තුක ගෙවීමක් හරහා සැකසුම් කර නැති ගැනුම්කරු ඔවුන්ගේ කාඩ්පත් නිකුත් කරන්නා සමඟ ගනුදෙනුව සඳහා අයකිරීමක් සිදු කරන ගනුදෙනු සඳහා, අයකිරීම් ක්‍රියාවලියට පහසුකම් සැපයීම සඳහා PayPal ඔබගෙන් නැවත අයකිරීමේ ගාස්තුවක් අය කරනු ඇත. කාඩ්පත් නිකුත් කරන්නා සමඟ අයකිරීම් ආපසු ලබා ගැනීමට ගැනුම්කරු සාර්ථකද යන්න නොසලකා මෙම ගාස්තුව අදාළ වේ.

අදාළ නැවත අය කිරීමේ ගාස්තුව ඔබගේ PayPal ගිණුමෙන් අඩු කෙරෙනු ඇත. නැවත අය කිරීමේ ගාස්තුව යනු මුල් ගනුදෙනුවේ මුදල් වර්ගයෙන් නැවත අය කිරීමේ ගාස්තු වගුව තුළ නිශ්චිතව දක්වා ඇති මුදල් ප්‍රමාණයයි. ගනුදෙනුව නැවත අයකිරීම් ගාස්තු වගුවේ ලැයිස්තුගත කර නොමැති මුදලකින් සිදු වූයේ නම්, ගාස්තුව ඔබේ ප්‍රාථමික රඳවා ගැනීමේ මුදල් වර්ගයෙන් අය කරනු ලැබේ.

ගැනුම්කරුවකු මුදල් නැවත අය කිරීමක් ගොනු කරන්නේ නම්, PayPal නොව, කාඩ්පත් නිකුත් කරන්නා, නැවත මුදල් අය කිරීම දිනනු ලබන්නා තීරණය කරනු ඇත.

**අලෙවිකරුවන් මත විවිධ ගැනුම්කරු ආරක්ෂණ ක්‍රියාවලීන්ගේ බලපෑම**

ඔබ PayPal හි ගැනුම්කරු ආරක්ෂණය වැඩසටහන කියවා තේරුම් ගත යුතු අතර, ඔබ සිටිනා ප්‍රදේශය හැර වෙනත් රටවල/කලාපවල PayPal ගිණුම් ඇති ගැනුම්කරුවන්ට භාණ්ඩ හා සේවා විකුණා ගෙවීම් ලබා ගන්නේ නම්, ඔබ එම රටවල්/කලාපවල එක් එක් ගැනුම්කරුවන්ට ලබා ගත හැකි PayPal ගැනුම්කරු ආරක්ෂාව ගැන ද දැන සිටිය යුතු ය. මෙම වැඩසටහන් යටතේ ගැනුම්කරුවන්ගේ අයිතීන් අලෙවිකරුවෙකු ලෙස ඔබට බලපෑම් කළ හැකි ය. පිටුවේ ඉහළින්ම ඔබේ ගැනුම්කරුගේ ස්ථානය තෝරා ගෙන එම පිහිටීම සඳහා අදාළ පරිශීලක ගිවිසුම වෙත යොමු කිරීමෙන් ඔබට නෛතික ගිවිසුම් පිටුවේ PayPal වැඩසටහන් සඳහා මෙම තොරතුරු සොයා ගත හැකි ය.

කිසියම් රටක/කලාපයක PayPal ගැනුම්කරු ආරක්ෂාව වැඩටහන යටතේ ඔබට යම් හිමිකමක් අහිමි වන්නේ නම්:

- ඔබ PayPal වෙත ප්‍රතිපූර්ණය කිරීමට බැඳී සිටී.
- අයිතමයේ මුළු මිලදී ගැනීම් මුදල සහ මුල් ප්‍රවාහනගත කිරීමේ පිරිවැය (සහ සමහර අවස්ථාවලදී ඔබට අයිතමය ආපසු නොලැබීමට ඉඩ ඇත) හා ගනුදෙනුව සඳහා ඔබෙන් අය කරන ලද PayPal ගාස්තුව ඔබගේ බැරකමට ඇතුළත් වේ. ඔබ භාණ්ඩ හෝ සේවාවල ප්‍රාථමික විකුණුම්කරු හෝ ද්විතීයික විකුණුම්කරුවෙකු වන විට මෙය අදාළ වේ. නිදසුනක් ලෙස, සිදුවීම් ප්‍රවේශපත් නිකුත් කිරීමේ නියෝජිතයන් හෝ මාර්ගගත

සංචාරක නියෝජිතයන් ගැනුම්කරු විසින් ගෙවන ලද සම්පූර්ණ ගැනුම් මුදල රාජ සන්තක කරනු ඇත. සමහර අවස්ථාවලදී ඔබට අයිතමය ආපසු නොලැබෙනු ඇත.

- ගැනුම්කරුගේ ආරක්ෂා හිමිකම් පෑම සම්පූර්ණයයෙන් විසඳනු ලැබ ඇති ලෙස සලකන්නේ:
    - ගැනුම්කරුවෙකුට ආපසු ගෙවීම PayPal හරහා සකසනු ලැබ ඇත, නැතහොත්

      \t

    - ඔබ PayPal හට පිළිගත හැකි සාක්ෂි සපයා ඇති පරිදි, එහි පූර්ණ අභිමතය අනුව, ඔබ විසින් ගැනුම්කරුට සැපයූ විකල්ප විසඳුමට එකඟ වූ බවට සාක්ෂි සපයයි.

      \t

- අලෙවියට අදාළව ඔබ ගෙවන ලද PayPal ගාස්තුව නැවත ඔබ වෙත ආපසු නොලැබෙනු ඇත.
- සැලකිය යුතු ලෙස විස්තර කර ඇති ආකාරයෙන් නොවන බවට ගැනුම්කරුවා පවසන්නේ නම්, ඔබට අයිතමය නැවත නොලැබෙනු ඇත, නැතහොත් අයිතමය නැවත භාරගෙන ආපසු ප්‍රවාහනගත කිරීමේ ගාස්තු ගෙවන ලෙස ඔබෙන් ඉල්ලනු ඇත.
- ලැබුනු අයිතමය සැලකිය යුතු ලෙස විස්තර කර නොමැති බවත්, ඔබ විකුණන ලද භාණ්ඩයක් ව්‍යාජ එකක් බවත් ප්‍රකාශ වන්නේ නම්, ඔබ ගැනුම්කරුට සම්පූර්ණ මුදල් ආපසු ලබා දිය යුතු අතර ඔබට එම භාණ්ඩය නැවත නොලැබෙනු ඇත.

ඔබ eBay හරහා විකුණන භාණ්ඩ හෝ සේවා සඳහා ගැනුම්කරුවන්ගෙන් PayPal ගෙවීම් පිළිගන්නේ නම්, ඔබ eBay මුදල් ආපසු ගෙවීමේ සහතික වැඩසටහන කියවා තේරුම් ගත යුතුය. ඔබ eBay ඇමතීමෙන් ඉවත් නොවන්නේ නම්, ඔබට ගෙවන ලද PayPal ගෙවීමක් ආපසු හැරවීමේ පදනමක් ලෙස eBay විසින් එම වැඩසටහන යටතේ ඔබේ ගැනුම්කරුවන්ට පක්ෂව තීරණය ගත් බවට PayPal සලකනු ඇත. මුදල් ප්‍රමාණය ආවරණය කිරීමට ඔබගේ PayPal ශේෂය ප්‍රමාණවත් නොවන්නේ නම් අප පහත දේ කිරීමට ඉඩ ඇත:

- එවැනි හිමිකමක් අවරණය වන තරම් ප්‍රමාණවත් අරමුදලක් ඔබගේ PayPal ගිණුමට ලැබෙන තෙක් ඔබගේ PayPal ගිණුම රඳවා තබාගැනීම; හෝ
- ඔබගේ PayPal ගිණුමේ ඍණ ශේෂයක් ඇති කිරීම.

## PayPalහි වඩා විකුණුම්කරු ආරක්ෂණ වැඩසටහන

**යෝග්‍ය වන දේ**

ඔබ ගැනුම්කරුවෙකුට භාණ්ඩයක් හෝ සේවාවක් විකුණන්නේ නම්, ඔබට PayPalහි අලෙවිකරුගේ ආරක්ෂාව වැඩසටහන සඳහා සුදුසුකම් ලැබිය හැකි ය. අදාළ වන විට PayPal අලෙවිකරුගේ ආරක්ෂාව වැඩසටහන මගින් මුළු මිල දී ගැනීම් මුදල තබා ගැනීමට ඔබට හිමිකම් කිව හැකි ය. PayPalහි අලෙවිකරුගේ ආරක්ෂාව වැඩසටහන සඳහා සුදුසුකම් ලබන ගෙවීම් ගණනට සීමාවක් නොමැත. ඔබේ PayPal ගිණුමේ ගනුදෙනු විස්තර පිටුවට පිවිසීමෙන් මෙම ගනුදෙනුව යටතේ ඔබේ ගනුදෙනුව ආරක්ෂණය සඳහා යෝග්‍ය ද නැද්ද යන්න ඔබට තීරණය කළ හැකි ය.

PayPal අලෙවිකරු ආරක්ෂණ වැඩසටහන, ගැනුම්කරුවෙකු පහත දේ සඳහා හිමිකම් පාන විට අදාළ විය හැකිය:

- ඔවුන්ගේ PayPal ගිණුමෙන් යවන ලද අරමුදල් සඳහා ඔවුන් අවසර දී නොතිබීම හෝ ප්‍රතිලාභ ලබා නොතිබීම ("බලය නොලත් ගනුදෙනුවක්" ලෙස හැඳින්වෙන PayPal විසින් සත්කාරකත්වය දක්වන පරිසරයක බලය නොලත් ගනුදෙනුව සිදුවන විට; හෝ
- ඔවුන්ට ඔබ වෙතින් අයිතමය නොලැබීම ("අයිතමය නොලැබිණි" හිමිකම් පෑමක් ලෙස හැඳින්වේ).

ගැණුම්කරුවෙකු විසින් සාර්ථක නැවත අය කිරීමක් නිසා ගනුදෙනුවක් ප්‍රත්‍යාවර්තනය කරන විට හෝ බැංකු අරමුදල් ගෙවීමක් ගැනුම්කරුගේ බැංකුව විසින් ආපසු හරවන විට PayPal හි අලෙවිකරු ආරක්ෂණ වැඩසටහන අදාළ වේ.

මෙම කොටස ඔබට අදාළ වන පරිදි PayPal අලෙවිකරු ආරක්ෂණ වැඩසටහන විස්තර කරයි, නමුත් අලෙවිකරුවන් මත විවිධ ගැනුම්කරුවන්ගේ ආරක්ෂණ ක්‍රියාවලීන්ගේ බලපෑම පිළිබඳව ඔබ දැන සිටිය යුතුය.

**මූලික අවශ්‍යතා**

PayPal අලෙවිකරුගේ ආරක්ෂාව සඳහා සුදුසුකම් ලැබීමට, පහත මූලික අවශ්‍යතා සියල්ල ම මෙන්ම ඕනෑම අදාළ අතිරේක අවශ්‍යතාවක් සැපිරිය යුතු යි:

- ඔබ අපට වලංගු ප්‍රවාහනගත කිරීමේ සාක්ෂියක් හෝ භාරදුන් බවට සාක්ෂියක් සැපයිය යුතුය.
- බලය නොලත් ගනුදෙනු හිමිකම් පෑමක් සම්බන්ධයෙන් වන විට, ඔබ විසින් PayPal ඔබට මතභේදය හෝ ප්‍රතිවර්තනය පිළිබඳ දැනුම් දී දින දෙකකට නොඅඩු කාලයක් තුළ අයිතමය ප්‍රවාහනගත කළ බවට වලංගු ප්‍රවාහනගත කිරීමේ සාක්ෂි හෝ භාර දුන් බවට සාක්ෂි සැපයිය යුතු යි. උදාහරණ ලෙස, PayPal ඔබට බලය නොලත් ගනුදෙනු හිමිකම්පෑමක් පිළිබඳ සැප්තැම්බර් 1 වැනි දින දැනුම් දුනහොත්, PayPal අලෙවිකරුගේ ආරක්ෂාව වැඩසටහනට සුදුසුකම් ලැබීම සඳහා වලංගු ප්‍රවාහනගත කිරීමේ සාක්ෂියක අයිතමය සැප්තැම්බර් 3 දින හෝ ඊට පෙර ගැනුම්කරු වෙත ප්‍රවාහනගත කළ බවට සඳහන් විය යුතු යි.
- අස්පර්ශනීය භාණ්ඩ අතිරේක අවශ්‍යතාවලට යටත් වන අයිතම සඳහා හැර අයිතමය ස්පර්ශනීය අයිතමයක් විය යුතුය.
- ඔබ විසින් ගනුදෙනුව සඳහා අයිතමය ඔබේ PayPal ගිණුමේ ඇති ගනුදෙනු විස්තරවල ඇති බෙදා හැරීමේ ලිපිනය වෙත අයිතමය ප්‍රවාහනගත කළ යුතු යි. ඔබ ගනුදෙනු විස්තර පිටුවේ ඇති ලබන්නාගේ ප්‍රවාහනය කිරීමේ ලිපිනය වෙත මුලින් අයිතමය ප්‍රවාහනගත කළ ද පසුව අයිතමය වෙනත් ලිපිනයකට හරවා යවනු ලැබුවහොත් ඔබ PayPal අලෙවිකරු ආරක්ෂාව සඳහා සුදුසුකම් නොලබනු ඇත. එබැවින් ගැනුම්කරුවා විසින් සැලසුම් කරන ලද ප්‍රවාහනගත කිරීමේ සේවාවක් භාවිතා කිරීම අපි නිර්දේශ නොකරන අතර එවිට ඔබට ප්‍රවාහනගත කිරීම හා භාණ්ඩ භාර දීම පිළිබඳ වලංගු සහතික සැපයිය හැකි වනු ඇත.
- අප විසින් ඊමේල් මාර්ගයෙන් ඔබ සමග සන්නිවේදනය කිරීමේ දී හෝ විසඳුම් මධ්‍යස්ථානය හරහා ඔබ සමග සන්නිවේදනය කිරීමේ දී එහි ඉල්ලා ඇති ආකාරයට නියමිත කාලය ඇතුළත ලියකියවිලි සහ වෙනත් තොරතුරු සඳහා PayPal විසින් කර ඇති ඉල්ලුම්වලට ඔබ විසින් ප්‍රතිචාර දැක්විය යුතු යි. ඔබ විසින් ඉල්ලා ඇති කාල සීමාව

ඇතුළත PayPal හි ලියකියවිලි හා වෙනත් තොරතුරු සඳහා වන ඉල්ලුම්වලට ප්‍රතිචාර දක්වනු නොලැබුවහොත් ඔබ PayPal අලෙවිකරු ආරක්ෂාව සඳහා සුදුසුකම් නොලැබීමට ඉඩ තිබේ.
- අලෙවියට කලින් ඇණවුම් කළ හෝ ඇණවුමට අනුව සකසන ලද භාණ්ඩ අයත් වන්නේ නම් ඔබ විසින් ලැයිස්තු කිරීමේ දක්වා ඇති කාල රාමුව ඇතුළත භාණ්ඩය ප්‍රවාහනගත කළ යුතුය. එසේ නැතිනම්, ගෙවීමක් ලැබී දින 7ක් ඇතුළත ඔබ විසින් සියලු අයිතම ප්‍රවාහනගත කිරීම නිර්දේශ කරේ.
- මිලදී ගැනීම සඳහා ඔබ PayPal ගිණුමකින් ගෙවීම් පිළිගත යුතුය (පාර්ශ්වීය ගෙවීම් සහ/හෝ වාරික ලෙස කෙරෙන ගෙවීම් හැර).
- බලය නොලත් ගනුදෙනු සම්බන්ධ හිමිකම් පෑම් සම්බන්ධයෙන් වන විට ගෙවීම "සුදුසුකම් ලත්" හෝ "අර්ධ වශයෙන් සුදුසුකම් ලත්" ලෙස සලකුණු කර තිබිය යුතු අතර අයිතමය නොලැබීම සම්බන්ධ හිමිකම් කියාපෑම් සම්බන්ධයෙන් වන විට PayPal හි අලෙවිකරු ආරක්ෂණය සඳහා ගනුදෙනු විස්තර පිටුව මත "සුදුසුකම්ලත්" ලෙස සලකුණු කර තිබිය යුතු යි.

PayPal ඔබේ හිමිකම් පෑම PayPal අලෙවිකරුගේ ආරක්ෂාව වැඩසටහන සඳහා සුදුසුකම් ලබන්නේද යන්න තීරණය කරයි. PayPal විසින් ඉහත දක්වා ඇති ආවරණය වීමේ සහ සුදුසුකම් සැපිරීමේ අවශ්‍යතා, මාර්ගගත ආරවුල් නිරාකරණ ක්‍රියාවලිය අතරතුර සපයන ලද කවර හෝ අතිරේක තොරතුරක් හෝ අදාළ තත්ත්වය යටතේ අදාළ හා යෝග්‍ය ලෙස සලකන කවර හෝ වෙනත් තොරතුරක් මත පදනම්ව එහි පූර්ණ අභිමතියට අනුව PayPal විසින් අවසන් තීරණයක් (ස්වයංක්‍රීයව කිනම් හෝ මතභේදයක් හෝ හිමිකම් පෑමක් වැසීම ඇතුළුව) ගනු ලබයි.

**අයිතමය නොලැබීමේ අතිරේක අවශ්‍යතා**

ගැණුම්කරුවෙකුගේ අයිතමය නොලැබීම වෙනුවෙන් PayPal හි අලෙවිකරුගේ ආරක්ෂණ වැඩසටහන සඳහා සුදුසුකම් ලැබීමට, ඔබ මූලික අවශ්‍යතා සහ පහත ලැයිස්තුගත කර ඇති අතිරේක අවශ්‍යතා යන දෙකම සපුරාලිය යුතු යි:

- ගැනුම්කරුවා කාඩ්පත විසින් අරමුදල් සපයන ලද ගනුදෙනුවක් සඳහා නිකුත්කරන්නාගෙන් නැවත අය කිරීමක් ගොනු කරන විට, ගනුදෙනු විස්තර පිටුවේ PayPal හි අලෙවිකරු ආරක්ෂණ වැඩසටහන සඳහා ගෙවීම "යෝග්‍ය" ලෙස හෝ "අර්ධ ලෙස යෝග්‍ය" ලෙස සලකුණු කළ යුතුය.
- පහත විස්තර කර ඇති පරිදි ඔබ භාරදුන් බවට සාක්ෂි සැපයිය යුතු යි.

**අස්පර්ශනීය භාණ්ඩ අතිරේක අවශ්‍යතා**

අස්පර්ශනීය භාණ්ඩ සහ සේවා PayPal හි විකුණුම්කරු ආරක්ෂණය සඳහා යෝග්‍ය වීමට, අලෙවිය මූලික අවශ්‍යතා සහ පහත අතිරේක අවශ්‍යතා සපුරාලිය යුතු යි:

- සමෝධානික අවශ්‍යතා:
    - ඔබ විසින් PayPal ගෙවීම් නිෂ්පාදනයක් සමෝධානය කර ඇති අවස්ථාවක, ඔබ සෘජුවම වෙබ් අඩවියක් හරහා හෝ ජංගම ප්‍රශස්තීකෘත වෙබ් අඩවියක් හරහා ගෙවීම් පිළිගන්නේ නම් ඔබ එම නිෂ්පාදනයේ වර්තමාන අනුවාදය භාවිතා කළ යුතුය; නැතහොත්

    - ඔබ තෙවැනි පර්ශ්වයක් හරහා PayPal සමග ඒකාබද්ධ වී ඇති නම් හෝ ඔබ සතුව ස්වීකෘත යෙදුම් සමෝධානයක් ඇත්නම් ගෙවීමේ දී ඔබ සැසි තොරතුරු PayPal වෙත යවන බවට සහතික වන්න.
    - වෙනත් සමෝධානික අවශ්‍යතා ඔබේ ව්‍යාපාර මාදිලිය මත පදනම්ව අදාළ විය හැකිය. අවශ්‍ය නම්, අපි මෙම අවශ්‍යතා ඔබට කල් වේලා ඇතුව දැනුම් දෙන්නෙමු.
- PayPal ගනුදෙනු විස්තර පිටුවේ අස්පෘශ්‍ය සද්භාවී ගනුදෙනුව “සුදුසුකම් ලබන” බවට සලකුණු කර හෝ වෙනත් ආකාරයකින් ඔබට ලිඛිතව සුදුසුකම් පිළිබඳ දැනුම්දීමක් සිදු කර ඇත.
- අයිතමය භාර දී අස්පෘශ්‍ය භාණ්ඩ සඳහා ප්‍රවාහනගත කිරීමේ සාක්ෂිය හෝ භාරදීමේ සාක්ෂි සපයා තිබීම.
- අත්සන් තහවුරු කිරීමේ සීමා වගුවේ දක්වා ඇති අගය මුළු ගෙවීමට (ප්‍රවාහනගත කිරීම් හා බදු ගාස්තු ඇතුළුව) වඩා වැඩි වන විට (ගෙවීමේ මුදල් වර්ගය මත පදනම්ව) අත්සන් තහවුරු කිරීම සපයන්න. මුළු ගෙවීම (ප්‍රවාහනගත කිරීම් හා බදු ගාස්තු ඇතුළත්ව) වගුවේ දක්වා නොමැති මුදල් වර්ගයකින් සිදු කර ඇත්නම්, එවිට ගනුදෙනුව සකස් කළ වේලාවේ අදාළ වන PayPal විනිමය අනුපාතයට අනුව $750 USD හට සමාන අගයකට වඩා ගෙවීම වැඩි වේ නම් අත්සන් තහවුරු කිරීම අවශ්‍ය වේ.

**භාරදුන් බවට සාක්ෂිය හෝ ප්‍රවාහනගත කිරීමේ සාක්ෂිය**

<table>
<tr><td colspan="2">භෞතික භාණ්ඩ<br><br>භෞතික භාණ්ඩ සඳහා ප්‍රවාහනගත කිරීමේ සාක්ෂිය හෝ බෙදා හැරීමේ සහතික ලෙස පහත ඒවා අවශ්‍ය වේ:</td></tr>
<tr><td>ප්‍රවාහනගත කිරීමේ සාක්ෂිය</td><td>භාරදුන් බවට සාක්ෂිය</td></tr>
<tr><td>පහත කරුණු අඩංගු වන නැව් සමාගමකින් ලබා ගන්නා මාර්ගගත හෝ භෞතික ලියවිල්ලක්:<ul><li>නැව්ගත කිරීමේ දිනය</li><li>ලබන්නා සඳහා ගනුදෙනු විස්තර පිටුවේ ඇති බෙදාහැරීමේ ලිපිනයට ගැළපෙන ලිපිනයක්</li><li>ලබන්නා සඳහා යටත් පිරිසෙයින් නගරය, රට හෝ තැපැල් zip කේතය (හෝ අන්තර්ජාතිකව ඊට සමාන වන්නක්) දක්වන ලිපිනයක්.</li></ul></td><td>පහත කරුණු අඩංගු වන නැව් සමාගමකින් ලබා ගන්නා මාර්ගගත හෝ භෞතික ලියවිල්ලක්:<ul><li>අයිතමය හෝ සේවාව භාරදුන් දිනය සහ "භාරදෙනු ලැබූ" තත්ත්වය.</li><li>ලබන්නා සඳහා යටත් පිරිසෙයින් නගරය, රට හෝ තැපැල් zip කේතය (හෝ අන්තර්ජාතිකව ඊට සමාන වන්නක්) දක්වන ලිපිනයක්.</li><li>මුළු ගෙවීම (ප්‍රවාහනගත කිරීම් හා බදු ගාස්තු ඇතුළත්ව) අත්සන තහවුරු කිරීමේ සීමා වගුවේ ලැයිස්තුගත කර ඇති අත්සන තහවුරු කිරීම ස්ථාවර අගයට (ගෙවීමේ මුදල් වර්ගය මත පදනම්) වඩා වැඩිවන විට අත්සන තහවුරු කිරීම. අත්සන් සනාථ කිරීම යනු මාර්ගගත ලේඛනකරණයක් වන අතර එය, අයිතමය සම්බන්ධව අත්සන් කළ බවට නැව් සමාගමේ වෙබ් අඩවියේ දැකිය හැකිය (එවැනි අවශ්‍යතා අදාළ නොවෙනු ඇති ඇල්බේනියාව,</li></ul></td></tr>
</table>

| | |
|---|---|
| | ඇන්ඩෝරාව, බොස්නියාව සහ හර්සිගොවිනාව, ක්‍රොඒෂියාව සහ යුක්‍රේනය තුළ ලියාපදිංචි PayPal ගිණුමක් ඇති අලෙවිකරුවන් සඳහා හැර).<br><br>**වැදගත්:** ඔබේ වාහක තේරීම හා එම වාහකයා සතුව ඇති ප්‍රවාහනගත කිරීමේ විකල්ප අවශ්‍ය භාරදුන් බවට සාක්ෂි අවශ්‍යතා සපුරාලීමට ඔබට ඇති හැකියාව කෙරෙහි දැඩිව බලපායි. විශේෂයෙන් ම අන්තර්ජාතිකව භාණ්ඩ ප්‍රවාහනගත කරන විට, ඔබේ වාහකයාට නිවැරදි ලිපිනයට 'බෙදා හරින ලද' තත්ත්වය සැපයිය හැකි බව සහතික කර ගන්න, නැතහොත් ඔබේ අලෙවිකරු ආරක්ෂණ සහතිකය හිමිකම ප්‍රතික්ෂේප වීමට ඉඩ ඇත. |

| |
|---|
| **අස්පෘශ්‍ය භාණ්ඩ**<br><br>අස්පෘශ්‍ය භාණ්ඩ සඳහා නැව්ගත කිරීම හෝ භාරදීම පිළිබඳ සාක්ෂි ලෙස පහත සඳහන් දෑ අවශ්‍ය වේ: |
| අස්පෘශ්‍ය හෝ ඩිජිටල් භාණ්ඩ සඳහා, ප්‍රවාහනගත කිරීමේ සාක්ෂිය හෝ භාරදීම සනාථ කිරීම යනු භාණ්ඩය භාර දුන් බව හෝ මිල දී ගැනීමේ ඇණවුම සපුරා ඇති බව පෙන්වීමට බලවත් සාක්ෂි ය. බලගතු සාක්ෂිවලට අයිතමය යවන ලද දිනය පෙන්වන වාර්තා පද්ධතියක් ඇතුළත් විය හැකි අතර එය මෙසේ විය හැක:<br><br>• අදාළ වන විට; ලබන්නාගේ ලිපිනය (ඊමේල්, IP, ආදිය) ඇතුළුව විද්‍යුත් වශයෙන් ලබන්නා වෙත යවනු ලැබේ; නැතහොත්<br>• ලබන්නා විසින් ලැබීම හෝ ප්‍රවේශ වීම |

**අත්සන තහවුරු කිරීමේ මුදල් සීමාවන්**

| | | | |
|---|---|---|---|
| ව්‍යවහාර මුදල | ගනුදෙනු අගය | ව්‍යවහාර මුදල | ගනුදෙනු අගය |
| ඔස්ට්‍රේලියානු ඩොලර්: | 850 AUD | නවසීලන්ත ඩොලර්: | 950 NZD |
| බ්‍රසීල රියාල්: | 1,750 BRL | නෝර්වීජියානු ක්‍රෝනා: | 4,600 NOK |
| කැනේඩියානු ඩොලරය: | 850 CAD | පිලිපීන පෙසෝ: | 34,000 PHP |

| | | | |
|---|---|---|---|
| චෙක් කොරූනා: | 15,000 CZK | පෝලන්ත ස්ලොටික්: | 2,300 PLN |
| ඩැනිෂ් ක්‍රෝන්: | 4,100 DKK | රුසියානු රූබල්: | 27,000 RUB |
| යූරෝ: | 550 EUR | සිංගප්පූරු ඩොලර්: | 950 SGD |
| හොං කොං ඩොලර්: | 6,000 HKD | ස්වීඩන් ක්‍රෝනා: | 4,950 SEK |
| හංගේරියානු ෆොරින්ත්: | 170,000 HUF | ස්විස් ෆ්‍රෑන්ක්: | 700 CHF |
| ඊශ්‍රායල් ෂේකෙල්: | 2,700 ILS | තායිවානයේ නව ඩොලරය: | 23,000 TWD |
| ජපන් යෙන්: | 77,000 JPY | තායි බාත්: | 24,500 THB |
| මැලේසියානු රිංගිට්: | 2,500 MYR | එක්සත් රාජධානි ස්ටර්ලිං: | 450 GBP |
| මෙක්සිකානු පෙසෝ: | 10,000 MXN | ඇමෙරිකානු ඩොලර්: | 750 USD |

**යෝග්‍ය නොවන අයිතම සහ ගනුදෙනු**

PayPalහි අලෙවිකරුගේ ආරක්ෂාව වැඩසටහන සඳහා පහත අයිතම හෝ ගනුදෙනු සුදුසුකම් ***නොලබයි***:

- නේවාසික දේපළ ඇතුළු, දේපළ වෙළඳාම්
- බයිසිකල් සහ රෝද සහිත හෝවර්බෝඩ් වැනි විනෝදාත්මක අරමුණු සඳහා භාවිතා කරන පුද්ගලිකව අතේ ගෙන යා හැකි සැහැල්ලු වාහන හැරුණු විට, මෝටර් වාහන, යතුරුපැදි, විනෝදාත්මක වාහන, ගුවන් යානා හෝ බෝට්ටු ඇතුළුව නමුත් ඒවාට පමණක් සීමා නොවන වාහන
- ව්‍යාපාර (ව්‍යාපාරයක් මිලට ගැනීම හෝ ආයෝජනය කිරීම)
- නිෂ්පාදන සඳහා භාවිතා කරන කාර්මික යන්ත්‍රෝපකරණ
- ත්‍යාග කාඩ්පත් සහ පෙරගෙවුම් කාඩ්පත් වැනි ගබඩා කළ වටිනා භාණ්ඩ ඇතුළුව මුදල්වලට සමාන ගෙවීම්
- රත්‍රන් සඳහා ගෙවීම් (භෞතික ස්වරූපයෙන් හෝ හුවමාරු වෙළඳ ස්වරූපයෙන්)
- මූල්‍ය නිෂ්පාදන හෝ ඕනෑම ආකාරයක ආයෝජන
- ඇතුල් වීමේ ගාස්තුවක් සහ ත්‍යාගයක් සමග සූදුව, සූදු කෙළීම සහ/හෝ වෙනත් ක්‍රියාකාරකම්
- සමූහ අරමුදල් හෝ සමූහ අරමුදල් ලෙස ලැබෙන ගෙවීම් ඇතුළුව පරිත්‍යාග

- රජය විසින් පවත්වාගෙන යනු ලබන ආයතනයකට (රජයේ ව්‍යාපාරවලට හැර), රජයේ ආයතනයකට හෝ රාජ්‍ය ආයතනයක් හෝ රජයේ ආයතනයක් වෙනුවෙන් ගෙවීම් එකතු කරන තෙවන පාර්ශවයකට ගෙවීම්
- ඕනෑම බිල්පත් ගෙවීමේ සේවාවක් සඳහා ගෙවීම්
- ඔබ යැවූ අයිතමය ඇණවුම් කළ අයිතමය නොවන බව ("සැලකිය යුතු ලෙස විස්තර කළ පරිදි නොවේ" ලෙස සඳහන්) ගැනුම්කරු ප්‍රකාශ කිරීම (අප හට හෝ ඔවුන්ගේ කාඩ්පත් නිකුත් කරන්නාට)
- PayPal හි භාණ්ඩ හා සේවා QR කේතය භාවිත කරමින් ගැනුම්කරු විසින් පුද්ගලිකව ගනුදෙනුව සඳහා මුදල් ගෙවා ඇත්නම් මිස, ඔබේ භෞතික ගබඩාවේ ගෙවීමක් සම්බන්ධව ඇතුළුව පුද්ගලිකව භාර දෙන භෞතික, ස්පෘශ්‍ය අයිතම
- ගනුදෙනුව මුලින් "සුදුසුකම් ලබන" හෝ "අර්ධ වශයෙන් සුදුසුකම් ලබන" ලෙස ගනුදෙනු විස්තර පිටුවෙහි සලකුණු කර තිබුණද, PayPal විසින් ස්වකීය පූර්ණ අභිමතිය පරිදි තීරණය කරනු ලබන ඕනෑම දෙයක්, PayPal හි පිළිගත හැකි භාවිත ප්‍රතිපත්තිය මගින් තහනම් කර ඇත.
- PayPal ගෙවා දැමීම් භාවිතයෙන් කරන ලද ගෙවීම් (කලින් බහු ගෙවීම)
- එය PayPal හි මිතුරන් සහ පවුල ක්‍රියාකාරීත්වය භාවිතයෙන් කරන ලද පුද්ගලික ගෙවීම්
- ඔබට PayPal ආගන්තුක ගෙවා පිටවීමේ ගනුදෙනු නොලැබුනහොත් සහ ඔබේ ව්‍යාපාර ගිණුම එක්සත් ජනපදය, එක්සත් රාජධානිය, ජර්මනිය, කැනඩාව, බ්‍රසීලය හෝ මෙක්සිකෝවෙහි ලියාපදිංචි කර ඇත්නම් මිස, ගැනුම්කරුවෙකුගේ PayPal ගිණුමක් හරහා ගෙවීම් සිදු නොවේ
- PayPal පසු යවන ලද අයිතම ඔබට අයිතමය මුදා නොහරින ලෙස උපදෙස් දුන්නේ ය
- (1) ගැනුම්කරුවා විසින් (අප සමග හෝ ඔවුන්ගේ මූල්‍ය ආයතනය සමග), බලය නොලත් ගනුදෙනුව ක් බවට වාර්තා කර ඇති සහ (2) සංචාරක දිනයට පැය 24 කට පෙර එවැනි හිමිකම් පෑමක් කර ඇති, සංචාරක මෙහෙයුම්කරුවකු විසින් අලෙවි කරන ලද සංචාරක ටිකට් පත්.

# PAYPAL පරිශීලක ගිවිසුම

## සීමා කරන ලද ක්‍රියාකාරකම්, රඳවාගැනීම් සහ සීමිත හානි

### සීමා කළ ක්‍රියාකාරකම්

අපගේ වෙබ් අඩවිය, ඔබගේ PayPal ගිණුම, PayPal සේවාවන් ඔබ විසින් භාවිතා කිරීම හෝ PayPal, වෙනත් PayPal පාරිභෝගිකයින් හෝ තෙවන පාර්ශ්වය සමඟ සම්බන්ධතා පැවැත්වීමේදී ඔබ පහත දේ නොකළ යුතුය:

- මෙම පරිශීලක ගිවිසුම, PayPal පිළිගත හැකි පරිශීලන ප්‍රතිපත්තිය, වාණිජ්‍ය අස්ථිත්ව ගිවිසුම් (එය ඔබට අදාළ වන්නේ නම්) හෝ ඔබ හා PayPal අතර ඇති වෙනත් ඕනෑම ගිවිසුමක් කඩ කිරීම.
- කිසිදු නීතියක්, ව්‍යවස්ථාපිතයක් හෝ රෙගුලාසියක් (උදාහරණයක් ලෙස මූල්‍ය සේවාවන්, පාරිභෝගික ආරක්ෂණයන්, අසාධාරණ තරගකාරීත්වය, වෙනස් කොට සැලකීමට විරෝධය දැක්වීම හෝ ව්‍යාජ අලෙවිකරණය යනාදිය හා සම්බන්ධ වන) උල්ලංඝනය කිරීම.

- PayPal හි හෝ වෙනත් තෙවන පාර්ශ්වයක ප්‍රකාශන හිමිකම, පේටන්ට් බලපත්‍රය, වෙළෙඳ සලකුණ, වෙළෙඳ රහස් හෝ වෙනත් බුද්ධිමය දේපළ හිමිකම හෝ ප්‍රසිද්ධිය හෝ රහස්‍යභාවය උල්ලංඝනය කිරීම.
- වංචනික භාණ්ඩ අලෙවිය.
- අපහාසාත්මක, වෙළඳ අපහාස, තර්ජනය කිරීම් හෝ හිරිහැර කිරීමේ ආකාරයකින් කටයුතු කිරීම.
- ව්‍යාජ, සාවද්‍ය හෝ නොමඟ යවන තොරතුරු සැපයීම.
- වංචනික අරමුදල් යැයි අප සාධාරණ ලෙස විශ්වාස කරන දේ යැවීම හෝ ලබාගැනීම.
- වංචනික හෝ සැක සහිත ක්‍රියාකාරීත්ව සහ/හෝ ගනුදෙනු වල නිරත වීම.
- පරීක්ෂණයකට සහයෝගය දැක්වීම හෝ ඔබේ අනන්‍යතාවය තහවුරු කිරීම හෝ ඔබ අපට තොරතුරු සැපයීම ප්‍රතික්ෂේප කිරීම.
- එකම ගනුදෙනුවක් සඳහා PayPal සහ අලෙවිකරු යන දෙඅංශයෙන්ම, බැංකුව හෝ කාඩ්පත් නිකුත් කරන්නාගෙන් අරමුදල් ලැබීමට හෝ ලබා ගැනීමට උත්සාහ කිරීමෙන් ආරවුලක් අතරතුර දෙවරක් ආදායම් ඉපයීමට උත්සාහ කිරීම.
- මෙම ඕනෑම සීමිත ක්‍රියාකාරකමකට සම්බන්ධ වෙනත් ගිණුමකට සම්බන්ධ කර ඇති ගිණුමක් පාලනය කිරීම.
- පහත ප්‍රතිඵල ගෙන එන පරිදි ඔබේ ව්‍යාපාරය කරගෙන යෑම හෝ PayPal සේවාවන් භාවිතා කිරීම:
    - පැමිණිලි;
    - ඔබට කරන ලද ගෙවීම් අවලංගු කරන ලෙස ගැනුම්කරුවන්ගේ ඉල්ලීම (අප වෙත හෝ කාඩ්පත් නිකුත් කරන්නන් වෙත); හෝ;
    - PayPal, වෙනත් PayPal, ගනුදෙනුකරුවන්ට, තෙවන පාර්ශවයකට හෝ ඔබට ගාස්තු, දඩ, දඩ හෝ වෙනත් වගකීම් හෝ අලාභ සිදුවීම.
- PayPal, Visa, MasterCard, American Express, Discover හෝ වෙනත් ඉලෙක්ට්‍රොනික අරමුදල් මාරු කිරීමේ ජාලයක් කාඩ්පත් පද්ධතිය අනිසි ලෙස භාවිතා කිරීම හෝ කාඩ්පත් සංගමය හෝ ජාල නීති උල්ලංඝනය කිරීමක් යැයි සාධාරණ ලෙස විශ්වාස කරන ආකාරයට ඔබේ PayPal ගිණුම හෝ PayPal සේවාවන් භාවිතා කිරීම.
- ඔබගේ PayPal ගිණුමට සෘණාත්මක PayPal ශේෂයක් පවත්වාගෙන යාමට ඉඩ දීම.
- ඔබගේ ණයපතෙන් මුදල් අත්තිකාරමක් ගැනීමට ඔබටම ඉඩ සලසාගැනීම (හෝ අන් අයට එසේ කිරීමට උපකාර කිරීම).
- PayPalහි අවසරලත් රටවල් ලැයිස්තුවට ඇතුළත් නොවන රටකින් PayPal සේවාවන්ට ප්‍රවේශ වීම;
- අප විසින් හෝ අප වෙනුවෙන් හෝ PayPal සේවාවන් වෙනුවෙන් ක්‍රියාත්මක කරනු ලබන අපගේ වෙබ් අඩවි, මෘදුකාංග, පද්ධති (ඕනෑම PayPal සේවාවක් සැපයීමට භාවිතා කරන ඕනෑම ජාල සහ සේවාදායකයන් ඇතුළුව) අසාධාරණ හෝ අසමාන ලෙස විශාල බරක් පැටවෙන ඕනෑම ක්‍රියාමාර්ගයක් ගැනීම; ඕනෑම වෛරස්, ට්‍රෝජන් අශ්වයන්, අනිෂ්ට මෘදුකාංග, වර්ම්ස් හෝ වෙනත් පරිගණක ක්‍රමලේඛන ක්‍රියාවලට පහසුකම් සපයන අතර ඒවාට හානි කිරීමට, කඩාකප්පල් කිරීමට, දූෂණයට, අනිසි ලෙස භාවිතා කිරීමට, අහිතකර ලෙස මැදිහත් වීමට, රහසිගතව බාධා කිරීමට හෝ අත්පත් කර ගැනීමට හෝ ඕනෑම පද්ධතියක්, දත්ත, තොරතුරු හෝ PayPal වෙත අනවසරයෙන් ප්‍රවේශ වීමට ඉඩ ලබා දීම; සේවාවන්; නිර්නාමික ප්‍රොක්සියක් භාවිතා කිරීම; අපගේ පූර්ව ලිඛිත අවසරයකින් තොරව අපගේ වෙබ් අඩවි නිරීක්ෂණය කිරීමට හෝ පිටපත් කිරීමට ඕනෑම රොබෝවක්, ස්පයිඩර්ස්, වෙනත් ස්වයංක්‍රීය උපාංගයක් හෝ අතින් ක්‍රියාවලියක් භාවිතා කිරීම; අපගේ රොබෝ බැහැර කිරීමේ ශීර්ෂයන් මඟ හැරීම සඳහා ඕනෑම උපාංගයක්, මෘදුකාංගයක් හෝ පුරුද්දක් භාවිතා කිරීම; අප විසින් හෝ අප වෙනුවෙන්, ඕනෑම PayPal සේවාවන් හෝ වෙනත් පරිශීලකයින් විසින් PayPal සේවාවන්

භාවිතයෙන් ක්‍රියාත්මක වන අපගේ වෙබ් අඩවි, මෘදුකාංග, පද්ධති (ඕනෑම PayPal සේවාවක් සැපයීමට භාවිතා කරන ඕනෑම ජාල සහ සේවාදායකයන් ඇතුළුව) බාධා කිරීමට හෝ බාධා කිරීමට හෝ බාධා කිරීමට උත්සාහ කිරීම.

- අපේ අන්තර්ජාල සේවා සපයන්නන්ගේ, ගෙවීම් සකස් කරන්නන්ගේ, හෝ වෙනත් සැපයුම්කරුවකුගේ හෝ සේවා සපයන්නෙකුගේ සේවාවක් නැතිවන කිසියම් ක්‍රියාවක් කිරීම.
- ණයපත් චර්යාවන් පරීක්ෂා කිරීමට PayPal සේවා භාවිතා කිරීම.
- තාවකාලික හෝ නිශ්චිත නොවන අත්හිටුවීම් හෝ වෙනත් අත්හිටුවීම්, සීමාකිරීම් වැනි PayPal ප්‍රතිපත්තිය මග හැරීම හෝ PayPal ගිණුම පිළිබඳ ගන්නා තීරණ. මේවාට පහත ක්‍රියාකාරකම්ද ඇතුළත් වන මුත් එම ක්‍රියාකාරකම් ඒවාට පමණක් සීමා නොවේ: PayPal ගිණුමක සෘණ ශේෂයක් ඇති විට හෝ එය සීමා කර, අත්හිටුවා ඇති විට අලුත් PayPal ගිණුමක් ආරම්භ කිරීමට තැත් කිරීම; තමාගේම නොවන තොරතුරු භාවිතා කර (නිද. නම, ලිපිනය, ඊමේල් ලිපිනය ආදිය.) භාවිතා කර අමතර PayPal ගිණුම් ආරම්භ කිරීම; හෝ වෙනත් අයකුගේ PayPal ගිණුම භාවිතා කිරීම;
- අපේ සේවකයන්ට, නියෝජිතයන්ට හෝ වෙනත් පරිශීලකයන්ට හිංසා කිරීම සහ/හෝ තර්ජනය කිරීම.
- අපගේ මාර්ගගත මතභේද විසඳීමේ ක්‍රියාවලිය සහ/හෝ PayPal ගැනුම්කරු ආරක්ෂාව අනිසි ලෙස භාවිතා කිරීම (ගැනුම්කරු හෝ විකුණුම්කරු ලෙස).
- ඔබේ PayPal ගිණුම හෝ ව්‍යාපාරය සම්බන්ධයෙන් හිමිකම්පාන්නකුගේ වාසියට අවසන් කරන ලද හිමිකම්පෑම් විෂම අනුපාතයක් අපට ලැබීමට සැලැස්වීම.
- ඔබේ PayPal සේවාවන් හා අදාළ අධික අවදානමක් ඇති බවට ණය වාර්තාකරණ ආයතනයකින් ණය අය රාශිය ලබා දී තිබීම.
- තෙවන පාර්ශ්වයකට වෙනත් පරිශීලකයකුගේ තොරතුරු අනාවරණය කිරීම හෝ බෙදාහැරීම හෝ එසේ කිරීමට ඔබට පරිශීලකගේ කැමැත්ත ඇතිනම් හැර එම තොරතුරු අලෙවිකරන අරමුණු සඳහා භාවිතා කිරීම.
- පරිශීලකයන්ට අනවසර ඊමේල් යැවීම හෝ තෙවන පාර්ශ්වවලට අනවසර ඊමේල් යැවීමට, යැවීමට උදව් වීමට ගෙවීම් කිරීම සඳහා PayPal සේවාවන් භාවිතා කිරීම.
- අපේ හෝ කිසියම් අදාළ තෙවන පාර්ශ්වයක ලිඛිත අනුමැතිය නොමැතිව PayPal වෙබ් අඩවිවල ඇති අන්තර්ගත වෙනත් පාර්ශ්වයකට සන්නිවේදනය කිරීම, පිටපත් කිරීම, ප්‍රතිනිෂ්පාදනය, වෙනස් කිරීම, ව්‍යුත්පන්න කිරීම, ප්‍රසිද්ධියේ ප්‍රදර්ශනය හෝ රචනා කිරීම.
- වෙනත් අයකුට ඔබේ ගිණුමේ මුරපද(ය) අනාවරණය කිරීම හෝ වෙනත් අයකුගේ මුරපදය භාවිතා කිරීම. මුරපද අනිසි ලෙස භාවිතා කිරීමේ ප්‍රතිඵලයක් ලෙස, ඔබ හැර වෙනත් අයකු ඔබේ ගිණුම භාවිතා කිරීම ඇතුළුව, ඊට සීමා නොවී ඒ සම්බන්ධයෙන් ඇති වන අලාභ සඳහා අපි වග නොකියමු.

## ඇති ක්‍රියාකාරකම් කිසිවක යෙදුනොත් අප ගත හැකි පියවර

ඔබ මෙම ක්‍රියාකාරකම්වලින් කිසිවක නිරතව තිබෙන බවට අප සැක කළොත්, PayPal, එහි ගනුදෙනුකරුවන් සහ අනෙක් අය ආරක්ෂා කිරීම පිණිස අපි ඕනෑම විටක අපගේ පරම අභිමතය පරිදි ක්‍රියාමාර්ග ගණනක් ගත හැකිය. අප ගන්නා පියවරවලට පහත ඒවා ඇතුළත් වන නමුත් ඒවාට පමණක් සීමා නොවේ:

- වහාම සහ අපට දඩයක් නොමැතිව, ඔබේ පරිශීලක ගිවිසුම අවසන් කිරීම, ඔබේ PayPal ගිණුම සීමා කිරීම, සහ/හෝ PayPal ගිණුම වසා දැමීම හෝ අත්හිටුවීම;
- දැන් සහ අනාගතයේදී ඔබට PayPal සේවාවන් සැපයීම ප්‍රතික්ෂේප කිරීම;

- අපගේ වෙබ් අඩවිවලට, මෘදුකාංගයට, අප විසින් හෝ අප වෙනුවෙන් ක්‍රියාත්මක කරනු ලබන පද්ධතිවලට (ඕනෑම PayPal සේවාවක් සැපයීම සඳහා භාවිතා කරන ජාල සහ සේවා කිසිවක් ඇතුළුව), ඔබගේ PayPal ගිණුම හෝ ඔබේ PayPal ගිණුමට සම්බන්ධ කර ඇති ඕනෑම ගෙවීමක් යැවීමේ හෝ ලබා ගැනීමට ඔබට ඇති හැකියාව සීමා කිරීම, ගෙවීම් යැවීම සහ මුදල් ආපසු ලබා ගැනීම සඳහා වන ඔබේ හැකියාව සීමා කිරීම ඇතුළුව වෙනත් ඕනෑම PayPal සේවාවක් වෙත ඔබගේ ප්‍රවේශය සීමා කිරීම;
- PayPal හෝ තෙවන පාර්ශ්වයක් වගවීම පිළිබඳ අවදානමෙන් ආරක්ෂා කිරීම සඳහා, හෝ ඔබ විසින් අපගේ පිළිගත හැකි පරිශීලක ප්‍රතිපත්තිය උල්ලංඝනය කර ඇත්නම්, සාධාරණ වශයෙන් අවශ්‍ය වුවහොත් ඔබේ PayPal ශේෂය අත්හිටුවයි;
- PayPal හි ගැනුම්කරු ආරක්ෂණ වැඩසටහන සහ/හෝ PayPal හි ගැණුම්කරු ආරක්ෂණ වැඩසටහන සඳහා වන ඔබගේ සුදුසුකම අත්හිටුවීම;
- PayPal, ඔබගේ බැංකුව හෝ ණය පත් හෝ හරපත් නිකුත් කරන්නා, වෙනත් බලපෑමට ලක් වූ තෙවන පාර්ශ්ව හෝ ඔබගේ ක්‍රියාමාර්ග පිළිබඳ නීති බලාත්මක කිරීම් භාවිතා කර භාණ්ඩ හෝ සේවා මිලට ගත් ගැනුම්කරුවන් සමඟ සම්බන්ධ වන්න;
- ඔබ අප වෙත සපයා ඇති වැරදි තොරතුරු යාවත්කාල කිරීම;
- ඔබට විරුද්ධව නීතිමය ක්‍රියාමාර්ග ගැනීම;
- ඔබට හෝ ඔබගේ PayPal ගිණුමට බලපාන පරිදි, PayPal හෝ එහි අනුබද්ධ ආයතනලට නියෝග කරන ලද සිංගප්පූරුවේ හෝ වෙනත් රටක උසාවියක් මඟින් නිකුත් කර ඇති නියෝග සහ තීන්දුද ඇතුළුව, තීන්දු හෝ නියෝගවලින් නියම කර ඇති පරිදි ඔබේ PayPal ගිණුමේ ඇති අරමුදල් අත්හිටුවීම, භාවිතා කිරීම හෝ මාරු කිරීම;
- ඔබ අපගේ පිළිගත හැකි පරිශීලක ප්‍රතිපත්තිය උල්ලංඝනය කර ඇත්නම් හෝ ඔබ විකුණුම්කරුවෙකු නම් සහ පිළිගත හැකි පරිශීලක ප්‍රතිපත්තිය උල්ලංඝනය කරන ගනුදෙනු සඳහා අරමුදල් ලබන්නේ නම්, ඔබ මෙම ප්‍රතිපත්තිය උල්ලංඝනය කිරීම නිසා ඇති වූ PayPal වෙත සිදුවන හානිය සම්බන්ධයෙන් ඔබ ද වගකිව යුතුය; හෝ
- ඔබ විසින් පිළිගතහැකි පරිශීලක ප්‍රතිපත්තිය උල්ලංඝනය කළහොත්, එවිට ඉහත ක්‍රියාමාර්ගවලට යටත් වීමට අමතරව ඔබගේ පිළිගතහැකි පරිශීලක ප්‍රතිපත්තිය උල්ලංඝනය කිරීම හේතුවෙන් PayPal හි අලාභවල ප්‍රමාණය සඳහා ඔබ PayPal හට වගකිවයුතු වේ. පිළිගත හැකි පරිශීලක ප්‍රතිපත්තියේ උල්ලංඝනය කිරීම්වල ස්වභාවය හේතුවෙන්, සත්‍ය හානි ගණනය කිරීම ප්‍රායෝගික නොවීම හෝ අතිශය අසීරු විය හැකි හෙයින්, මුදල් ප්‍රමාණයේ සබඳතාවේ සිට සාධාරණ වශයෙන් අපේක්ෂා කළ හැකි PayPal වෙත සිදු විය හැකි හානිය ඇතුළු වර්තමානයේ පවතින සියලු පරිවේශනීය සිද්ධීන් සැලකිල්ලට ගනිමින්, PayPal හට උල්ලංඝනය කිරීම් නියාමනය කිරීමට සහ ලුහුබැඳ යෑමට ඊට වැය අභ්‍යන්තර පරිපාලන පිරිවැය, PayPal සන්නම සහ කීර්තියට සිදු වන හානිය හා පරිශීලක උල්ලංඝනයෙන් PayPal ව්‍යාපාර හවුල්කරුවන් විසින් ඒ මත පනවනු ලබන දඩ මුදල් යනාදිය ඇතුළත්ව හා ඒවාට සීමා නොවෙමින්, පිළිගත හැකි පරිශීලක ප්‍රතිපත්තිය උල්ලංඝනය කරනු ලබන එක් වරකට අය කෙරෙන ඇමරිකානු ඩොලර් 2,500 ක් (හෝ ඊට සමාන) මුදල වර්තමානයේදී PayPal හි සත්‍ය හානිය පිළිබඳ සාධාරණ අවම තක්සේරුවක් බව ඔබ විසින් පිළිගනු ලබන අතර, ඊට එකඟ වන්නෙහිය. PayPal විසින් එවැනි අලාභ කෙළින්ම ඔබ පාලනය කරන ඕනෑම PayPal ගිණුමක පවත්නා PayPal ශේෂයෙන් අඩු කරනු ඇත.

කිසියම් හේතුවක් මත අප විසින් ඔබගේ PayPal ගිණුම වැසුවහොත් හෝ ඔබගේ PayPal සේවා භාවිතා කිරීම කිසියම් හේතුවක් මත අවසන් කළහොත්, අප විසින් අපගේ ක්‍රියාකාරකම් පිළිබඳව ඔබට දැනුම් දෙන අතර ඔබගේ PayPal ගිණුමේ අත්හිටුවා ඇති කිසියම් සීමා නොකළ අරමුදල් ආපසු ලබා ගත හැකි වන ආකාරයට සකස් කරමු.

මෙම පරිශීලක ගිවිසුමේ, සහ/හෝ ඔබගේ PayPal සේවා භාවිතයේ ඔබගේ උල්ලංඝනයක් හේතුවෙන් ඇතිවන සියලු ආපසු හැරවීම්, ගාස්තු ආපසු ගෙවීම්, හිමිකම්පෑම්, ගාස්තු, දඩ, දණ්ඩන මුදල් සහ PayPal හට, කිසියම් PayPal පාරිභෝගිකයෙකුට, හෝ තෙවන පාර්ශ්වයකට දැරීමට සිදු වන අනෙකුත් වගකීම් සඳහා ඔබ වගකිව යුතු වේ.

## රැඳවුම්, සීමා කිරීම් සහ වෙන් කිරීම්

### අත්හිටුවීම්, සීමාකිරීම් සහ සංචිත යනු මොනවාද

සමහර තත්ත්වයන් යටතේ, PayPal සහ PayPal සේවා භාවිතා කරන ගැනුම්කරුවන්ගේ සහ අලෙවිකරුවන්ගේ ජාලයේ ආරක්ෂාව සහ සම්පූර්ණත්වය ආරක්ෂා කිරීමට, PayPal විසින් ගිණුම් මට්ටමේ හෝ ගනුදෙනු මට්ටමේ ක්‍රියාකාරකම් ගනු ඇත. වෙනත් ආකාරයකින් සඳහන් කලොත් හැර, අප විසින් මෙහි විස්තර කර ඇති කිසියම් ක්‍රියාමාර්ගයක් ගතහොත්, අපගේ ක්‍රියාකාරකම් පිළිබඳව අප විසින් ඔබට දැනුම්දීමක් සිදු කරන නමුත්, මෙම ක්‍රියාමාර්ග ගැනීම සඳහා වන පරම අභිමතය අප සතු වේ. ගිණුමක සීමාකිරීමක්, අත්හිටුවීමක් හෝ සංචිතයක් හා අදාළව තොරතුරු ඉල්ලා සිටීමට, ඔබ විසින් ගැටළු විසඳීමේ මධ්‍යස්ථානය වෙත යා යුතු අතර එසේ නැතහොත් සීමාකිරීම, අත්හිටුවීම හෝ සංචිත කිරීම හා අදාළ අපගේ ඊමේල් නිවේදනයේ සඳහන් කර ඇති උපදෙස් ඔබ විසින් අනුගමනය කළ යුතු වේ.

සීමාකිරීම්, අත්හිටුවීම් සහ සංචිත කිරීම හා අදාළ වන අපගේ තීරණවලට අපගේ අවදානම් කළමනාකරණ සහ PayPal, අපගේ ගනුදෙනුකරුවන් සහ/හෝ සේවා සපයන්නන් ආරක්ෂා කිරීම හා අදාළ රහස්‍ය නිර්ණායක පදනම් කර ගත හැකිය. ඔබගේ PayPal ගිණුම හා අදාළ අවදානම ඇගයීමේදී අප විසින් හිමිකාරත්ව වංචා හා අවදානම් ආදර්ශනය භාවිතා කිරීමට ඉඩ තිබේ. ඊට අමතරව, එවැනි තීරණ පිළිබඳව ඔබ වෙත හෙළිදරව් කිරීම නියාමනයක් හෝ රජයේ අධිකාරියක් මඟින් අපව සීමා කර තිබීමට පුළුවන. අපගේ අවදානම් කළමනාකරණය හෝ ආරක්ෂණ ක්‍රියාමාර්ගවල විස්තර ඔබට හෙළිදරව් කිරීමට අපි බැඳී නොසිටිමු.

ඉහත විස්තර කර ඇති PayPal හි ක්‍රියා සඳහා පහසුකම් සැපයීමට සහ ඔබගේ PayPal ගිණුම් හා සම්බන්ධ අවදානම් මට්ටම තක්සේරු කිරීමට අපට ඉඩ දීම සඳහා, ඔබ PayPal විසින් කලින් කලට කරනු ලබන මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් ලියකියවිලි හෝ තොරතුරු ඉල්ලීම් සඳහා සහයෝගයෙන් කටයුතු කළ යුතු බව අපි පැහැදිලි කරමු.

### රැඳවුම්

අත්හිටුවීමක් යනු යම් යම් තත්ත්වයන් යටතේ ගනුදෙනු මට්ටමේදී හෝ ගිණුම් මට්ටමේදී PayPal විසින් ගැනීමට ඉඩ ඇති ක්‍රියාමාර්ගයක් වේ. ගෙවීමක් සම්බන්ධයෙන් PayPal විසින් තාවකාලික රඳවා ගැනීමක් සිදු කරන විට, යවන්නාට හෝ ලබන්නාට අරමුදල් ලබා ගැනීමට නොහැකි වනු ඇත. ගෙවීමක් සම්බන්ධයෙන් අත්හිටුවීමක් සිදු කිරීමට පෙර, PayPal විසින් බොහෝ කරුණු සමාලෝචනයට ලක් කරන අතර ඊට පහත දේවල් ඇතුළත් වේ: ගිණුමේ කාලසීමාව, ගනුදෙනු ක්‍රියාකාරිත්ව, ව්‍යාපාර වර්ගය, අතීත පාරිභෝගික ආරවුල්, සහ සමස්ත පාරිභෝගික තෘප්තිය. PayPal විසින් ගෙවීම් අත්හිටුවනු ලබන සමහර සුලබ අවස්ථාවලට පහත දේවල් ඇතුළත් වේ:

- විකිණීමේ ක්‍රියාකාරීත්වය සීමා කර ඇති නව අලෙවිකරුවන් හෝ අලෙවිකරුවන්.
- ඉලෙක්ට්‍රොනික් ද්‍රව්‍ය හෝ ප්‍රවේශපත් වැනි ඉහළ අවදානමක් සහිත කාණ්ඩ සඳහා ගෙවීම්.

- කාර්යසාධන ගැටළු, හෝ ඉහළ මට්ටමේ ගැනුම්කරු අතෘප්තිමත්භාවයක් හෝ ආරවුල් සහිත අලෙවිකරුවන්.

**අත්හිටුවීම්වලට පදනම් වනුයේ PayPal හි අවදානම පිළිබඳ තීරණ වේ**

අපගේ පරම අභිමතය අනුව, ඔබ, ඔබගේ PayPal ගිණුම, හෝ ඔබගේ ගනුදෙනු ඉහළ මට්ටමේ අවදානමක් සහිත බවට අප විශ්වාස කරයි නම්, හෝ එවැනි අත්හිටුවීමක් නියාමන අවශ්‍යතා සපුරාලීම සඳහා අවශ්‍ය වුවහොත්, අප විසින් ඔබගේ PayPal ගිණුම වෙත යවන ලද ගෙවීම් සම්බන්ධයෙන් අත්හිටුවීමක් සිදු කරමු. කරුණු ගණනක් මත පදනම්ව අප විසින් ගෙවීමක් රඳවා ගන්නේද යන්න සම්බන්ධයෙන් වන තීරණ ගනිමු, ඊට ඇතුළත් වන කරුණු වනුයේ අභ්‍යන්තර මූලාශ්‍ර සහ තෙවන පාර්ශ්ව යන දෙපාර්ශ්වයෙන්ම අපට ලැබෙන තොරතුරු වේ. අප විසින් ගෙවීමක් සම්බන්ධයෙන් අත්හිටුවීමක් සිදු කරන විට, ඔබේ PayPal ගිණුමේ අරමුදල් ලබා ගත නොහැක හෝ අවසන් නොමැත යන පෙන්නුම් කිරීමක් සහිතව දිස්වනු ඇත. අප විසින් අත්හිටුවීමක් සිදු කළ විට, ඔබගේ PayPal ගිණුම හරහා හෝ කෙළින්ම දුරකථනය හෝ ඊමේල් මඟින් අපි ඔබ වෙත ඒ බව දැනුම් දෙමු.

ගෙවීම අත්හිටුවීම අඛණ්ඩව පවත්වා ගෙන යෑමට PayPal හට හේතුවක් ඇතොත් මිස, ඔබගේ PayPal ගිණුමට ගෙවීම ලැබුණු දින සිට දින 30 ක් දක්වා වූ කාලයක් සඳහා අවදානම හා බැඳුණු අත්හිටුවීම් බලපැවැත්වේ. යම් යම් තත්ත්වයන් (නිදසුනක් ලෙස, ඔබ විසින් ගනුදෙනුව හා අදාළ නැව්ගත කිරීම සොයා ගැනීම පිළිබඳ තොරතුරු පටවා ඇත්නම්) යටතේ අප විසින් මීට කලින් අත්හිටුවීම මුදාහැරීමට ඉඩ ඇති නමුත්, එසේ කලින් මුදාහැරීම සිදු කරනුයේ අපගේ පරම අභිමතය අනුව වේ. පහත දැක්වෙන ඡේදයේ විස්තර කර ඇති ආකාරයට, අර්බුදයට ලක් කර ඇති ගනුදෙනුවක් මත පදනම්ව ගෙවීමක් අවලංගු කර ආපසු හැරවිය යුතු ගෙවීමක් ලෙසට අභියෝගයට ලක් කර ඇත්නම් අත්හිටුවීම දින 30කට වඩා වැඩි කාලයක් සඳහා බලපැවැත්වෙනු ඇත. මෙවැනි අවස්ථාවකදී, ගැටළුව විසඳෙන තෙක් ඔබේ PayPal ගිණුමේ ගෙවීම් අප විසින් අත්හිටනු ලැබේ.

**වෙළෙඳපොළ ගනුදෙනුවලට සම්බන්ධ අත්හිටුවීම්**

ඔබ වෙළඳපලක කටයුතු කරන හෝ PayPal සේවාව ලබා දෙන තෙවන පාර්ශ්ව යෙදුමක් හරහා කටයුතු කරන අලෙවිකරුවකු නම්, අදාළ වෙළඳපලේ හෝ තෙවන පාර්ශ්වයේ උපදෙස් තුළ ගෙවීමක් සම්බන්ධයෙන් වන අත්හිටුවීමක් පැනවෙනු ඇත. මෙය සිදු කරනුයේ ඔබ විසින් අපට ඔබගේ අරමුදල් අත්හිටුවීම සඳහා අවසර ලබා දුන් පසුව වන අතර එය තෙවන පාර්ශ්වයේ එකඟතාව අනුව සිදු කෙරේ. මෙම අත්හිටුවීම් ඔබගේ PayPal ගිණුමේ පෙන්නුම් කෙරෙනු ඇත. අදාළ වෙළඳපල හෝ තෙවන පාර්ශ්වය PayPal වෙත මෙම අත්හිටුවීම් සිදු කිරීමට උපදෙස් දී ඇත්තේ ඇයිද යන්න ගැන ඔබට ප්‍රශ්න ඇතොත්, ඔබ විසින් වෙළඳපල හෝ තෙවන පාර්ශ්වය සමඟ කෙළින්ම සම්බන්ධ විය යුතුය.

**අත්හිටුවීම්වලට පදනම් වනුයේ ආරවුල් සහිත ගනුදෙනු වේ**

අලෙවිකරුවෙකු ලෙස ඔබ වෙත එවන ලද ගෙවීමක් අභියෝගයට ලක් කළහොත් එය අවලංගු කර ආපසු ගෙවිය යුතු අතර, ආපසු ගෙවීමට සිදු විය හැකි මුදල ආවරණය කර ගැනීම පිණිස අප විසින් ඔබගේ PayPal ගිණුමේ ඇති අරමුදල් සම්බන්ධයෙන් තාවකාලික අත්හිටුවීමක් සිදු කරමු. මුදල් ආපසු ගෙවීම්, අත්හිටුවීම් සහ ගාස්තු ආපසු ගෙවීම් යටතේ විස්තර කර ඇති කිසියම් තත්ත්වයකදී එය අපට ගෙවීමක් සම්බන්ධ අත්හිටුවීමක් සිදු කිරීමට හේතු විය හැකිය. ගනුදෙනුව ආපසු නොහැරවිය යුතු බව අප තීරණය කළහොත්, අපි ඔබගේ තාවකාලික අත්හිටුවීම ඉවත්

කරමු. ගනුදෙනුව ආපසු හැරවිය යුතු බව අප තීරණය කළහොත්, අපි ඔබගේ PayPal ගිණුම වෙතින් අරමුදල් ඉවත් කරමු.

**ගිණුම් සීමාවන්**

සීමා කිරීම් හේතුවෙන්, ඔබේ PayPal ගිණුමේ මුදල් ආපසු ගැනීම, යැවීම හෝ ලබා ගැනීම වැනි සමහර ක්‍රියාකාරකම් සිදු කිරීමෙන් ඔබව වළක්වයි. මෙම සීමාකම් පනවනු ලබන්නේ සීමා කළ ක්‍රියාකාරකම්, ඉහළ මූල්‍ය අවදානමක්, හෝ අසාමාන්‍ය හෝ සැක සහිත ලෙස අපට පෙනෙන කිසියම් ක්‍රියාකාරීත්වයකින් PayPal, ගැනුම්කරුවන් සහ අලෙවිකරුවන් ආරක්ෂා කර ගැනීම සඳහා ය. ඔබේ PayPal ගිණුම විවෘතව තබා ගැනීමට ද සීමා කිරීම් අප හට උපකාරී වේ.

ඔබගේ PayPal ගිණුම හෝ PayPal සේවාවන් වෙත ඔබගේ ප්‍රවේශය සීමා කිරීමට, සහ/හෝ ඔබගේ අරමුදල්වලට ප්‍රවේශය සීමා කිරීමට අපට හේතුවන කරුණු ගණනාවක් තිබිය හැකිය; ඊට පහත දෑ ඇතුළත් වේ:

- ඔබගේ දැනුමකින් තොරව ඔබගේ PayPal ගිණුම වෙනත් අයෙකු විසින් භාවිතා කරන බවට අප සැක කළහොත්, අප විසින් ඔබගේ ආරක්ෂාව වෙනුවෙන් එය සීමා කර වංචනික ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් සොයා බලන්නෙමු.
- ඔබගේ අවසරයකින් තොරව ඔබගේ කාඩ්පත වෙනත් අයෙකු විසින් භාවිතා කරන බවට ඔබගේ හරපත් හෝ ණය පත් නිකුත් කරන්නා විසින් අපව දැනුවත් කළහොත්. එසේම, ඔබේ PayPal ගිණුම සහ ඔබේ බැංකු ගිණුම අතර අනවසර සම්ප්‍රේෂණයක් සිදු කර ඇති බවට ඔබගේ බැංකුව විසින් අපට දැනුම් දුනහොත්.
- අදාළ නීතියට අනුව කටයුතු කිරීම සඳහා.
- ඔබ විසින් මෙම ගිවිසුම හෝ පිළිගත් පරිශීලක ප්‍රතිපත්තිය උල්ලංඝනය කර ඇති බවට අප විසින් සාධාරණව විශ්වාස කළහොත්.
- ඔබේ PayPal ගිණුම ඉහළ අවදානමක් සහිත බවට අලෙවිකරුගේ කාර්යසාධනයෙන් පෙන්වා දීම. නිදසුන්වලට පහත දෑ ඇතුළත් වේ: අලුත්ම හෝ ඉහළ මිලක් සහිත භාණ්ඩයක් විකුණා ඔබට අසාමාන්‍ය තරම් ඉහළ හිමිකම් පෑම් ගණනාවක් සහ ආපසු ගෙවීම් ගණනාවක් ලැබීම හේතුවෙන් දුර්වල අලෙවිකරණ කාර්යසාධනයක් පෙන්වීම, හෝ ඔබගේ සාමාන්‍ය අලෙවි ප්‍රමාණය වේගයෙන් ඉහළ යන්නේ නම්.

අප විසින් ඔබගේ PayPal ගිණුම සඳහා වන ප්‍රවේශය සීමා කළහොත්, අපගේ ක්‍රියාකාරකම් පිළිබඳව අපි ඔබ වෙත දැනුම් දෙමු. ප්‍රවේශය නැවත ලබා දෙන ලෙස ඉල්ලීම් කිරීමට ඔබට අවස්ථාව සලසා දෙන අතර, එය ලබා දීම සුදුසු නම්, අපගේ පරම අභිමතය අනුව එය ඉටු කිරීමට කටයුතු කරමු.

කිසියම් සීමාවක් ඉවත් කිරීමට හැකිවීමට පෙර ඔබේ ගිණුම හා අදාළ කිසියම් ගැටළුවක් ඇතොත් එය විසඳා ගැනීමට ඔබ කටයුතු කළ යුතු වේ. සාමාන්‍යයෙන් මෙය සිදු කෙරෙනුයේ අප විසින් ඉල්ලා සිටින තොරතුරු ඔබ විසින් අප වෙත ලබා දුන් පසුව වේ. කෙසේවෙතත්, ඔබ විසින් අප වෙත එම තොරතුරු ලබා දුන් පසුවත් අවදානමක් තිබෙන බව අප සාධාරණ ලෙස විශ්වාස කළහොත්, PayPal, අපගේ පරිශීලකයින්, තෙවන පාර්ශ්වයක්, හෝ ඔබව ගනුදෙනු ආපසු හැරවීම, ගාස්තු, දඩ මුදල්, දණ්ඩන, නෛතික සහ/හෝ නියාමන අවදානම් සහ අනෙකුත් වගකීම් ආදියෙන් ආරක්ෂා කිරීමට අප විසින් කටයුතු කරමු.

**ආපසු හැරවීම්**

ඔබ, ඔබගේ PayPal ගිණුම, ඔබගේ ව්‍යාපාරික මාදිලිය, හෝ ඔබගේ ගනුදෙනු සම්බන්ධයෙන් කිසියම් ඉහළ මට්ටමමේ අවදානමක් තිබෙන බවට අප විශ්වාස කළහොත්, අපි ඔබගේ PayPal ගිණුම සම්බන්ධයෙන් ආපසු හැරවීමක් සිදු කරමු. ඔබගේ PayPal ගිණුම මත අවුරා තැබීමක් අප විසින් සිදු කරන විට, එහි අදහස වනුයේ ඔබේ ගනුදෙනු සියල්ලම හෝ ඉන් කොටසක් "අවසන් කර නොමැති" ලෙසට ඔබේ PayPal ශේෂය තුළ පෙන්වනු ඇති බවත්, ඔබට "අවසන් කර නොමැති" තත්ත්වයේ තිබෙන අරමුදල් ආපසු ගත නොහැකි බවය. මෙහි අරමුණ වනුයේ ඔබ විසින් සිදු කරන ලද ගනුදෙනු අවුරා තැබීමෙන් හෝ වලංගු නොවීමෙන් හෝ ඔබේ PayPal ගිණුම හා අදාළ වෙනත් අවදානමකින් හෝ PayPal සේවා භාවිතයෙන් වන ගනුදෙනුවලින් ඇති අවදානමෙන් ඔබව ආරක්ෂා කිරීම වේ. කරුණු ගණනක් මත පදනම්ව අප විසින් ආපසු හැරවීමක් සිදු කරන්නේද යන්න සම්බන්ධයෙන් වන තීරණ ගනිමු, ඊට ඇතුළත් වන කරුණු වනුයේ අභ්‍යන්තර මූලාශ්‍ර සහ තෙවන පාර්ශ්ව යන දෙපාර්ශ්වයෙන්ම අපට ලැබෙන තොරතුරු වේ.

PayPal විසින් පහත දැක්වෙන කරුණුවලට සීමා නොවන කරුණු ගණනාවක්, සහ කාලයක් සමඟ මෙම කරුණු වෙනස් වී ඇත්තේ කෙසේද යන්න සලකා බලමු:

- ඔබ ව්‍යාපාරික කටයුතුවල නිරතව සිටි කාලය.
- ගනුදෙනුව අත්හිටුවා ආපසු මුදල් ගෙවීමට ඔබගේ කර්මාන්තයේ ඉහළ ඉඩකඩක් ඇත්ද යන්න.
- PayPal සහ අනෙකුත් සැපයුම්කරුවන් සමඟ වන ඔබගේ ගෙවීම් සකස් කිරීමේ ඉතිහාසය.
- ඔබගේ ව්‍යාපාර සහ/හෝ පුද්ගලික ණයපත් ඉතිහාසය.
- ඔබගේ භාණ්ඩ භාරදීමේ කාලසීමා.
- ඔබ සතුව සාමාන්‍ය ප්‍රමාණයට වඩා ඉහළ ආපසු භාරදීමේ, ගාස්තු නැවත ගෙවීමේ, හිමිකම් හෝ ආරවුල් සංඛ්‍යාවක් තිබේද යන්න.

ඔබේ ගිණුමේ ඇති අරමුදල් සම්බන්ධයෙන් සංචිත කිරීමක් අප විසින් සිදු කළහොත්, අප විසින් අපගේ ක්‍රියාකාරකම් සහ සේවා නියමයන් සම්බන්ධයෙන් ඔබව දැනුවත් කරමු.

ඔබේ PayPal ගිණුම සම්බන්ධයෙන් සිදු කළ හැකි සංචිත වර්ග දෙකක් තිබෙන අතර, ඒවා දෙකම හෝ එකක් එකම අවස්ථාවේ සිදු කළ හැකිය:

- **පිරිවැටුම් සංචිතයක්** යනු ඔබ එක් එක් දින සිදු කරන ගනුදෙනුවලින් යම් ප්‍රතිශතයක් අත්හිටුවා කිසියම් එකඟ වූ පදනමකින් පසුව මුදාහැරීමයි. නිදසුනක් ලෙස, ඔබේ සංචිත කිරීම දින 90 කාල පරිච්ඡේදයක් සඳහා 10%ක් ලෙස සැකසිය හැකිය – එයින් අදහස් වනුයේ 1 වන දිනයේ ඔබට ලැබෙන අරමුදල්වලින් 10%ක් සංචිත කෙරෙන අතර ඉන්පසුව 91 වන දිනයේදී එය මුදාහැරෙන බවත්, 2 වන දිනයේ ඔබට ලැබෙන අරමුදල්වලින් 10%ක් සංචිත කර තබා 92 වන දිනයේදී මුදාහැරීම සිදු කෙරෙන බවත්ය. පිරිවැටුම් සංචිත ඉතාමත් සුලබ ආකාරයේ සංචිත කිරීම වේ.
- **අවම සංචිත** කිරීමක් යනු ඔබ විසින් සෑම අවස්ථාවකම තබා ගත යුතු ඔබගේ නිශ්චිත අවම PayPal ශේෂය වේ. අවම සංචිතය එක්කෝ සියල්ල එකවර තැන්පත් කරනු ලබන මුලින් ගෙවන මුදලක් ලෙස ලබා ගන්නා අතර එසේ නැතහොත් අවම සංචිතය ලබා ගන්නා තෙක් අලෙවිවල ප්‍රතිශතයක් ලෙස පිරිවැටුම් පදනමකින් ලබා ගැනෙන අතර, බොහෝ විට එය පිරිවැටුම් සංචිතයක් ලෙස ලබා ගැනේ.

අපගේ අවදානම ඇගයීම වෙනස් වීම හේතුවෙන් අප සංචිතයෙහි නියමයන් වෙනස් කළහොත්, අප නව නියමයන් පිළිබඳව ඔබව දැනුවත් කරමු.

### උසාවි නියෝග, නියාමන අවශ්‍යතා හෝ අනෙකුත් නෛතික ක්‍රියාවලි

අප වෙත ඔබට බලපාන උසාවි නියෝගයක් හෝ වෙනත් නෛතික ක්‍රියාවලියක් (අත්හිටුවීමක් හෝ වෙනත් ඊට සමාන ක්‍රියාවලියක් ඇතුළුව) පිළිබඳව දැනුම් දුනහොත්, එසේ නැතහොත් අදාළ නීතිය හෝ නියාමන අවශ්‍යතා සපුරාලීම පිණිස එසේ කිරීමට අවශ්‍ය බව අපට හැඟේ නම්, අප විසින් යම් යම් ක්‍රියාමාර්ග ගනු ඇති අතර ඊට ඔබේ PayPal ගිණුම සම්බන්ධයෙන් වන සංචිත මත සීමාකිරීමක් පැනවීම, PayPal ගිණුමට/ගිණුමෙන් ගෙවීමට ඇති මුදල් අත්හිටුවීම, හෝ ඔබේ අරමුදල්වලින් මුදාහැරීම ඇතුළත් විය හැකිය. අප විසින් ගත යුත්තේ කුමන ක්‍රියාමාර්ගයද යන්න, අපගේ පරම අභිමතය අනුව, අපි තීරණය කරමු. උසාවි නියෝගයෙන්, අදාළ නීතියෙන්, නියාමන අවශ්‍යතාවයෙන් හෝ අනෙකුත් නෛතික ක්‍රියාවලියෙන් දැනුම් නොදෙන ලෙස නියම කර නොමැති නම් හැර, මෙම ක්‍රියාමාර්ග පිළිබඳව අපි ඔබ වෙත දැනුම් දෙමු. ඔබ හෝ ඔබේ PayPal ගිණුම හා සම්බන්ධ කිසියම් උසාවි නියෝගයක් හෝ නෛතික ක්‍රියාවලියක් සම්බන්ධයෙන් හබ කිරීමට හෝ අභියාචනා කිරීමට අපි බැඳී නොසිටිමු. උසාවි නියෝගයක්, අදාළ නීතියක්, නියාමන අවශ්‍යතාවයක් හේතුවෙන් අප විසින් අත්හිටුවීමක්, සංචිතයක් හෝ සීමා කිරීමක් ක්‍රියාත්මක කළහොත්, අත්හිටුවීම, සංචිතය හෝ සීමා කිරීම PayPal විසින් සාධාරණ ලෙස නියම කරනු ලබන කාලයක් දක්වා බලපවත්වනු ඇත.

# PAYPAL පරිශීලක ගිවිසුම

## අනවසර ගනුදෙනු සඳහා වගකීම

### අවසර නොලත් ගනුදෙනුවලින් ආරක්ෂාව

ඔබේ PayPal ගිණුමේ අනවසර ක්‍රියාකාරකම්වලින් ඔබව ආරක්ෂා කිරීම පිණිස, ඔබ නිරතුරුව ඔබේ PayPal ගිණුමට ලොගින් වී ඔබගේ PayPal ගිණුම් ප්‍රකාශනය සමාලෝචනය කිරීමට කටයුතු කළ යුතුය. ගොනුවෙහි ඇති මූලික ඊමේල් ලිපිනය වෙත ඊමේල් පණිවුඩයක් යැවීමෙන් PayPal විසින් ඔබට එක් එක් ගනුදෙනුව පිළිබඳව දැනුම් දෙනු ඇත. එක් එක් ගනුදෙනුව සඳහා අවසර දී ඇති බවත් නිවැරදිව සම්පූර්ණ කර ඇති බවටත් සහතික කර ගැනීම පිණිස ඔබ විසින් මෙම ගනුදෙනු පිළිබඳ දැනුම්දීම් සමාලෝචනයට ලක් කළ යුතුය.

ඔබේ PayPal ගිණුමේ අනවසර ක්‍රියාකාරකම්වලින් PayPal ඔබව ආරක්ෂා කරනු ඇත. මෙම ආරක්ෂාව අදාළ වන විට, අප සමඟ ඔබ සහයෝගයෙන් කටයුතු කරන තාක් සහ පහතින් විස්තර කර ඇති කාර්ය පටිපාටි අනුගමනය කරන තාක් PayPal විසින් ඔබගේ අනවසර ක්‍රියාකාරීත්වයේ සම්පූර්ණ මුදලම ආවරණය කරනු ලබයි.

**බලය නොලත් ගනුදෙනුවක් යනු කුමක්ද**

"බලය නොලත් ගනුදෙනුවක්" හට ගනුයේ අවසර නොදුන් සහ ඔබට ප්‍රතිලාභයක් නොසැලසෙන ගෙවීමක් ඔබේ PayPal ගිණුමෙන් සිදු කෙරෙන විටය. නිදසුනක් ලෙස, කිසියම් අයෙකු ඔබගේ මුරපදය සොරකම් කර, ඔබේ PayPal ගිණුමට පිවිසීම සඳහා මුරපදය භාවිතා කරන්නේ නම්, සහ ඔබගේ PayPal ගිණුමෙන් ගෙවීමක් යවයි නම්, බලය නොලත් ගනුදෙනුවක් සිදු වී තිබේ.

**බලය නොලත් ගනුදෙනුවක් ලෙස නොසැලකෙන්නේ කුමක්ද**

පහත දැක්වෙන ගනුදෙනු අනවසර ගනුදෙනු ලෙස නොසැලකේ:

- ඔබ විසින් කිසියම් අයෙකුහට PayPal ගිණුමට ප්‍රවේශය ලබා දී ඇත්නම් (ඔබගේ ලොගින් තොරතුරු ලබා දීම මගින්) සහ ඔවුන් විසින් ඔබගේ දැනීම හා අවසරය නොමැතිව ඔබගේ PayPal ගිණුම භාවිතා කරයි නම්. මෙම තත්ත්වය තුළදී සිදු කරන ලද ගනුදෙනු සඳහා ඔබ වගකිව යුතු වේ.
- ආපසු මුදල් ගෙවීම්, ආපසු හැරවීම් සහ නැවත අය කිරීම් යටතේ විස්තර කර ඇති ක්‍රියාමාර්ග හේතුවෙන් ගෙවීමක් වලංගු නොවීම සහ ප්‍රතිවර්තනය.

**බලය නොලත් ගනුදෙනුවක් වාර්තා කිරීම**

පහත දෑ සිදුව ඇති බවට ඔබ විශ්වාස කරන්නේ නම්, ඔබ විසින් වහාම PayPal පාරිභෝගික සේවාව ඇමතීමට කටයුතු කළ යුතුය:

- ඔබේ ගිණුමෙන් බලය නොලත් ගනුදෙනුවක් යවා ඇත්නම්;
- ඔබේ ගිණුම වෙත අනවසර ප්‍රවේශයක් සිදුව ඇත්නම්;
- ඔබගේ PayPal ලොගින් තොරතුරු නැති වී හෝ සොරකම් කර ඇත්නම්; හෝ
- ඔබගේ PayPal ගිණුමට පිවිසීමට ඔබ විසින් භාවිතා කර ඇති කිසියම් උපාංගයක් නැති වී, සොරකම් කර හෝ ක්‍රියා විරහිත වී ඇත්නම්.

කිසියම් අනවසර ගනුදෙනුවක් සහ/හෝ අනිසි ලෙස හෝ අනවසර ලෙස ඔබේ ගිණුම භාවිතා කිරීමක් හා අදාළව ඔබ සතුව තිබෙන සියලු තොරතුරු ඔබ විසින් අප වෙත ලබා දිය යුතු අතර සිදු කරන පරීක්ෂණ සඳහා PayPal වෙත සහාය දැක්වීමට සියලු සාධාරණ පියවර ඔබ විසින් ගත යුතුය.

ගනුදෙනුව සිදු කර දින හැටක් (60ක්) ඇතුළත ඔබ අපහට බලය නොලත් ගනුදෙනුව පිළිබඳව දැනුම් දුනහොත් සහ බලය නොලත් ගනුදෙනුවක් සිදුව ඇති බවට අප සෑහීමට පත් වුවහොත්, බලය නොලත් ගනුදෙනු සඳහා ඔබ 100% ක ආරක්ෂණයකට යෝග්‍ය වේ.

## දෝෂ නිරාකරණය

**දෝෂයක් යනු කුමක්ද**

"දෝෂයක්" යන්නෙන් අදහස් වන්නේ පහත දැක්වෙන දේවල්ය:

- PayPal විසින් හෝ එහි සැපයුම්කරුවන් විසින් ඔබගේ PayPal ගිණුමට වැරදි ලෙස හර හෝ බැර කරන ලද සැකසීමේ දෝෂයක් හෝ, ගනුදෙනුවක් ඔබේ PayPal ගිණුමෙහි වැරදි ලෙස සටහන් වී ඇති අවස්ථාවක්.
- ඔබ විසින් ගෙවීමක් යවන අතර ඔබේ PayPal ගිණුමෙන් වැරදි මුදලක් බැර වී ඇත.
- ඔබගේ PayPal ගිණුම් ප්‍රකාශයෙහි ගනුදෙනුවක් මගහැරී ඇත හෝ නිසි ලෙස හඳුනාගෙන නොමැත.
- ඔබගේ PayPal ගිණුම හා සම්බන්ධව අප විසින් ගණනමය හෝ ගණිතමය දෝෂයක් සිදු කිරීම.

**දෝෂයක් යනුවෙන් නොසැලකෙන්නේ කුමක්ද**

පහත දැක්වෙන දේවල් දෝෂ ලෙස නොසැලකේ:

- ඔබ විසින් කිසියම් අයෙකුහට PayPal ගිණුමට ප්‍රවේශය ලබා දී ඇත්නම් (ඔබගේ ලොගින් තොරතුරු ලබා දීම මඟින්) සහ ඔවුන් විසින් ඔබගේ දැනීම හා අවසරය නොමැතිව ඔබගේ PayPal ගිණුම භාවිතා කරයි නම්. මෙම තත්ත්වය තුළ දී සිදු කරන ලද ගනුදෙනු සඳහා ඔබ වගකිව යුතු වේ.
- ආපසු මුදල් ගෙවීම්, ආපසු හැරවීම් සහ නැවත අය කිරීම් යටතේ විස්තර කර ඇති ක්‍රියාමාර්ග හේතුවෙන් ගෙවීමක් වලංගු නොවීම සහ ප්‍රතිවර්තනය.
- ඔබට වැරදීමකින් වැරදි පාර්ශ්වයක් වෙත ගෙවීමක් යැවීම, හෝ වැරදි මුදලක් සඳහා ගෙවීමක් යැවීම (නිදසුනක් ලෙස, යතුරු ලියන දෝෂයක් මත පදනම්ව). (මෙම අවස්ථාවේදී ඔබ සතු එකම පිහිට වනුයේ ඔබ විසින් ගෙවීම යැවූ පාර්ශ්වය අමතා එම මුදල ආපසු ගෙවන ලෙස ඉල්ලා සිටීමය. ඔබ වැරදීමකින් සිදු කළ ගෙවීම PayPal විසින් ඔබට ප්‍රතිපූරණය කිරීම හෝ ආපසු ගෙන්වීම නොකරයි.)

**ඔබගේ ඉලෙක්ට්‍රොනික මාරුවීම් පිළිබඳ දෝෂ හෝ ප්‍රශ්න තිබේ නම්**

අපගේ නිරාකරණ මධ්‍යස්ථානය වෙතින් අප අමතන්න.

ඔබේ ප්‍රකාශය හෝ කුවිතාන්සිය සාවද්‍යයැයි ඔබ සිතන්නෙහි නම් හෝ ප්‍රකාශයේ හෝ කුවිතාන්සියේ ලැයිස්තුගත කර ඇති මාරුවක් පිළිබඳව වැඩි විස්තර අවශ්‍ය නම් නොපමාව අපට දන්වන්න. ගැටලුව හෝ දෝෂය දර්ශනය වූ පළමු ප්‍රකාශය අප විසින් යවා දින 60 කට නොඅඩු කාලයකදී අපට ඔබෙන් පිළිතුරක් ලැබිය යුතුය. ඔබගේ නම, ඊමේල් ලිපිනය සහ ගිණුම් අංකය (ඇත්නම්) අපට කියන්න.

- ඔබට විශ්වාස නැති දෝෂය හෝ මාරුව විස්තර කරන්න, එය දෝෂයක් යැයි ඔබ විශ්වාස කරන්නේ ඇයිද යන්න හෝ ඔබට තවත් තොරතුරු අවශ්‍ය වන්නේ ඇයිද යන්න පැහැදිලිව විස්තර කරන්න.
- සැක සහිත දෝෂයේ ඩොලර් ප්‍රමාණය අපට පවසන්න.

ඔබ අපට වාචිකව පැවසුවහොත්, වැඩ කරන දින 10ක් ඇතුළත ඔබේ පැමිණිල්ල හෝ ප්‍රශ්නය ලිඛිතව අප වෙත එවීමට අපට අවශ්‍ය විය හැකි ය. සැක සහිත දෝෂය පිළිබඳ ඔබේ දැනුම්දීම ලැබීමෙන් පසු අපි වැඩ කරන දින 10ක් ඇතුළත අපගේ විමර්ශනය සම්පූර්ණ කරන්නෙමු. කෙසේ වෙතත්, අපට වැඩි කාලයක් අවශ්‍ය නම්, ඔබගේ පැමිණිල්ල හෝ ප්‍රශ්නය විමර්ශනය කිරීමට අපට දින 45ක් දක්වා ගතවනු ඇත. අපි මෙය කිරීමට තීරණය කළ හොත්, ඔබ වැරදි යැයි සිතන මුදල අපි ඔබේ PayPal ගිණුමට වැඩ කරන දින 10ක් ඇතුළත බැර කරන්නෙමු, එවිට අපගේ විමර්ශනය සම්පූර්ණ කිරීමට ගත වන කාලය තුළ ඔබට තාවකාලික මුදලක් ලැබෙනු ඇත. බැර කිරීමෙන් වැඩ කරන දින 2ක් තුළ තාවකාලික ණය ගැන අපි ඔබට දන්වන්නෙමු. ඔබේ පැමිණිල්ල හෝ ප්‍රශ්නය ලිඛිතව ඉදිරිපත් කරන ලෙස අපි ඔබෙන් ඉල්ලා සිටියත් එය වැඩ කරන දින 10ක් තුළ අපට නොලැබෙන්නේ නම්, අපි ඔබේ PayPal ගිණුමට තාවකාලිකව බැර නොකරනු ඇත.

නව PayPal ගිණුම්, අලෙවි ස්ථාන ගනුදෙනු හෝ විදේශීය ආරම්භක ගනුදෙනු සම්බන්ධ දෝෂ සඳහා, ඔබගේ පැමිණිල්ල හෝ ප්‍රශ්නය විමර්ශනය කිරීමට අපට දින 90ක් ගතවනු ඇත. අලුත් PayPal ගිණුම් සඳහා (ඔබගේ ගිණුමේ පළමු ගනුදෙනුව ගැන ඔබ අපට දැනුම්දුන් දින සිට වැඩ කරන දින 30කට වඩා අඩු විය), විමර්ශනය සම්පූර්ණ කිරීමට අපට වැඩ කරන දින 20ක් ගතවනු ඇත.

අපගේ විමර්ශනය අවසන් කිරීමෙන් පසු වැඩ කරන දින 3ක් තුළ ප්‍රතිඵල අපි ඔබට කියන්නෙමු. කිසිදු දෝෂයක් නොමැති බව අපි තීරණය කළහොත්, අපගේ තීරණය පිළිබඳ ලිඛිත පැහැදිලි කිරීමක් අපි ඔබට එවන්නෙමු. ඔබට තාවකාලික ණයක් ලැබුනේ නම්, අපි එය ඔබගේ ගිණුමෙන් ඉවත් කර හර කළ දිනය හා ප්‍රමාණය ඔබට දන්වන්නෙමු. අපගේ විමර්ශනයේදී අප භාවිතා කළ ලේඛනවල පිටපත් ඔබට ඉල්ලා සිටිය හැකිය.

දෝෂයක් ඇති බව අපි තීරණය කළහොත්, අපගේ තීරණයෙන් වැඩ කරන දින 1 ක් ඇතුළත සම්පූර්ණ මුදල ඔබගේ ගිණුමට බැර කරන්නෙමු. නැතහොත්, ඔබට දැනටමත් තාවකාලික ණයක් ලැබී ඇත්නම්, එම මුදල් රඳවා ගැනීමට ඔබට අවසර ලැබේ.

**සැකසීමේ දෝෂ**

අප විසින් සොයා ගන්නා ඕනෑම සැකසුම් දෝෂයක් අපි නිවැරදි කරන්නෙමු. දෝෂය මඟින් පහත දේ ඇති වුවහොත්:

- ඔබට ලැබිය යුතු නිවැරදි මුදලට වඩා අඩුවෙන් ඔබට ලැබුණහොත්, එවිට ඔබට ලැබිය යුතු දේ සහ ඔබට සැබවින්ම ලැබුණු දේ අතර වෙනස සඳහා අපි ඔබේ PayPal ගිණුමට බැර කරන්නෙමු.
- ඔබට ලැබිය යුතු නිවැරදි මුදලට වඩා වැඩි ප්‍රමාණයක් ඔබට ලැබුණහොත් එවිට ඔබට සැබවින්ම ලැබුණු දේ සහ ඔබට ලැබිය යුතු දේ අතර වෙනස සඳහා අපි ඔබේ PayPal ගිණුම හර කරන්නෙමු.
- පහත තත්වයන් යටතේ හැර අපි ගනුදෙනුවක් නියමිත වේලාවට හෝ නිවැරදි මුදලකින් සම්පූර්ණ නොකළහොත්, එවිට මෙම අසමත් වීමෙන් ඍජුවම සිදුවන අලාභ හෝ පාඩු සඳහා අපි ඔබට වගකියනු ඇත:
  - අපගේ කිසිදු වරදක් රහිතව, ගනුදෙනුව සම්පූර්ණ කිරීමට ප්‍රමාණවත් අරමුදල් ඔබ සතුව නොතිබුණේ නම්;
  - අපගේ පද්ධතිය නිසියාකාරව ක්‍රියාත්මක නොවී ඔබ ගනුදෙනුව ආරම්භ කරන විට බිඳවැටීම ගැන ඔබ දැන සිටියහොත්; හෝ
  - අපගේ සාධාරණ පූර්වාරක්ෂාවන් නොතකා අපගේ පාලනයෙන් පිටත (ගින්න, ගංවතුර හෝ අන්තර්ජාල සම්බන්ධතාවය නැතිවීම වැනි) අසාමාන්‍ය තත්වයන් නිසා දෝෂය සිදුවූයේ නම්.

සැකසුම් දෝෂ පහත දේ නොවේ:

- PayPal විසින් රඳවා ගැනීම්, සීමා කිරීම් හෝ වෙන්කර තැබීම් අදාළ කිරීමේ ප්‍රතිඵලයක් ලෙස සිදුවන ප්‍රමාදයන්.
- ගෙවීම් සමාලෝචනයක් මත පදනම් වූ ප්‍රමාදයන්.
- සමහර අවස්ථාවන්හිදී මිලදී ගැනීමේ ගනුදෙනුවක් සම්පූර්ණ කිරීමට ගතවන කාලය හා සම්බන්ධ යමක් මිලට ගන්නේ කෙසේද යන්න යටතේ විස්තර කර ඇති ප්‍රමාදයන්.
- ගනුදෙනුවක් කිරීමේදී ඔබ අතින් සිදුවෙන දෝෂ (නිදසුනක් ලෙස, ඔබ යවන මුදලක් වැරදි ලෙස ටයිප් කිරීම).

# PAYPAL පරිශීලක ගිවිසුම

## වෙනත් නීතිමය කොන්දේසි

## ඔබ හා අප අතර සන්නිවේදන

අලෙවිකරණ අරමුණු සඳහා PayPal සහ එහි අනුබද්ධයන් ඊමේල් ම.sන් ඔබව සම්බන්ධ කර ගත හැකි බව ඔබ එකඟ වේ. ඔබ PayPal ගිණුමක් විවෘත කරන විට, ඔබේ ගිණුම් මනාපයන් වෙනස් කිරීමෙන් හෝ අපෙන් ලැබෙන ඕනෑම PayPal ඊමේලයක් හෝ කුවිතාන්සියක ඇති දායකත්වයෙන් ඉවත් වීමේ සබැඳිය ක්ලික් කිරීමෙන් ඔබට අලෙවිකරණ සන්නිවේදනයන් ලැබීමෙන් ඉවත් විය හැකිය. ඉවත්වීම බලාත්මක වීමට කරුණාකර වැඩ කරන දින 10 ක් දක්වා ඉඩ දෙන්න. ඔබ අලෙවිකරණ සන්නිවේදනයන් ලබා ගැනීමෙන් ඉවත් වී සිටියද, ඔබගේ ගිණුම හෝ PayPal සේවාවන් පිළිබඳ සත්‍ය තොරතුරු අපි ලබා දෙන්නෙමු.

ඔබ අප වෙත ඔබේ ජංගම දුරකථන අංකය ලබා දෙන්නේ නම්, PayPal හා එහි අනුබද්ධිත ආයතනවලට පහත අරමුණු සඳහා ස්වයංක්‍රීය ඩයලන හෝ පූර්ව පටිගත කළ පණිවුඩ ඇමතුම් හෝ කෙටි පණිවුඩ භාවිතයෙන් එම අංකය ඔස්සේ ඔබව ඇමතීමට හැකි බවට ඔබ එකඟ වේ: (i) ඔබේ PayPal සේවා පිළිබඳව ඔබ දැනුවත් කිරීමට හා/හෝ ඔබේ PayPal ගිණුම්වලට සේවා කිරීමට, (ii) වංචා පරීක්ෂා කිරීමට හෝ වැළැක්වීමට හෝ (iii) ණය එකතු කර ගැනීමට. ඔබේ පූර්ව කැමැත්ත අපට ලැබෙන්නේ නැත්නම්, අලෙවිකරණ අරමුණු සඳහා ඔබව සම්බන්ධ කර ගැනීමට අපි ස්වයංක්‍රීය හෝ පෙර වාර්තා කළ පණිවිඩ ඇමතුම් හෝ පෙළ භාවිතා නොකරමු. ඉහත ලැයිස්තුගත කර ඇති ක්‍රියාකාරකම් සඳහා අපට සහාය වීමට අප සමඟ ගිවිසුම්වලට එළඹ ඇති සේවා සපයන්නන් සමඟ අපි ඔබේ ජංගම දුරකථන අංකය හුවමාරු කිරීමට ඉඩ ඇති නමුත් ඔබේ කැමැත්ත නොමැතිව ඔබගේ ජංගම දුරකථන අංකය තෙවන පාර්ශවයන් සමඟ ඔවුන්ගේම අරමුණු සඳහා බෙදා නොගනිමු. PayPal විසින් පිරිනමනු ලබන නිෂ්පාදන සහ සේවාවන් භාවිතා කිරීම සහ භුක්ති විඳීම සඳහා ඔබේ ජංගම දුරකථන අංකයට ස්වයං ඩයලනය කළ හෝ පෙර පටිගත කළ පණිවිඩ ඇමතුම් හෝ පෙළ ලැබීමට ඔබ එකඟ විය යුතු නැත. ඊමේල් ගනුදෙනු කුවිතාන්සියක් හරහා, ඔබගේ ගිණුම් සැකසීම් තුළ හෝ [PayPal පාරිභෝගික සේවාව] සම්බන්ධ කර ගැනීම ඇතුළු ක්‍රම කිහිපයකින් ඔබේ ජංගම දුරකථන අංකයට ස්වයං ඩයලනය කළ හෝ පෙර පටිගත කළ පණිවිඩ ඇමතුම් හෝ පෙළ ලැබීම ඔබට ප්‍රතික්ෂේප කළ හැකිය. පණිවිඩවල සංඛ්‍යාතය වෙනස් විය හැකි අතර සම්මත දුරකථන මිනිත්තුව සහ පෙළ ගාස්තු අදාළ විය හැකිය. ප්‍රමාද වූ හෝ ලබා නොදුන් පණිවිඩ සඳහා අප හෝ ඔබගේ දුරකථන වාහකයන් වගකිව යුතු නොවේ. කෙසේ වෙතත්, අපට ඔබ සමග කතා කිරීමට අවශ්‍ය නම් අප වෙනත් ක්‍රම භාවිතයෙන් තවදුරටත් ඔබට ඇමතීමට ඉඩ ඇත.

ඕනෑම PayPal ගිණුමක් හෝ ගනුදෙනු තොරතුරු සහ PayPal සේවාවන් සම්බන්ධව PayPal ඔබ සමග ඉලෙක්ට්‍රොනිකව සන්නිවේදනය කිරීමට ඉඩ ඇත. ඔබගේ මූලික ඊමේල් ලිපිනය යාවත්කාලීනව තබා ගැනීම ඔබේ වගකීම වන අතර එවිට PayPal හට ඔබ සමඟ ඉලෙක්ට්‍රොනිකව සන්නිවේදනය කළ හැකිය. PayPal ඔබට ඉලෙක්ට්‍රොනික් සන්නිවේදනයක් යවන නමුත් ගොනුවේ ඇති ඔබේ මූලික ඊමේල් ලිපිනය වැරදි වීම, යල්පැන තිබීම, ඔබේ සේවා සැපයුම්කරු විසින් අවහිර කර තිබීම හෝ වෙනත් හේතුවක් නිසා ඉලෙක්ට්‍රොනික් සන්නිවේදනයන් ලබා ගැනීමට නොහැකි නම්, PayPal සන්නිවේදනය ඵලදායී ලෙස ඔබට ලබා දී ඇති බව සලකනු ලැබේ.

ඔබගේ ඊමේල් ලිපින පොතේ ලැයිස්තුගත කර නැති යවන්නාගේ ඊමේල් අවහිර කරන හෝ නැවත හරවන අයාචිත තැපැල් පෙරහනක් ඔබ භාවිතා කරන්නේ නම්, ඔබ ඔබේ ඊමේල් ලිපින පොතට PayPal එක් කළ යුතු අතර එවිට අපි ඔබට එවන සන්නිවේදනයන් ඔබට දැකගත හැකි වනු ඇත.

PayPal වෙබ් අඩවියට පිවිසීමෙන් ඔබට ඕනෑම වේලාවක ඔබේ මූලික ඊමේල් ලිපිනය හෝ වීදි ලිපිනය යාවත්කාලීන කළ හැකිය. PayPal විසින් ඔබ වෙත එවන ලද ඉලෙක්ට්‍රොනික් සන්නිවේදනයන් ආපසු එවනු ලබන පරිදි ඔබගේ ඊමේල් ලිපිනය අවලංගු වුවහොත්, PayPal ඔබගේ ගිණුම අක්‍රිය බව සලකනු ඇති අතර, වලංගු, වැඩ කරන මූලික ඊමේල් ලිපිනයක් අපට ලැබෙන තුරු ඔබේ PayPal ගිණුම භාවිතයෙන් කිසිදු ක්‍රියාකාරකමක් කිරීමට ඔබට නොහැකි වනු ඇත.

ඉලෙක්ට්‍රොනික් සන්නිවේදනයන් ලබා ගැනීම සඳහා ඔබේ කැමැත්ත ඉල්ලා අස්කර ගන්නේ නම් ඔබේ ගිණුම වසා දැමීමේ අයිතිය PayPal සතුය.

යම් සන්නිවේදනයක් අප අපේ වෙබ් අඩවියේ පළ කර හෝ ඔබ වෙත ඊමේල් මගින් එවා පැය 24කට පසු විද්‍යුත් මාර්ගයෙන් බෙදා හැරුණේ නම් එය ඔබ වෙත ලැබුණු බව සැලකේ. යම් සන්නිවේදනයක් අප විසින් එවා වැඩ කරන දින 3කට පසු තැපෑලෙන් ඔබට බෙදා හැරුණේ නම් එය ඔබ වෙත ලැබුණු බව සැලකේ.

අප විසින් වෙනත් නිවේදන ලිපිනයක් විශේෂයෙන් දක්වා ඇති කාරණයක් සම්බන්ධයෙන් ඔබ අප සමග සන්නිවේදනයේ යෙදෙන්නේ නම් විනා (උදාහරණ ලෙස, බලය නොලත් ගනුදෙනු සහ වෙනත් දෝෂ සඳහා අපේ වගකීම් ක්‍රියාවලිය), PayPal වෙත වන ලිඛිත නිවේදන තැපෑලෙන් මෙම ලිපිනයට යොමු කළ යුතු යි: PayPal Pte. Ltd., Attention: Legal Department, 5 Temasek Boulevard #09-01, Suntec Tower Five, Singapore 038985.

නීතියෙන් අවසර දී ඇති තාක් දුරට, ඔබ හෝ ඔබ වෙනුවෙන් ක්‍රියා කරන ඕනෑම අයෙකු තත්ත්ව පාලනය සහ පුහුණු අරමුණු සඳහා හෝ අපගේම ආරක්ෂාව සඳහා PayPal හෝ එහි නියෝජිතයන් සමඟ ඇති දුරකථන සංවාද වැඩිදුර දැනුම්දීමකින් හෝ අනතුරු ඇඟවීමකින් තොරව PayPal විසින් අධීක්ෂණය කිරීම හෝ පටිගත කිරීම සිදු කළ හැකි බව ඔබ තේරුම් ගෙන එකඟ වේ. PayPal සමඟ ඔබේ සන්නිවේදනයන් ඔබගේ දැනුවත් බවකින් තොරව ඇසිය හැකි, අධීක්ෂණය කළ හැකි හෝ පටිගත කළ හැකි වුවත්, සියලු දුරකථන මාර්ග හෝ ඇමතුම් PayPal විසින් පටිගත නොකරනු ඇති බව ඔබ පිළිගෙන ඇති අතර, කිසියම් විශේෂිත දුරකථන ඇමතුම්වල පටිගත කිරීම් රඳවා තබා ගැනීමට හෝ ලබා ගත හැකි බවට PayPal සහතික නොවේ.

## PayPal හි අයිතීන්

### PayPal අත්හිටුවීම සහ අවසන් කිරීමේ අයිතිවාසිකම්

PayPal හට, එහි අභිමතය පරිදි, මෙම පරිශීලක ගිවිසුම අත්හිටුවීමට හෝ අවසන් කිරීමට, අප විසින් හෝ අප වෙනුවෙන් යමෙක් විසින් ක්‍රියා කරවන වෙබ් අඩවි, මෘදුකාංග, පද්ධති (ඕනෑම PayPal සේවාවක් සැපයීමට භාවිතා කරන ඕනෑම ජාල සහ සේවාදායකයන් ඇතුළුව සියලුම හෝ සමහර PayPal සේවාවන් වෙත පිවිසීමට හෝ භාවිතා කිරීමට හෝ ඕනෑම හේතුවක් නිසා සහ ඕනෑම වේලාවක ඔබ වෙත දැනුම් දීමෙන් මෙම පරිශීලක ගිවිසුම අවසන් වූ පසු, ඔබේ PayPal ශේෂයේ රඳවාගෙන ඇති සීමා නොකළ අරමුදල් කිසිවක් ඔබට ගෙවීම සඳහා අයිතිය ඇත.

#### ආරක්ෂණ බැඳියාව

මෙම පරිශීලක ගිවිසුම යටතේ ඔබගේ වගකීම් ඉටුකිරීමේ ආරක්ෂණයක් ලෙස, ඔබ PayPal සන්තකයේ ඇති ඔබේ PayPal ශේෂය පිළිබඳ වගකීමක් සහ ආරක්ෂණ බැඳියාවක් PayPal විසින් ලබා දෙයි.

**PayPal වෙත ගෙවිය යුතු මුදල්**

ඔබගේ PayPal ශේෂය කිසියම් හේතුවක් නිසා සෘණ බවට පත් වුවහොත්, එම සෘණාත්මක PayPal ශේෂය නියෝජනය කරන්නේ ඔබ PayPal වෙත ගෙවිය යුතු මුදලකි. PayPal විසින් ඔබ විසින් හෝ ඔබට ලැබෙන ගෙවීම් වලින් ඔබගේ PayPal ගිණුමට එකතු කරන ලද අරමුදල් වලින් හිලවු කළ හැකිය. ඔබට එක් PayPal ගිණුමකට වඩා තිබේ නම්, ඔබගේ අනෙක් PayPal ගිණුමේ (ගිණුම්වල) PayPal ශේෂයට අපි එක් PayPal ගිණුමකින් සෘණ PayPal ශේෂයක් හිලව් කළ හැකිය. සෘණ ශේෂයක් ඇති විටදී ඔබ ඔබේ PayPal ගිණුම දිගටම භාවිතා කරන්නේ නම්, යම් හර කිරීමක් හෝ ගනුදෙනුවක් සිදු කිරීමට පෙර ඔබට දැනුම් දී ඔබගේ ගිණුමෙන් යවන ඕනෑම ගනුදෙනුවක් හෝ හර කිරීමක් සමඟ සෘණ ශේෂයක් ඒකාබද්ධ කිරීමට ඔබ PayPal හට බලය පවරයි.

ඔබ විවිධ මුදල් වලින් PayPal ගිණුමක අරමුදල් රඳවාගෙන සිටී නම් සහ එක් මුදල් වර්ගයක ශේෂය කිසියම් හේතුවක් නිසා සෘණාත්මක වන්නේ නම්, ඔබ වෙනත් මුදල් වර්ගයකින් පවත්වාගෙන යන අරමුදල් භාවිතා කරමින් PayPal විසින් සෘණ PayPal ශේෂය හිලව් කරනු ලැබිය හැක. ඔබට දින 21ක් හෝ ඊට වැඩි කාලයක් අදාළ නොවන මුදල් වර්ගයක සෘණ ශේෂයක් තිබේ නම්, PayPal විසින් මෙම සෘණ ශේෂය අදාළ මුදල් වර්ගයට පරිවර්තනය කරනු ඇත. අවස්ථා දෙකේදීම, ව්‍යවහාර මුදල් පරිවර්තනයක් අවශ්‍ය වනු ඇති අතර, PayPalහි ගනුදෙනු විනිමය අනුපාතිකය (අපගේ මුදල් පරිවර්තන ගාස්තුව ද ඇතුළුව) භාවිතා කරනු ඇත.

ඉහත කරුණු වලට අමතරව, ඔබට PayPal, අපගේ අනුබද්ධ සමාගම් හෝ eBay වෙත ගෙවිය යුතු ප්‍රමාද වූ ගාස්තුවක් තිබේ නම්, PayPal විසින් ඔබගේ PayPal ගිණුමට හර කළ යුතුය. Xoom හෝ Braintree වැනි අපගේ විවිධ නිෂ්පාදන භාවිතා කිරීමෙන් ගෙවිය යුතු මුදල් මෙයට ඇතුළත් වේ.

**බංකොලොත්භාවය පිළිබඳ නඩු කටයුතු**

කිසියම් බංකොලොත්භාවය හෝ බංකොලොත් නීතියක යම් විධිවිධානයක් යටතේ ඔබ විසින් හෝ විපක්ෂව යම් නඩු කටයුත්තක් ආරම්භ කර ඇත්නම්, මෙම පරිශීලක ගිවිසුම බලාත්මක කිරීම සම්බන්ධයෙන් දරනු ලබන සියලු සාධාරණ වියදම් හෝ වියදම් (සාධාරණ නෛතික ගාස්තු සහ වියදම් ඇතුළුව) අය කර ගැනීමට අපට අයිතියක් ඇත.

**අයිතීන් උපකල්පනය කිරීම**

ඔබ ලබන්නෙකුට කළ ගෙවීමක් PayPal විසින් අවලංගු කර ආපසු හරවන්නේ නම් (ඔබේ මුලපිරීමේදී හෝ වෙනත් ආකාරයකින්), PayPal හි අභිමතය පරිදි ගෙවීම් සම්බන්ධ ලබන්නාට සහ තෙවන පාර්ශවයන්ට PayPal ඔබේ අයිතිවාසිකම් උපකල්පනය කරන බවට ඔබ එකඟ වන අතර එම අයිතිවාසිකම් සෘජුව හෝ ඔබ වෙනුවෙන් අනුගමනය කළ හැකිය.

**අතහැර දැමීමක් නැත**

ඔබ හෝ වෙනත් අය විසින් මෙම පරිශීලක ගිවිසුම යටතේ ඔබගේ කිසිදු බැඳීමක් උල්ලංඝනය කිරීමක් සම්බන්ධයෙන් කටයුතු කිරීමට අපි අපොහොසත් වීම පසුකාලීන හෝ ඒ හා සමාන උල්ලංඝනයන් සම්බන්ධයෙන් කටයුතු කිරීමට අපට ඇති අයිතිය අත්හරින්නේ නැත.

**හානි පූරණය සහ වගකීම්වලට වන සීමා**

මෙම කොටසේදී, අපි PayPal Pte. Ltd. සමාගම සහ අපගේ අනුබද්ධ සමාගම් සහ ඔවුන්ගේ එක් එක් අධ්‍යක්ෂවරුන්, නිලධාරීන්, සේවකයින්, නියෝජිතයින්, හවුල් ව්‍යාපාර, සේවා සපයන්නන් සහ සැපයුම්කරුවන් සම්බන්ධව සඳහන් කිරීම සඳහා "PayPal" යන යෙදුම භාවිතා කරමු. අපගේ අනුබද්ධයන්ට අප පාලනය කරන, අපව පාලනය කරනු ලබන හෝ අප සමඟ පොදු පාලනය යටතේ පවතින සෑම ආයතනයක්ම ඇතුළත් වේ.

**වන්දි ගෙවීම**

ඔබගේ PayPal ගිණුම හා ඔබ PayPal සේවාවන් භාවිතා කිරීම සම්බන්ධ ක්‍රියා සඳහා ඔබ PayPal වෙත ඔබ මුක්තිදානය ලබා දිය යුතුය. මෙම පරිශීලක ගිවිසුම උල්ලංඝනය කිරීම, ඔබ විසින් PayPal සේවාවන් නොමනා ලෙස භාවිතය හේතුවෙන් යම් තෙවන පාර්ශ්වයක අයිතියක් හෝ නීතියක් ඔබ විසින් උල්ලංඝනය වීම සහ/හෝ ඔබ විසින් ඔබගේ PayPal ගිණුම භාවිතා කිරීමට හෝ අප විසින් හෝ අප වෙනුවෙන් ක්‍රියාත්මක කෙරෙන අපගේ වෙබ් අඩවි, මෘදුකාංග, පද්ධති වෙත පිවිසීමට (PayPal සේවාවන් සැපයීමට භාවිතා කළ ඕනෑම ජාලයක් හෝ සර්වරයක්ද ඇතුළුව) හෝ ඔබ වෙනුවෙන් PayPal සේවාවන් භාවිතා කිරීමට ඔබ විසින් අවසරය ලබා දුන් තෙවන පාර්ශ්වයක ක්‍රියාකාරීත්වය හෝ අක්‍රිය බව විසින් හානියක් සිදුවූ කිසියම් තෙවන පාර්ශ්වයක් වෙත හෝ විසින් සිදු කෙරෙනෙ හිමිකම් පෑමක් හෝ ඉල්ලීමක් (සාධාරණ නීති ගාස්තුද ඇතුළුව) සම්බන්ධව PayPal ආරක්ෂා කිරීමට, මුක්තිදානය ලබාදීමට සහ හානි විරහිතව තැබීමට ඔබ එකඟ වේ.

**වගකීම් සීමා කිරීම**

**ඔබගේ PayPal ගිණුම සහ ඔබ PayPal සේවාවන් භාවිතා කිරීම සම්බන්ධයෙන් PayPal හි වගකීම සීමා වේ.** නීතියෙන් තහනම් කර නොමැති නම් හෝ එසේ ඇති තාක් දුරට අප විසින් හෝ අප වෙනුවෙන් ක්‍රියාකෙරෙන වෙබ් අඩවි, මෘදුකාංග, පද්ධති (PayPal සේවාවන් සැපයීමට භාවිතා කළ ඕනෑම ජාලයක් හෝ සර්වරයක්ද ඇතුළුව), ඕනෑම PayPal සේවාවක්, හෝ මෙම පරිශීලක ගිවිසුම සම්බන්ධව ඇතිවෙන හෝ ඊට සම්බන්ධව පැන නගින (දත්ත නැතිවීම හෝ ව්‍යාපාර නැතිවීම ඇතුළුව එහෙත් ඒවාට සීමා නොවී) නැතිවූ ලාභ හෝ කිසියම් විශේෂ, ආනුෂංගික හෝ ප්‍රතිවිපාක හානියක් සම්බන්ධව PayPal වග කියනු නොලබයි.

ඕනෑම අවස්ථාවක ඔබට හෝ ඕනෑම තෙවන පාර්ශවයකට අපගේ වගකීම සත්‍ය සෘජු හානියේ ප්‍රමාණයට සීමා වේ. ඊට අමතරව, අදාළ නීතියෙන් අවසර දී ඇති ප්‍රමාණයට, පහත දේවලින් සෘජුව හෝ වක්‍රව ඇතිවන කිසියම් හානියක් හෝ අලාභයක් සඳහා (මුදල්, හොඳහිත, හෝ කීර්තිය, ලාභය අහිමිවීම හෝ වෙනත් විශේෂ,වක්‍ර හෝ ආනුෂාංගික හානි ඇතුළු එහෙත් ඒවාට පමණක් සීමා නොවී) PayPal වගකිව යුතු නැති අතර, ඔබ PayPal වගකිවයුතු නොකිරීමට එකඟ වේ: (1) අපගේ වෙබ් අඩවි, මෘදුකාංග, අප විසින් හෝ අප වෙනුවෙන් ක්‍රියාත්මක වන පද්ධති (ඕනෑම PayPal සේවාවක් සැපයීමට භාවිතා කරන ඕනෑම ජාල සහ සර්වරයන් ඇතුළුව) හෝ ඕනෑම PayPal සේවාවන් භාවිතා කිරීම හෝ භාවිතා කිරීමට ඔබට ඇති නොහැකියාව; (2) අපගේ වෙබ් අඩවි, මෘදුකාංග, අප විසින් හෝ අප වෙනුවෙන් ක්‍රියාත්මක වන පද්ධතිවල සහ ඕනෑම PayPal සේවාවන්ගේ ප්‍රමාදයන් හෝ කඩාකප්පල් කිරීම් (ඕනෑම PayPal සේවාවක් සැපයීමට භාවිතා කරන ඕනෑම ජාල සහ සේවාදායකයන් ඇතුළුව); (3) අපගේ වෙබ් අඩවි, මෘදුකාංග, අප විසින් හෝ අප වෙනුවෙන් ක්‍රියාත්මක වන පද්ධති (ඕනෑම PayPal සේවාවක් සැපයීමට භාවිතා කරන ඕනෑම ජාල සහ සේවාදායකයන් ඇතුළුව), ඕනෑම PayPal සේවාවන් හෝ ඕනෑම වෙබ් අඩවියකට හෝ අපගේ වෙබ් අඩවි වලට සම්බන්ධ සේවාව වෙත පිවිසීමේදී ලැබෙන වෛරස හෝ වෙනත් හානිකර මෘදුකාංග; (4) අපගේ වෙබ් අඩවි, මෘදුකාංග, අප විසින් හෝ අප වෙනුවෙන් ක්‍රියාත්මක වන පද්ධති (ඕනෑම PayPal සේවාවක් සැපයීමට භාවිතා කරන ඕනෑම

ජාල සහ සේවාදායකයන් ඇතුළුව), ඕනෑම PayPal සේවාවක්, හෝ ඔවුන්ගෙන් ලබාගත් තොරතුරු සහ ග්‍රැෆික්ස් තුළ ඇතිවන දෝෂ හෝ ක්‍රියා විරහිත වීම්, වැරදි; (5) තෙවන පාර්ශවයන්ගේ අන්තර්ගතය, ක්‍රියා විරහිත බව හෝ ක්‍රියාකාරීත්වය; (6) ඔබගේ PayPal ගිණුමට අදාළව අත්හිටුවීමක් හෝ වෙනත් ක්‍රියාමාර්ගයක් ගැනීම; හෝ (7) මෙම පරිශීලක ගිවිසුමේ හෝ PayPal හි ප්‍රතිපත්තිවල වෙනස්වීම්වල ප්‍රතිඵලයක් ලෙස ඔබේ භාවිතයන්, අන්තර්ගතයන් හෝ හැසිරීම් වෙනස් කිරීමට හෝ ව්‍යාපාර කිරීමට ඔබට ඇති නොහැකියාව හෝ නැතිවීම.

## වගකීම් සහතික වියාචනය සහ මුදා හැරීම

### වගකීමක් නැත

**PayPal සේවාවන් සපයනු ලබන්නේ "පවතින ආකාරයට" සහ ප්‍රකාශිත, ව්‍යංග හෝ ව්‍යවස්ථාපිත වුවත් කිසිඳු නියෝජනයක් හෝ වගකීමක් නොමැතිවයි. PayPal විසින් නිශ්චිතවම හිමිකම්, වෙළඳාමේ හැකියාව, විශේෂිත කටයුත්තක් සඳහා යෝග්‍යතාවය සහ උල්ලංඝනය නොකිරීම යන වගකීම් වියාචනය කරයි.**

ගෙවීම් ක්‍රමයක් ලෙස PayPal පිළිගන්නා අලෙවිකරුවන් විසින් සපයනු ලබන නිෂ්පාදන හෝ සේවාවන් කෙරෙහි PayPal ට කිසිඳු පාලනයක් නොමැති අතර, ඔබ ගනුදෙනු කරන ගැණුම්කරුවෙකු හෝ විකුණුම්කරුවෙකු ඇත්ත වශයෙන්ම ගනුදෙනුව සම්පූර්ණ කරන බවට හෝ එසේ කිරීමට බලය ඇති බවට PayPal ට සහතික විය නොහැක. PayPal සේවාවන්හි ඕනෑම කොටසකට අඛණ්ඩ, අවිච්ඡින්න හෝ ආරක්ෂිත ප්‍රවේශයක් PayPal විසින් සහතික නොකරන අතර, අප විසින් හෝ අප වෙනුවෙන් ක්‍රියාත්මක වන අපගේ වෙබ් අඩවි, මෘදුකාංග හෝ පද්ධතිවල ක්‍රියාකාරිත්වය (ඕනෑම PayPal සේවාවක් සැපයීමට භාවිතා කරන ඕනෑම ජාල සහ සේවාදායකයන් ඇතුළුව) අපගේ පාලනයෙන් බැහැර බොහෝ සාධක වලට බාධා ඇති විය හැකිය. PayPal සේවාවන් අපගේ පාලනයෙන් බැහැර බැංකු පද්ධතියේ ප්‍රමාදයන් හෝ තැපැල් සේවය වැනි බොහෝ සාධක මත රඳා පවතින් බැවින් බැංකු ගිණුම්, හර පත්, ණයපත් සහ චෙක්පත් නිකුත් කිරීම් සම්බන්ධ ඉලෙක්ට්‍රොනික් හර සහ බැර සඳහා වන ඉල්ලීම් කාලෝචිත ආකාරයකින් ක්‍රියාවට නැංවීම සහතික කිරීම සඳහා PayPal සාධාරණ උත්සාහයක් ගනු ඇති නමුත් PayPal විසින් සැකසුම් සම්පූර්ණ කිරීමට ගතවන කාලය පිළිබඳව කිසිඳු නිරූපණයක් හෝ වගකීමක් ලබා නොදේ. මෙම ඡේදය මඟින් ඔබට නිශ්චිත නෛතික අයිතිවාසිකම් ලබා දෙන අතර රට/කලාපයෙන් රට/කලාපය අනුව වෙනස් වන වෙනත් නීතිමය අයිතිවාසිකම් ද ඔබට තිබිය හැකිය.

### PayPal නිදහස් කිරීම

ඔබට වෙනත් PayPal ගිණුම් හිමිකරුවෙකු සමග මතභේදයක් තිබේ නම්, එම මතභේද වලින් හෝ ඊට සම්බන්ධ ඕනෑම ආකාරයකින් ඇතිවන, ඔබ දන්නා සහ නොදන්නා, ඕනෑම ආකාරයක සහ ස්වභාවයේ ඕනෑම ආකාරයක සහ සියලු හිමිකම්, ඉල්ලීම් සහ හානිවලින් (සත්‍ය හා ප්‍රතිවිපාක) PayPal නිදහස් කරයි. මෙම නිදහස් කිරීමට ඇතුල්වීමේදී, ඔබ මෙම නිදහස් කිරීමට එකඟ වන අවස්ථාවේ දී ඔබ දැන සිටි හෝ ඔබට වාසිදායක යැයි සැක කළ හැකි හිමිකම් පමණක් ඇතුළත් කිරීම සඳහා මෙම නිදහස් කිරීම ආවරණය කිරීම සීමා කරන ඕනෑම ආරක්ෂාවක් ඔබ අතහැර දමයි.

## PayPal සමග ආරවුල්

### පළමුව PayPal අමතන්න

ඔබ සහ PayPal අතර මතභේදයක් ඇති වුවහොත්, ගැනුම්කරුවෙකු හෝ අලෙවිකරුවෙකු ලෙස ක්‍රියා කරන්නේ නම්, අපගේ අරමුණ වන්නේ ඔබේ ගැටළු පිළිබඳව ඉගෙන ගෙන ඒවාට විසඳුම් ලබා දීමයි. ඔබගේ තෘප්තියට අපට එය කළ නොහැකි නම්, මතභේදය ඉක්මනින් විසඳීම සඳහා මධ්‍යස්ථ හා ලාභදායී මාධ්‍යයක් ඔබට ලබා දීමට අපි අපේක්ෂා කරමු. සේවාවන් සම්බන්ධයෙන් ඔබ සහ PayPal අතර ආරවුල් [PayPal පාරිභෝගික සේවයට] වාර්තා කළ හැකිය.

**බේරුම්කරණය**

$10,000 USD ට වඩා අඩු (හෝ වෙනත් සමාන මුදලක්) ඕනෑම හිමිකම් පෑමක් සඳහා (තහනම් නියෝග හෝ වෙනත් සමාන සහන සඳහා වන හිමිකම් හැර), පෙනී නොසිටීම මත පදනම් වූ බේරුම්කරණය හරහා බැඳීමෙන් මතභේදය ඵලදායී ලෙස විසඳීමට ඔබට තෝරා ගත හැකිය. ඔබ බේරුම්කරණය තෝරා ගන්නේ නම්, ඔබ සහ අප විසින් අන්‍යෝන්‍ය වශයෙන් එකඟ වූ ස්ථාපිත විකල්ප මතභේද විසඳීමේ ("ADR") සැපයුම්කරුවෙකු හරහා ඔබ එම බේරුම්කරණය ආරම්භ කරනු ඇත. ADR සපයන්නා සහ පාර්ශවයන් පහත සඳහන් නීතිවලට අනුකූල විය යුතුය: (a) බේරුම්කරණය ඔබ තෝරා ගන්නා යම් නිශ්චිත ලෙසකට දුරකථන මගින්, මාර්ගගතව සහ/හෝ තනිකරම ලිඛිත ඉදිරිපත් කිරීම් මත පදනම් විය යුතුය; (b) පාර්ශ්වයන් විසින් අන්‍යෝන්‍ය වශයෙන් එකඟ නොවන්නේ නම් බේරුම්කරණයට පාර්ශවකරුවන් හෝ සාක්ෂිකරුවන් විසින් පෞද්ගලිකව පෙනී නොසිටිනු ඇත; සහ (c) බේරුම්කරු විසින් පිරිනමනු ලබන සම්මානය පිළිබඳ ඕනෑම තීන්දුවක් ඕනෑම අධිකරණ බල ප්‍රදේශයකට ඇතුළත් කළ හැකිය.

## බුද්ධිමය දේපළ

### PayPal හි වෙළෙඳ ලකුණු

"PayPal.com,", "PayPal" හා PayPal සේවාවට අදාළ සියලු ලාංඡන PayPal හෝ PayPal හි බලපත්‍රදායකයන්ගේ වෙළෙඳ ලකුණු හෝ ලියාපදිංචි වෙළෙඳ ලකුණු වේ. PayPal හි පූර්ව අනුමැතියකින් තොරව ඒවා පිටපත් කිරීමට, අනුකරණය කිරීමට, විකරණය හෝ භාවිතා කිරීම ඔබ විසින් නොකළ යුතුය. ඊට අමතරව, සියලු පිටු ශීර්ෂ, අභිමත චිත්‍රණ, බොත්තම් නිරූපක හා පිටපත් PayPal හි සේවා ලකුණු, වෙළෙඳ ලකුණු හා/හෝ වෙළෙඳ ආවරණ වේ. අපගේ පූර්ව ලිඛිත අනුමැතියකින් තොරව ඔබ ඒවා පිටපත් කිරීම, අනුකරණය කිරීම, විකරණය හෝ භාවිතා කිරීම නොකළ යුතුය. PayPal සේවා වෙත වෙබ් තදබදය මාර්ගනය කිරීම සඳහා PayPal විසින් සපයා ඇති HTML ලාංඡන භාවිතා කිරීමට ඔබට හැකිය. ඔබ මෙම HTML ලාංඡන කිනම් හෝ ආකාරයකින් මදක් වෙනස් කිරීමට, විකරණය කිරීමට හෝ වෙනස් කිරීමට හෝ PayPal හෝ PayPal සේවා වැරදි ලෙස විශේෂණය කරන ආකාරයකින් භාවිතා කිරීමට හෝ PayPalහි අනුග්‍රාහකත්වය හෝ පිටසන හැඟවෙන කවර හෝ ආකාරයකින් ඒවා ප්‍රදර්ශනය නොකළ යුතුය. PayPal වෙබ් අඩවි, ඒවායේ ඇති කිනම් හෝ අන්තර්ගතයක්, PayPal සේවා, PayPal සේවාවලට අදාළ තාක්ෂණය සහ උක්ත කවරකින් හෝ තැනූ හෝ ව්‍යුත්පන්න කරන ලද සෑම සියලු තාක්ෂණයන් හා කිනම් හෝ අන්තර්ගතයන් PayPal හි හා එහි බලපත්‍රදායකයන්ගේ අනන්‍ය දේපළ වන්නේය.

**බලපත්‍ර ප්‍රදාන, සාමාන්‍යයෙන්**

ඔබ විසින් වෙබ් හෝ ජංගම වේදිකාවක් හරහා බාගෙන හෝ වෙනත් ආකාරයකින් පිවිසී ඇති, අපගේ සේවා සපයන්නන්ගේ මෘදුකාංග, පද්ධති හෝ සේවා විසින් සපයන ලද හෝ අන්තර්ගත කර ඇති මෘදුකාංග ඇතුළත් API එකක්, සංවර්ධකයාගේ මෙවලම් කට්ටලයක් හෝ වෙනත් මෘදුකාංග යෙදුමක් වැනි PayPal මෘදුකාංගය භාවිතා කරන්නේ නම්, එවිට එම මෘදුකාංගයට අදාළ

ලේඛනවලට අනුව PayPal හි මෘදුකාංගයට පිවිසීමට සහ/හෝ භාවිතා කිරීමට PayPal විසින් ඔබට ආපසු කැඳවිය හැකි, බහිෂ්කාර නොවන, උප බලපත්‍ර දිය නොහැකි, පැවරිය නොහැකි, කතු හිමිකම් රහිත සීමිත බලපත්‍රයක් ප්‍රදානය කරයි. මෙම බලපත්‍ර ප්‍රදානය මෘදුකාංගයට හා සියලු යාවත්කාලීන, උත්ශ්‍රේණිගත කිරීම්, නව අනුවාද හා ආදේශ මෘදුකාංගවලට අදාළ වේ. ඔබ විසින් මෘදුකාංගයට ඇති ඔබේ අයිතීන් තෙවැනි පාර්ශ්වයක් වෙත කුලියට හෝ බද්දට දීම හෝ වෙනත් ආකාරයකින් මාරු කිරීම නොකළ යුතුය. ඔබ PayPal සේවාවලට අදාළ සියලු ලියකියවිලිවල ඇතුළත් ක්‍රියාත්මක කිරීමේ, ප්‍රවේශ වීමේ හා භාවිතා කිරීමේ අවශ්‍යතාවලට අනුකූලතාව දැක්විය යුතුය. ඔබ ක්‍රියාත්මක කිරීමේ, ප්‍රවේශ වීමේ හා භාවිතා කිරීමේ අවශ්‍යතාවලට අනුකූලතාව නොදක්වයි නම් ඔබ, PayPal සහ තෙවන පාර්ශ්ව විසින් දරන්නට යෙදෙන සියලු ආනුෂංගික විපාකවලට ඔබ විසින් වග කිව යුතු වේ. PayPal විසින් ඔබට නිවේදනයක් නිකුත් කර කිනම් හෝ මෘදුකාංගයක් යාවත්කාලීන කිරීම හෝ නැවැත්වීම කළ හැකිය. PayPal (1) එහි මෘදුකාංග ද ඇතුළත්ව යම් යම් තෙවැනි පාර්ශ්වීය ද්‍රව්‍ය හා තාක්ෂණයන් කවර වෙබයක් හෝ වෙනත් යෙදුමකට ඒකාබද්ධ කර තිබීමට සහ/හෝ (2) ඔබට PayPal සේවා සැපයීම සඳහා අවශ්‍ය ඔබ වෙත අවසර ලබා දී නොමැති හෝ වෙනත් ආකාරයකින් එවැනි තෙවැනි පාර්ශ්වයන් තුළ හෝ ඒ වෙත කිසිදු අයිතියක් රඳවාගෙන නොමැති තෙවැනි පාර්ශ්වීය ද්‍රව්‍ය හා තාක්ෂණයන් වෙත ප්‍රවේශ වී ඒවා භාවිතා කරනු ලැබ තිබීමට ඉඩ ඇත. මෘදුකාංගය හෝ කවර හෝ තෙවැනි පාර්ශ්වීය ද්‍රව්‍යයන් හෝ තාක්ෂණයන් වෙතින් ව්‍යුත්පන්න කළ කවර හෝ මූල කේතයක් විකරණය, වෙනස් කිරීම, අපවේශනය, අලුත්වැඩියා කිරීම, පිටපත් කිරීම, ප්‍රතිනිෂ්පාදනය, අනුගත කිරීම, බෙදා හැරීම, සංදර්ශනය, ප්‍රසිද්ධ කිරීම, ප්‍රතිලෝම නිර්මාණය, පරිවර්තනය, වෙන් කිරීම, විසංයුක්ත කිරීම හෝ වෙනත් ආකාරයකින් නිර්මාණය කිරීමට තැත් කිරීම හෝ කවර හෝ මෘදුකාංග හෝ තෙවැනි පාර්ශ්වීය ද්‍රව්‍ය හෝ තාක්ෂණයන් වෙතින් වෙනත් ආකාරයකින් ව්‍යුත්පන්න කෘති නිර්මාණය කිරීමෙන් වැළකීමට ඔබ එකඟ වෙයි. PayPal හි මෘදුකාංග වෙත සියලු අයිතීන්, හිමිකම හා ලැදියාව PayPal සතු වන බව ද ඊට ඒකාබද්ධ කරන ලද කිනම් හෝ තෙවැනි පාර්ශ්වීය ද්‍රව්‍යයන් PayPalහි තෙවැනි පාර්ශ්වීය සේවා සම්පාදකයින් සතු බව ද ඔබ පිළිගනී. ඔබ විසින් PayPal වෙබ් අඩවි මත භාවිතා කරන කිනම් හෝ තෙවැනි පාර්ශ්වීය මෘදුකාංග යෙදුමක් ඔබට මෙම මෘදුකාංගය සපයන තෙවැනි පාර්ශ්වය සමග ඔබ එකඟ වූ බලපත්‍රයට යටත් වේ. ඔබ විසින් අපගේ වෙබ් අඩවි, මෘදුකාංග මත හා/හෝ PayPal සේවා හා සම්බන්ධව භාවිතා කිරීමට තෝරා ගන්නා එබඳු තෙවැනි පාර්ශ්වීය යෙදුම්වල අයිතියක් හෝ පාලනයක් හෝ ඒවා පිළිබඳව යම් වගකීමක් හෝ බැඳීමක් ද PayPal වෙත නැති බව ඔබ පිළිගනී. ඔබ PayPal වෙබ් අඩවිය මත හෝ PayPal විසින් හෝ වෙනත් තෙවැනි පාර්ශ්වයකින් සත්කාරකත්වයේ යෙදෙන වෙනත් මණ්ඩපයක PayPal සේවා භාවිතා කරන්නේ නම් හා PayPal හි මෘදුකාංගය බාගන්නේ නැතිනම් හෝ PayPal වෙබ් අඩවිය මත ඇති තෙවැනි පාර්ශ්වීය මෘදුකාංග යෙදුම් භාවිතා කරන්නේ නැතිනම්, මෙම වගන්තිය ඔබේ සත්කාරක PayPal සේවා භාවිතයට අදාළ නොවේ.

**ඔබ විසින් PayPal වෙත ප්‍රදානය කළ බලපත්‍රය; බුද්ධිමය දේපළ වගකීම් සහතික**

ඔබ විසින් PayPal වෙත සපයන, උඩුගත කරන, ඉදිරිපත් කරන හෝ යවන අන්තර්ගතයන්ගේ හිමිකාරීත්වයට PayPal හිමිකම් නොකියයි. ඔබේ අන්තර්ගතයන්ට අදාළ ගෙවීම් සේවා සැපයීම සඳහා PayPal සේවා භාවිතා කරන තෙවැනි පාර්ශ්වීය වෙබ් අඩවි හෝ යෙදුම් මත ඔබ සත්කාරකත්වයේ යෙදෙන අන්තර්ගතයේ හිමිකාරීත්වය PayPal හිමිකම් නොකියයි. ඊළඟ ඡේදයට යටත්ව, ඔබ PayPal වෙත අන්තර්ගතය සපයන විට හෝ PayPal සේවා භාවිතයෙන් අන්තර්ගත පළ කරන විට, ඔබ අපට ඔබේ අන්තර්ගතය හා ආශ්‍රිත බුද්ධිමය දේපළ හා දැන් හෝ අනාගතයේ දන්නා කිනම් හෝ මාධ්‍යයක ප්‍රසිද්ධ කිරීමේ හිමිකම් (හා ඒ සමග වැඩ කරන පාර්ශ්වයන් වෙත භාවිතා කිරීම සඳහා) අපගේ වත්මන් සේවා වැඩි දියුණු කිරීමට ක්‍රියාත්මක කිරීමට හා ප්‍රවර්ධනය කිරීමට සහ නව ඒවා සංවර්ධනය කිරීමට උපකාර කිරීමට, PayPal වෙත

අනන්‍ය නොවූ, ආපසු කැඳවිය නොහැකි, ප්‍රකාශන හිමිකම රහිත, මාරු කළ හැකි හා ලෝකව්‍යාප්ත බලපත්‍රයක් ලබා දෙයි. PayPal ඔබේ කිනම් හෝ අන්තර්ගතයක් සඳහා ඔබට ප්‍රතිපූරණය කිරීමක් ලබා නොදෙයි. PayPal හි ඔබේ අන්තර්ගතයේ භාවිතය කිනම් හෝ බුද්ධිමය දේපළ හෝ ප්‍රසිද්ධ කිරීමේ අයිති උල්ලංඝනය නොකරන බවට ඔබ පිළිගනී. තවදුරටත්, ඔබ සපයන සියලු අන්තර්ගතවල අයිතීන් ඔබ සතු වන බව හෝ වෙන යම් ආකාරයකින් ඔබ විසින් පාලනය කරන බව ඔබ විසින් පිළිගෙන සහතික වන අතර ඔබ ඔබේ සදාචාර අයිතිවාසිකම් අත් හැරීමට හා PayPal ට එරෙහිව එබඳු හිමිකම් භාවිතා නොකිරීමට පොරොන්දු වෙයි. ඔබ විසින් පහත කිසිවකින් කිනම් හෝ බුද්ධිමය දේපළක් හෝ ප්‍රසිද්ධිය පිළිබඳ අයිතියක් උල්ලංඝනය නොකරන බව නියෝජනය කරමින් එකඟ වෙයි: ඔබ විසින් PayPal වෙත අන්තර්ගත සැපයීම, PayPal සේවා භාවිතයෙන් ඔබ විසින් අන්තර්ගත පළ කිරීම හා PayPal විසින් PayPal සේවා සම්බන්ධව එබඳු අන්තර්ගත (ඉන් ව්‍යුත්පන්න කරන ලද කෘතීන් ද ඇතුළුව) භාවිතා කිරීම.

**විකුණුම්කරුවන් විසින් PayPal වෙත ලබා දුන් බලපත්‍ර**

උක්ත ඡේදයේ සම්පාදනයන්හි පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, ඔබ භාණ්ඩ හා සේවා සඳහා ගෙවීම් පිළිගැනීමට PayPal සේවා භාවිතා කරන අලෙවිකරුවකු නම්, ඔබ විසින් (1) ගෙවීම් ක්‍රමයක් ලෙස PayPal සේවාව පිළිගන්නා ව්‍යාපාරිකයෙකු ලෙස ඔබව හඳුනාගෙන ඔබ සමග පාරිභෝගික ගනුදෙනු කිරීමට ඉඩ සලසා දීම හා (2) ඔබ විසින් විශේෂයෙන් කැමැත්ත පළ කරන වෙනත් කිනම් හෝ භාවිතාවක් සඳහා මෙම පරිශීලක ගිණුමේ කාලසීමාව ඇතුළත මින් ලෝකව්‍යාප්ත, අනන්‍ය නොවූ, මාරු කළ හැකි, උප බලපත්‍ර ගැන්විය හැකි (විවිධ ස්ථර ඔස්සේ) සහ රාජ්‍ය භාග රහිත, සම්පූර්ණයෙන් ගෙවන ලද, ඔබේ වෙළෙඳ ලකුණු (ලියාපදිංචි කළ හා ලියාපදිංචි නොකළ වෙළෙඳ ලකුණු, වෙළෙඳ නාම, සේවා සලකුණු, ලාංඡන, වසම් නම් හා වෙනත් ඔබට බලපත්‍ර ගැන්වූ, ඔබට අයිති හෝ ඔබ විසින් භාවිතා කරන වෙනත් පැවරීම් ද ඇතුළුව ඒවාට සීමා නොවූ) භාවිතා කිරීමට හා ප්‍රසිද්ධියේ සංදර්ශනය කිරීමට අයිතියක් PayPal හා එහි අනුබද්ධිත ආයතන සඳහා ලබා දෙයි.

## විවිධ

**පැවරුම**

ඔබට මෙම පරිශීලක ගිවිසුම යටතේ ඔබ සතුව ඇති කිනම් හෝ අයිතියක් හෝ වගකීමක් PayPal හි පූර්ව ලිඛිත අනුමැතියකින් තොරව මාරු කිරීමට හෝ පැවරීමට නොහැක. PayPal විසින් මෙම පරිශීලක ගිවිසුම හෝ මෙම පරිශීලක ගිවිසුම යටතේ පවතින කිනම් හෝ අයිතියක් හෝ වගකීමක් ඕනෑම මොහොතක මාරු කිරීමට හෝ පවරනු ලැබීමට හැකිය.

**වැඩ කරන දින**

"වැඩ කරන දින(ය)" යන්නෙන් අදහස් වන්නේ සිංගප්පූරුව තුළ පිළිගන්නා ජාතික නිවාඩු දින හැර සඳුදා සිට සිකුරාදා දක්වා දිනයන්ය.

**අක්‍රිය ගිණුම්**

ඔබ විසින් වසර දෙකක් හෝ වැඩි කාලයක් සඳහා ඔබේ PayPal ගිණුම වෙත ලොගින් නොවූයේ නම්, PayPal විසින් ඔබේ PayPal ගිණුම වසා දමන අතර ඔබේ ගිණුමේ ඇති කිනම් හෝ හිමිකම් නොකියන ලද මුදලක් හිමිකම් නොකියූ මුදල්වලට අදාළ වන නීතිවලට යටත් වනු ඇත.

**සම්පූර්ණ ගිවිසුම හා පැවැත්ම.**

මෙම පරිශීලක ගිවිසුම හා PayPal වෙබ් අඩවියේ නෛතික ගිවිසුම් පිටුව මත ඇති කිනම් හෝ අදාළ වන ප්‍රතිපත්ති ඔබ හා PayPal අතර PayPal සේවා සම්බන්ධව සම්පූර්ණ අවබෝධය ගෙන හැර දක්වයි. එබඳු සියලු නියමයන් මෙම පරිශීලක ගිවිසුම පවාරණය වූ පසුව ද ඒවායේ ස්වරූපයෙන්ම දිගටම පැවතිය යුතු අතර එසේ පවතිනු ඇත. මෙම පරිශීලක ගිවිසුමේ කිනම් හෝ ප්‍රතිපාදනයක් වලංගු නොවන හෝ ක්‍රියාත්මක කළ නොහැකි ලෙස ඔප්පු වුවහොත්, එම ප්‍රතිපාදන ඉවත් වනු ඇති අතර ඉතිරි ප්‍රතිපාදන දිගටම බලාත්මක වනු ඇත.

**පාලනය කෙරෙන නීතිය හා අධිකරණ බල ප්‍රදේශය**

මුළුමනින්ම සිංගප්පූරුව ඇතුළත එළැඹ ක්‍රියාත්මක වන ගිවිසුම්වලට සිංගප්පූරුවේ නීති අදාළ වන ආකාරයටම, නීති ප්‍රතිපාදනවල පිළිගැටුම් නොසලකා, මෙම ගිවිසුම එකී නීතිවලට අනුකූලව පාලනය හා අර්ථකථනය කෙරෙනු ලැබේ. පාර්ශ්වයන් විසින් වෙනත් අයුරකින් එකඟ වී ඇත්නම් විනා, ඔබට PayPal ට එරෙහිව තිබිය හැකි කිනම් හෝ හිමිකම් පෑමක් හෝ මතභේදක් සිංගප්පූරුවේ හෝ වගඋත්තරකරුවා පදිංචිව සිටින රටේ අධිකරණයක් මගින් විසඳිය යුතු බවට ඔබ එකඟ වේ. මෙම පරිශීලක ගිවිසුමෙන් හෝ අපගේ වෙබ් අඩවි හෝ සේවාවන් ඔබ විසින් භාවිතා කිරීම මගින් පැන නඟින කිනම් හෝ නඩු කටයුත්තක්, ක්‍රියාවක් හෝ වෙනත් කටයුතු සිංගප්පූරුව ඇතුළත පිහිටා ඇති අධිකරණවල අනන්‍ය නොවන අධිකරණ බලය වෙත යොමු කිරීමට ඔබ ආපසු හැරවිය නොහැකි ලෙස එකඟ වෙයි.

**නිසි ලෙස ගොනු නොකරන ලද නඩුව**

ඔබ විසින් PayPal ට එරෙහිව සිදු කරනු ලබන සියලුම හිමිකම් පෑම් මෙම පරිශීලක ගිවිසුමට අනුකූලව විසඳනු ලැබිය යුත්තේය. මෙම පරිශීලක ගිවිසුමට පටහැනි ලෙස ගොනු කරන ලද හෝ ඉදිරිපත් කරන ලද සියලු හිමිකම් පෑම් නිසි පරිදි ගොනු නොකරන ලද ලෙස සහ මෙම පරිශීලක ගිවිසුම කඩ කිරීමක් ලෙස සලකනු ලැබේ. ඔබ මෙම පරිශීලක ගිවිසුමට පටහැනිව හිමිකමක් ගොනු කරන්නේ නම්, PayPal විසින් නිසි පරිදි ගොනු නොකරන ලද හිමිකම් පෑම සම්බන්ධයෙන් ඔබට ලිඛිතව දැනුම් දී ඇති අතර ඔබ ඒ සමග වහාම හිමිකම් පෑම ඉල්ලා අස් කර ගැනීමට අපොහොසත් වූ බව සැලකීමෙන්, PayPal විසින් $1,000.00 USD දක්වා නීතිඥ ගාස්තු හා පිරිවැය (අභ්‍යන්තර නීතිඥ හා පාර නීතිඥ ගාස්තු ඇතුළුව) අය කර ගනු ලැබිය හැකිය.

**අනන්‍යතාව සනාථ කර ගැනීම**

ඍජුවම හෝ පාර්ශ්වයන් හරහා ඔබේ අනන්‍යතාව තහවුරු කර ගැනීම සඳහා අවශ්‍ය යැයි අප හඟින ඕනෑම විමසුමක් සිදු කිරීමට ඔබ විසින් PayPal වෙත අවසර ලබා දේ. මීට අයත් විය හැක්කේ:

- ඔබේ උපන් දිනය, ඔබේ බදුගෙවීමේ හෝ ජාතික හැඳුනුම්පත් අංකය, ඔබේ භෞතික ලිපින හා අපට ඔබව සාධාරණ ලෙස හඳුනාගැනීමට ඉඩ සලසන වෙනත් තොරතුරු වැනි වැඩිදුර විස්තර ඉල්ලා සිටීම;
- ඔබේ ඊමේල් ලිපිනය හෝ මූල්‍ය උපකරණවල හිමිකාරීත්වය තහවුරු කිරීම සඳහා ඔබ විසින් පියවර ගැනීමට නියම කිරිම;
- ණය වාර්තාකරණ නියෝජිතායතනයකින් ණය වාර්තාවක් ඇණවුම් කිරීම;
- තෙවැනි පාර්ශ්වීය දත්ත සංචිත හෝ වෙනත් මූලාශ්‍ර මගින් ඔබේ තොරතුරු සනාථ කර ගැනීම; හෝ

- ඕනෑම මොහොතක ඔබේ රියැදුරු බලපත්‍රය හෝ වෙනත් අනන්‍යතා ලේඛන වැනි වැඩිදුර ලියකියවිලි සපයන ලෙස ඔබට නියම කිරීම.

ඔබ විසින් PayPal සේවා භාවිතා කරන්නේ නම් ප්‍රති-මුදල් විශුද්ධිකරණ හා ත්‍රස්ත විරෝධී මූල්‍යන නීති මගින් PayPal විසින් යම් යම් හඳුනා ගැනීමේ තොරතුරු තහවුරු කර ගැනීම අවශ්‍ය කරනු ලැබිය හැක. සාධාරණ විමසීම්වලින් පසුවත්, අපට ඔබේ අනන්‍යතාව තහවුරු කර ගැනීම සඳහා අවශ්‍ය තොරතුරු ලබා ගැනීමට නොහැකි නම්, එබඳු අවස්ථාවල දී ඔබේ PayPal ගිණුම හා/හෝ PayPal සේවා වසා දැමීම, අත් හිටුවීම හෝ ඒවා වෙත ප්‍රවේශය සීමා කිරීමේ අයිතිය PayPal රඳවා ගනී.

## PayPal යනු ගෙවීම් සේවා සපයන්නෙකු පමණි

අප විසින් කටයුතු කරන්නේ ගෙවීම් සේවා සපයන්නෙකු ලෙස පමණි. අපි පහත දෑ නොකරමු:

- බැංකුවක් ලෙස කටයුතු කිරීම හෝ බැංකුකරණ සේවා සැපයීම;
- ඔබේ ගිණුමේ ඇති කිනම් හෝ අරමුදලක් සම්බන්ධයෙන් එස්කෝරු ඒජන්තවරයකු ලෙස කටයුතු කිරීම;
- ඔබේ නියෝජිතයා හෝ භාරකරු ලෙස කටයුතු කිරීම;
- ඔබ සමග හවුල්කාරීත්වයකට, හවුල් ව්‍යාපාරයකට, නියෝජිතායතනයකට හෝ රැකියා සම්බන්ධතාවකට එළඹීම;
- PayPal සේවා සමග ගෙවීම් කරනු ලබන නිෂ්පාදන හෝ සේවා සම්බන්ධව පාලනයක් හෝ වගකීමක් දැරීම;
- කිනම් හෝ ගැනුම්කරුවකුගේ හෝ විකුණන්නෙකුගේ අනන්‍යතාව සහතික කිරීම;
- ගැනුම්කරුවකු හෝ විකුණුම්කරුවකු විසින් ගනුදෙනුවක් සම්පූර්ණ කරනු ඇති බවට සහතික වීම;
- ඔබ කිනම් හෝ බදුවලට යටත් වන්නේ දැයි යන්න තීරණය කිරීම; හෝ
- මෙම පරිශීලක ගිවිසුමෙහි ප්‍රකාශිතව වෙනත් ආකාරයකින් දක්වා ඇත්නම් විනා, ඔබ විසින් අපේ සේවා භාවිතය මගින් පැන නගින කිනම් හෝ බදු මුදලක් එකතු කිරීම හෝ ගෙවීම.

### රහස්‍යතාව

ඔබේ රහස්‍යතාව සුරැකීම අපට ඉතා වැදගත් වේ. ඔබේ රහස්‍යතාව පවත්වා ගැනීම සඳහා අපේ කැපවීම මෙන්ම ඔබේ තොරතුරු අප විසින් භාවිතා කරන සහ අනාවරණය කරන ආකාරය වඩා හොඳින් අවබෝධ කර ගැනීම සඳහා අපගේ රහස්‍යතා ප්‍රතිපත්තිය කියවා බලන්න.

### ඉංග්‍රීසියෙන් ඇති නියම; ගිවිසුමේ පරිවර්තනය

මෙම නියම හා කිනම් හෝ ඍජුව හෝ වක්‍ර ලෙස සම්බන්ධ වන ලේඛන ඉංග්‍රීසි භාෂාවෙන් ඉදිරිපත් කරන බව පාර්ශ්වයන්ගේ ප්‍රකාශිත අපේක්ෂාව වේ. මෙම පරිශීලක ගිවිසුමේ කිනම් හෝ පරිවර්තනයක් සපයනු ලබන්නේ සපුරාම ඔබේ පහසුව සඳහා පමණක් වන අතර ඉන් මෙම පරිශීලක ගිවිසුමේ නියම වෙනස් කිරීමට අදහස් කරනු නොලැබේ. මෙම පරිශීලක ගිවිසුමේ ඉංග්‍රීසි අනුවාදය හා ඉංග්‍රීසි නොවන වෙනත් භාෂාවක අනුවාදයක සට්ටනයක් පැන නගින අවස්ථාවක ඉංග්‍රීසි අනුවාදය බලාත්මක වන්නේය.

### ඔබගේ පුද්ගලික දත්ත (විකුණුම්කරුවෙකු ලෙස); දත්ත ආරක්ෂණ නීති

ඔබට (විකුණුම්කරුවෙකු ලෙස) වෙනත් PayPal ගනුදෙනුකරුවෙකු පිළිබඳ පුද්ගලික දත්ත ලැබෙන්නේ නම්, ඔබ එවැනි පුද්ගලික දත්ත රහසිගතව තබා ගත යුතු අතර එය PayPal සේවාවන් හා සම්බන්ධව පමණක් භාවිතා කළ යුතු යි. PayPal ගනුදෙනුකරුවන් පිළිබඳ කිසිදු පුද්ගලික දත්ත තෙවන පාර්ශවයකට හෙළි කිරීම හෝ බෙදා හැරීම හෝ අලෙවිකරණ අරමුණු සඳහා එවැනි පුද්ගලික දත්ත භාවිතා කිරීම නොකළ යුතු ය. ඔබ PayPal ගනුදෙනුකරුවකුට ඉල්ලුම් නොකළ ඊමේල් යැවීම හෝ තෙවන පාර්ශවයන්ට ඉල්ලුම් නොකරන ලද ඊමේල් යැවීමට හෝ යැවීමට සහාය වීමට PayPal සේවාවන් භාවිතා කිරීම හෝ නොකළ යුතු ය.

මෙම පරිශීලක ගිවිසුමට අනුකූලව ඔබ PayPal ගනුදෙනුකරුවෙකු පිළිබඳ පුද්ගලික දත්ත සැකසෙන තාක් දුරට, ඔබ සහ PayPal එක් එක් ස්වාධීන දත්ත පාලකයෙකු වනු ඇත (සහ ඒකාබද්ධ පාලකයන් නොවේ), එනම් අපි එවැනි පෞද්ගලික දත්ත සැකසීමේ අරමුණු සහ මාධ්‍යයන් වෙන වෙනම තීරණය කරමු. මෙම පරිශීලක ගිවිසුමට අදාළව දත්ත පාලකයන්ට අදාළ වන ඕනෑම අදාළ රෙගුලාසි, විධානයන්, ප්‍රායෝගික කේත සහ නියාමන අවශ්‍යතා ඇතුළුව අදාළ වන ඕනෑම පෞද්ගලිකත්වයක් සහ දත්ත ආරක්ෂණ නීතිවල අවශ්‍යතාවයන්ට අනුකූල වීමට අපි සෑම කෙනෙකුම එකඟ වෙමු. මෙම පරිශීලක ගිවිසුමට අදාළව අප විසින් ක්‍රියාවට නංවන එවැනි පුද්ගලික දත්ත සඳහා අප සෑම කෙනෙකුම ස්වාධීනව තීරණය කරන රහස්‍යතා ප්‍රකාශ, දැන්වීම්, ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි අප සතුව ඇත.

අදාළ දත්ත ආරක්ෂණ නීතිවලට අනුකූලව, අපි එක් එක් වශයෙන්:

- පුද්ගලික දත්ත සැකසීමට අදාළ සියලු සුදුසු ආරක්ෂක පියවරයන් ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාම කරන්නෙමු;
- මෙම පරිශීලක ගිවිසුම යටතේ සිදු කරන සියලු ම සැකසුම් ක්‍රියාකාරකම් පිළිබඳ වාර්තාවක් පවත්වා ගන්නෙමු; සහ
- අදාළ දත්ත ආරක්ෂණ නීති අනෙක් පාර්ශවය විසින් උල්ලංඝනය කිරීමට හේතු විය හැකි කිසිවක් දැනුවත්ව හෝ හිතාමතාම කිරීම හෝ දැනුවත්ව හෝ හිතාමතාම කිසිවක් කිරීමට ඉඩ නොදෙන්නෙමු.

PayPal සේවාවන්ට අදාළව ඔබ රැස් කරන ඕනෑම පුද්ගලික දත්තයක් (ඔබ ගනුදෙනුකරුවකුගේ වෙනම සම්බන්ධතාවයක් හරහා PayPal සේවා භාවිතයෙන් පිටත ලබා ගත් වෙනත් ආකාරයකින් ජනනය නොකරන ලද, එකතු කරන ලද හෝ ලබා ගත් ඒවා නොවේ) ඔබ භාවිතා කළ යුත්තේ සීමිත ප්‍රමාණයකට සහ PayPal සේවාවන්ට අවශ්‍ය සහ අදාළ වන ලෙසත් ගනුදෙනුකරුගේ පූර්ව ප්‍රකාශිත කැමැත්ත ලබා ගෙන ඇති ආකාරයට මිස වෙනත් කිසිදු කටයුත්තක් සඳහා නොවේ.

**රට/කලාපයට විශේෂ වූ නියම**

මෙම නියම හා කොන්දේසි අදාළ වන්නේ පහත රටවල ලියාපදිංචි කරන ලද PayPal ගිණුම්වල ගිණුම් හිමිකරුවන් සඳහා පමණි. මෙම පරිශීලක ගිවිසුමේ නියම හා පහත නියමවල සට්ටනයක් ඇති වන අවස්ථාවක දී, පහත රට/කලාපයට විශේෂිත නියම අදාළ වේ:

**චීනයේ ප්‍රධාන භූමිය**

ඔබ විසින් PayPal හවුල්කාර බැංකුවකින් හෝ බලපත්‍රලාභී විදේශ විනිමය සේවා සම්පාදකයකු ("සේවා සම්පාදකයෙකු") විසින් පිරිනමන සේවාවක් ("තෙවැනි පාර්ශ්වීය සේවා") භාවිතා කරන්නේ නම්, එම සේවාවට අදාළ අතිරේක තොරතුරු සඳහා කරුණාකර සේවා සැපයුම්කරුගේ නියම හා කොන්දේසි බලන්න.

ඔබේ වරදක් හේතුවෙන්, කිසියම් අරමුදලක් නොගෙවීම හෝ ගෙවීම ප්‍රමාද කිරීම සම්බන්ධයෙන් ඔබ හා සේවා සැපයුම්කරුවකු අතර ඇතිවන කිනම් හෝ මතභේද, ඉල්ලීමa, ක්‍රියා, නඩු කටයුතු ("ආරවුල්") ඇතිවූ විටකදී, ඔබ විසින් මෙහෙයින් PayPal, PayPal හි අනුබද්ධිත සමාගම් හා එහි සේවකයන් එබඳු ආරවුල්වලින් පැන නඟින කිනම් හෝ හානි, හිමිකම් පෑම්, ගාස්තු, වියදම් හා/හෝ පාඩුවලින් නිදහස් කරනු ලබන්නේය. සේවා සැපයුම්කරුවකු වෙත ඔබේ PayPal ගිණුමෙන් දැනටමත් මාරු කර ඇති අරමුදල් සම්බන්ධයෙන් PayPal ඔබට වග නොකියන බවට ඔබ තවදුරටත් එකඟ වෙයි.

පහත හේතුව සඳහා ඇතුළුව, PayPal විසින් සේවා සම්පාදකයකු සමග ඔබ හා PayPal අතර ඇති PayPal හි රහස්‍යතා ප්‍රකාශය හා ගිවිසුමේ නියමවලට අනුකූලව ඔබ විසින් සපයා ඇති තොරතුරු බෙදා ගනු ලැබීමට ඉඩ ඇති බව ඔබ පිළිගෙන එකඟ වේ; සේවා සම්පාදකයාගේ ඔබේ පාරිභෝගිකයා දැන ගැනීමේ (KYC) බැඳීම් හා අනුකූලව අවශ්‍ය වන නිසි ක්‍රියා පරිපාටිය අනුගමනය කිරීමට සේවා සම්පාදකයකුට හැකියාව ලබා දීම සඳහා.

(i) තෙවැනි පාර්ශ්වීය සේවාවක බිඳ වැටීම, බාධා වීම, දෝෂයක් හෝ නොසලකා හැරීමක් හෝ චේතනාන්විත අවභාවිතාව; හෝ (ii) තෙවැනි පාර්ශ්වීය සේවාවක් ඔස්සේ ආපසු ගනු ලැබූ අරමුදල් ප්‍රමාද වීමෙන් හෝ නොලැබී යාමෙන් ඇති වන ප්‍රතිඵල සම්බන්ධයෙන් ඔබට දැරීමට හෝ විඳීමට සිදු වන කවර හෝ පාඩුවක් හෝ හානියක් සඳහා PayPal වග කියනු නොලැබේ.

අප විසින් කලින් කලට පරිශීලක ගිවිසුම හා චීනයේ ප්‍රධාන භූමියේ පරිශීලකයන් සඳහා අදාළ වන නෛතික ගිවිසුම් පිටුවේ ඇති කවර හෝ ප්‍රතිපත්ති හා වෙනත් ගිවිසුම් සංශෝධනය කරනු ලැබිය හැක. වෙනත් අයුරකින් දන්වා නැතිනම්, සංශෝධිත අනුවාදය අප එය අපේ වෙබ් අඩවියේ පළ කරන අවස්ථාවේ දී බලාත්මක වනු ඇත. අපගේ වෙනස්කම්වලින් ඔබේ අයිතීන් අඩු කරන්නේ නම් හෝ ඔබේ වගකීම් වැඩි කරන්නේ නම්, අපි අපගේ වෙබ් අඩවියේ ප්‍රතිපත්ති යාවත්කාලීන පිටෙහි නිවේදනයක් පළ කර ඔබට යටත් පිරිසෙයින් දින 30කට පෙර දැනුම්දීමක් ලබා දෙන්නෙමු.

මෙම නියම සහ කොන්දේසිවලින් සංශෝධනය කරනු ලබන ප්‍රමාණයට හැර, පරිශීලක ගිවිසුමේ අනෙකුත් සියලු ප්‍රතිපාදන සම්පූර්ණයෙන් ම බලාත්මක වන්නේ ය.

**කොලොම්බියාව**

2015 සැප්තැම්බර් 1 වැනි දින වන විට, කොලොම්බියාවේ පදිංචිකාර PayPal පරිශීලකයින්ට ජාත්‍යන්තර ගෙවීම් යැවීමට හා ලබා ගැනීමට පමණක් හැකියාව ඇත. කොලොම්බියාවේ පදිංචිකරුවකු වන PayPal පරිශීලකයන් දෙදෙනෙකු අතර දේශීය ගෙවීම් ලද නොහැක.

"කොලොම්බියාවේ පදිංචිකරුවා" යන්නෙන් අර්ථ දැක්වෙන්නේ:

1. සැබෑ ජාතිකත්වය කුමක් වුව ද, PayPal ගිණුමක් සඳහා ලියාපදිංචි වීමේ දී, ඔහුගේ/ඇයගේ රට හෝ කලාපය ලෙස කොලොම්බියාව සඳහන් කළ පුද්ගලයකු; සහ
2. PayPal ගිණුමක් සඳහා ලියාපදිංචි වීමේ දී, සිය රට හෝ කලාපය ලෙස කොලොම්බියාව සඳහන් කළ අස්තිත්වයක්, හවුල්කාරීත්වයක්, සංවිධානයක් හෝ සමාගමක්.

**මැලේසියාව**

මැලේසියාවේ නෙගාරා බැංකුව මගින් PayPal හට ඉ-මුදල් ව්‍යාපාරයක් පවත්වාගෙන යාම සඳහා අනුමැතිය ලබා ඇත. එබැවින්, ඔබ මැලේසියානු පාරිභෝගිකයකු නම් හා මෙම පරිශීලක ගිවිසුමේ PayPal සමග මතභේද වගන්තියේ දක්වා ඇති මතභේද නිරාකරණ ක්‍රියාවලියෙහි ඔබේ භාවිතාවට අදාළව PayPal හි සේවා සම්බන්ධව PayPal ඔබට ඉක්මනින් හා කාර්යක්ෂම ලෙස ප්‍රතිචාර නොදක්වන්නේ නම්, ඔබට PayPal පාරිභෝගික සහාය ඇමතීමට මෙන්ම BNMLINK හා BNMTELELINK හරහා නෙගාරා බැංකුව ඇමතීමට ද හැකිය.

BNMTELELINK දුරකථන, ෆැක්ස්, ලිපි හෝ ඊමේල් මාර්ගයෙන් සෘජුව අමතනු ලැබිය හැක. මහජනයාට මලයාසියා නෙගාරා බැංකු අධිකරණ බලය යටතේ ඇති සාම්ප්‍රදායික හා ඉස්ලාමීය බැංකුකරණ, රක්ෂණ හා තකාෆුල්, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා උපදේශන සේවා, විදේශ විනිමය පරිපාලනය හා වෙනත් කාරණා යන ක්ෂේත්‍ර සඳහා තොරතුරු, විමසීම් හෝ පිළියම් සඳහා BNMLINK හා BNMTELELINK ඇමතිය හැක. BNMTELELINK සඳහා ඇමතුම් විස්තර:

BNMTELELINK

Jabatan Komunikasi Korporat

Bank Negara Malaysia

P.O.Box 10922

50929 Kuala Lumpur

දුරකථන: 1-300-88-5465 (සබැඳිය)

ෆැක්ස්: 03-2174 1515

ඊමේල්: **bnmtelelink@bnm.gov.my**

BNMLINK හා BNMTELELINK විවෘතව තබන වේලාවන් වන්නේ: මැලේසියානු වේලාවෙන් සඳුදා - සිකුරාදා පෙ.ව. 9.00 - ප.ව. 5.00 දක්වා

**රහස්‍යතා ප්‍රතිපත්තිය.** මෙම ගිවිසුමට අමුණා ඇති රහස්‍යතා ප්‍රතිපත්තියේ ඉංග්‍රීසි අනුවාදයට අමතරව, පහත සබැඳිය ක්ලික් කිරීමෙන් ප්‍රතිපත්තියේ මැලේ භාෂා අනුවාදයක් ලබා ගත හැකිය.

**මූල්‍ය ඔම්බුඩ්ස්මන් යෝජනා ක්‍රමය**. PayPal මැලේසියානු නෙගාරා බැංකුව විසින් අනුමත කර ඇති මූල්‍ය ඔම්බුඩ්ස්මන් යෝජනා ක්‍රමයේ සාමාජිකයෙකි. යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා අනුමත ක්‍රියාකරු වන්නේ, යෝග්‍ය මැලේසියා පාරිභෝගිකයින් ආවරණය කරන ස්වාධීන විකල්ප මතභේද නිරාකරණ මාර්ගයක් වන මූල්‍ය සේවා සඳහා ඔම්බුඩ්ස්මන්වරයාය (OFS). PayPalහි විසඳුමෙන් අතෘප්තියට පත් විය හැකි සුදුසුකම් ලබන පැමිණිලිකරුවන් සඳහා OFS සේවා නොමිලේ සපයනු ලැබේ. මතභේදයක් ගොනු කිරීම සඳහා කාල රාමුව හා ඔම්බුඩ්ස්මන්වරයා විසින් ලබා දෙන පිරිනැමීම් වර්ග පිළිබඳ වැඩිදුර තොරතුරු සඳහා **www.ofs.org.my** වෙත පිවිසෙන්න.

**මැලේසියාව තුළ අරමුදල් ආපසු ගැනීම.** ඔබගේ ගිණුම මැලේසියාවේ ලියාපදිංචි වී ඇත්නම්, ඔබට ඔබගේ ගිණුමෙන් අරමුදල් ලබා ගත හැක්කේ ඒවා ඔබේ දේශීය මැලේසියානු බැංකු ගිණුමට මාරු කිරීමෙන් පමණක් බව අපි පැහැදිලි කර ඇත්තෙමු.

**පාලන නීතිය.** මැලේසියානු ලිපිනයකින් PayPal සේවා සඳහා ලියාපදිංචි වන මැලේසියානු පදිංචිකරුවන් සඳහා, මුළුමනින්ම මැලේසියාව තුළ දී එළැඹ ක්‍රියාත්මක කරනු ලබන ගිවිසුම්වලට මැලේසියානු නීතිය අදාළ වන පරිද්දෙන්ම මෙම පරිශීලක ගිවිසුම ද මැලේසියානු නීතියෙන් පාලනය වන අතර ඒ අනුව අර්ථ නිරූපණය කරනු ලබන්නේය. මෙම නියම හා කොන්දේසි මගින් සංශෝධනය කර ඇති ආකාරයට විනා, පරිශීලක ගිවිසුමේ අනෙකුත් සියලුම ප්‍රතිපාදන සම්පූර්ණ බලය සහ බලපෑම සහිතව පවතී.

**සංශෝධන**. අප විසින් කලින් කලට මෙම පරිශීලක ගිවිසුම හා නෛතික ගිවිසුම් පිටුවේ ඇති මැලේසියාවේ සිටින පරිශීලකයින්ට අදාළ වන ප්‍රතිපත්ති හා වෙනත් ගිවිසුම් සංශෝධනය කරනු ලැබිය හැක්කේය. වෙනත් අයුරකින් දන්වා නැතිනම්, සංශෝධිත අනුවාදය අප එය අපේ වෙබ් අඩවියේ පළ කරන අවස්ථාවේ දී බලාත්මක වනු ඇත. අපගේ වෙනස්කම්වලින් ඔබේ අයිතීන් අඩු කරන්නේ නම් හෝ ඔබේ වගකීම් වැඩි කරන්නේ නම්, අපි අපගේ වෙබ් අඩවියේ ප්‍රතිපත්ති යාවත්කාලීන පිටෙහි නිවේදනයක් පළ කර ඔබට යටත් පිරිසෙයින් දින 21කට පෙර දැනුම්දීමක් ලබා දෙන්නෙමු.

**PayPal අත්හිටුවීමේ සහ අවසන් කිරීමේ අයිතීන්.** (i) ඔබ මෙම පරිශීලක ගිවිසුම, PayPal පිළිගත හැකි පරිශීලන ප්‍රතිපත්ති, වාණිජ්‍ය අස්ථිත්ව ගිවිසුම (ඔබට අදාළ වන පරිදි), හෝ ඔබ හා PayPal අතර ඇතිවූ වෙනත් ගිවිසුමක් කඩකරන්නේ නම් හෝ (ii) සාධාරණව කටයුතු කිරීමෙන් වෙනත් තත්ත්වයන් හෝ හේතු නිසා එසේ කළ යුතු බව අප තීරණය කරන්නේ නම්, PayPal හට, එහි අභිමතිය පරිදි, ඔබ වෙත දැනුම් දීමකට පසුව, මෙම පරිශීලක ගිවිසුම, අප විසින් හෝ අප වෙනුවෙන් යමෙක් විසින් ක්‍රියා කරවන වෙබ් අඩවි, මෘදුකාංග, පද්ධති (ඕනෑම PayPal සේවාවක් සැපයීමට භාවිතා කරන ඕනෑම ජාල සහ සේවාදායකයන් ඇතුළුව) සියලුම හෝ සමහර PayPal සේවාවන් වෙත පිවිසීමට හෝ භාවිතා කිරීම අත්හිටුවීමට හෝ අවසන් කිරීමට අයිතිය ඇත. පැහැදිලිව පෙනෙන දෝෂයක් හෝ අයහපත් විශ්වාසයක් සහිත අවස්ථාවක හැර අපගේ තීරණය අවසන් සහ බන්ධනීය වන්නේය. මෙම පරිශීලක ගිවිසුම අවසන් වීමෙන් පසු, ඔබගේ PayPal ශේෂයේ ඇති ඕනෑම සීමා නොකළ අරමුදලක් සඳහා PayPal විසින් ඔබට ගෙවනු ලැබේ.

**මොරොක්කෝව**

මුදල් ආපසු ලබා ගැනීමේ ක්‍රියාකාරීත්වය PayPal හි බැංකු හවුල්කරු සමග මොරොක්කානු බැංකු ගිණුමකට ලබා දීමේ දී, ඔබ විසින් මොරොක්කානු නීති හා රෙගුලාසිවලට අනුකූලතාව දැක්විය යුතුය. මින් අදහස් වන්නේ, ඔබට PayPal පරිශීලකයකු වෙතින් ඔබේ PayPal ශේෂය වෙත මුදල් ලැබුණහොත්,අර මුදල් ලැබී දින 30ක් ඇතුළත ඔබ විසින් ඔබේ PayPal ශේෂයේ ඇති මුදල් ඔබේ මොරොක්කානු බැංකු ගිණුමට* ලබා ගත යුතු බවයි.

* මුදල් ආපසු ගැනීමේ ක්‍රියාකාරිත්වය සඳහා PayPal හි බැංකු සහකරු එක් එක් මුදල් ආපසු ගැනීමක් සඳහා ගාස්තුවක් අය කරයි. ලැබීමේ සහ ආපසු ගැනීමේ ක්‍රියාකාරිත්වය සක්‍රීය කිරීමෙන් පසු, PayPal ඔබට අමතර තොරතුරු ලබා දෙනු ඇත.

**පිලිපීනය**

ඔබ PayPal හවුල්කාර බැංකුවක්, බලපත්‍රලාභී විදේශ විනිමය සේවා සැපයුම්කරුවෙකු, ප්‍රේෂණ නියෝජිතයෙකු හෝ ඊ-මුදල් නිකුත් කරන්නෙකු ("සේවා සැපයුම්කරුවෙකු") විසින් සපයනු ලබන සේවාවක් ("තෙවන පාර්ශවීය සේවාවක්") භාවිතා කරන්නේ නම්, කරුණාකර එම සේවාවට අදාළ අමතර තොරතුරු සඳහා සේවා සපයන්නා සඳහා අදාළ වන නියම සහ කොන්දේසි බලන්න.

ඔබට සිදු කළ යුතු ගෙවීමක් නොගෙවීම හෝ ප්‍රමාදයක් සම්බන්ධව ඔබ සහ සේවා සපයන්නා අතර ඇති වන ඕනෑම මතභේදයක්, ඉල්ලීමක්, ක්‍රියාවක්, නීතිමය කටයුත්තක් ("මතභේද") තුළින් ඇතිවිය හැකි හානි, හිමිකම් පෑම්, ගාස්තු, වියදම් සහ/හෝ පාඩුවලින් ඔබ PayPal, PayPalහි අනුබද්ධ ආයතන සහ එහි සේවකයන් නිදහස් කරයි. සේවා සැපයුම්කරුවකු වෙත ඔබේ PayPal ගිණුමෙන් දැනටමත් මාරු කර ඇති අරමුදල් සම්බන්ධයෙන් PayPal ඔබට වග නොකියන බවට ඔබ තවදුරටත් එකඟ වෙයි.

සේවා සැපයුම්කරුගේ ඔබේ-පාරිභෝගිකයා දැනගන්න (KYC) බැඳීම්වලට අනුකූලව අවශ්‍ය නිසි සම්ප්‍රජන්‍යතාව පවත්වා ගැනීමට සේවා සැපයුම්කරුට හැකි වන පරිදි PayPal හි රහස්‍යතා ප්‍රතිපත්තියට සහ ඔබ සහ ඔබ සහ PayPal අතර ඇති ගිවිසුමේ නියමයන්ට අනුකූලව ඔබ විසින් සපයන ලද තොරතුරු PayPal විසින් සේවා සැපයුම්කරු සමඟ බෙදා ගත හැකි බව ඔබ පිළිගෙන එකඟ වේ.

කිසියම් (i) තෙවන පාර්ශවීය සේවාවක් අසමත් වීම, බාධා කිරීම්, අඩුපාඩුකම් හෝ නොසැලකිලිමත් හෝ හිතාමතා අනිසි ලෙස භාවිතා කිරීම; හෝ (ii) තෙවන පාර්ශවීය සේවාවක් හරහා මුදල් ආපසු ලබා ගැනීමේ කිසියම් ප්‍රමාදයක් හෝ නොලැබීමක් හේතුවෙන් ඔබට සිදු වූ අලාභයක් හෝ හානියක් සම්බන්ධයෙන් PayPal වගකියනු නොලබයි.

මෙම නියම හා කොන්දේසිවලින් සංශෝධනය කරනු ලබන ප්‍රමාණයට හැර, පරිශීලක ගිවිසුමේ අනෙකුත් සියලු ප්‍රතිපාදන සම්පූර්ණයෙන්ම බලාත්මක වන්නේය.

**දකුණු අප්‍රිකාව**

ඔබ දකුණු අප්‍රිකානු විනිමය පාලන රෙගුලාසි වලට අනුකූල විය යුතුය. මෙයින් අදහස් කරන්නේ:

1. ඔබගේ PayPal ශේෂයට PayPal පරිශීලකයෙකුගෙන් මුදල් ලැබෙන්නේ නම්:

    (i) මිලදී ගැනීමක් සඳහා හෝ වෙනත් හේතුවක් නිසා ඔබ එම මුදල් වෙනත් PayPal පරිශීලකයෙකුට නොයැවිය හැකිය.

    (ii) අරමුදල් ලැබී දින 30 ක් ඇතුළත ඔබේ PayPal ශේෂයේ ඇති මුදල් ඔබේ දකුණු අප්‍රිකානු බැංකු ගිණුමට* ආපසු ලබා ගත යුතුය.

2. ඔබ වෙනත් PayPal පරිශීලකයෙකුට මුදල් යැවීමට කැමති නම්:

    (i) ඔබ එසේ කළ යුත්තේ ඔබේ ගිණුම හා සම්බන්ධ ණයපතකින් හෝ ඔබේ FNB බැංකු ගිණුමෙන්* ඔබේ PayPal ශේෂය ඉහළට ගෙන යාමෙනි.

    (ii) ඉහළ දැමූ මුදල භාවිතා කරන මිලදී ගැනීම් සඳහා, ඔබ එක් එක් මිලදී ගැනීම සඳහා වෙන වෙනම මුදල් ඉහළ දැමිය යුතුය.

* එක් එක් මුදල් ඉහළ දැමීමක් සහ මුදල් ආපසු ගැනීමක් සඳහා FNB ගාස්තුවක් අය කරයි. වැඩි විස්තර සඳහා කරුණාකර FNB වෙබ් අඩවිය බලන්න.

**සිංගප්පූරුව**

PayPal සේවාවන් පිරිනමනු ලබන්නේ 5 Temasek Boulevard #09-01, Suntec Tower Five, Singapore 038985 යන ලිපිනයේ පිහිටි PayPal Pte. Ltd. විසිනි. අපගේ මෙහෙයුම් වේලාවන් ව්‍යාපාරික දිනවල උදේ 9 සිට සවස 5 දක්වා වේ. ඔබ සිංගප්පූරුවේ පදිංචිකරුවෙක් නම්, ඉහත ලිපිනයට ඔබේ ඊමේල් ලිපිනය සහ මෙම තොරතුරු සඳහා ඉල්ලීමක් සහිත ලිපියක් එවීමෙන් ඔබට මෙම තොරතුරු ඊමේල් මගින් ඔබ වෙත ගෙන්වා ගත හැකි ය. අපගේ සේවාවන් සඳහා වන ගාස්තු අපගේ ගාස්තු වගුවේ විස්තර කර ඇත.

ඔබේ PayPal ගිණුමට පහසුකම් සැපයිය හැක්කේ භාණ්ඩ සහ සේවා සඳහා කරන ගෙවීම්වලට පමණක් වන අතර පුද්ගලික අරමුදල් මාරුකිරීම්වලට නොවේ.

පුද්ගලික ගිණුම් සඳහා ඔබ විසින් සියලු පුද්ගලික ගිණුම්වල රඳවාගෙන සිටින මුළු ශේෂය මත හෝ නීතියෙන් නියම කර ඇති ආකාරයට හෝ අප විසින් නිර්ණය කරනු ලබන ආකාරයට ඔබට අප සමග ඇති පුද්ගලික ගිණුම්වලින් සිදු කරනු ලැබිය හැකි යැවෙන ගනුදෙනුවල මුළු මුදලට සීමාවක් තිබිය හැකි බව කරුණාවෙන් සලකන්න.

සිංගප්පූරුවේ නේවාසික පරිශීලකයින්ගේ PayPal ශේෂයට අදාළව, භාර විධිවිධානයක් හරහා එම PayPal ශේෂයට සමාන මුදල් ප්‍රමාණයක් PayPal විසින් සංවිධානය කර ඇත.

*සිංගප්පූරු නේවාසිකයා යනු:

1. ජාතිකත්වය කුමක් වුව ද, PayPal ගිණුමකට ලියාපදිංචි වීමේ දී සිය 'පදිංචි රට' ලෙස 'සිංගප්පූරුව' සඳහන් කර ඇති පුද්ගලයකු එසේ කිරීමේ දී ඔහු/ඇය සිංගප්පූරු පදිංචිකරුවකු ලෙස සලකනු ලබනු බවට එකඟ වන; අතර
2. PayPal ගිණුමකට ලියාපදිංචි වීමේ දී 'ලියාපදිංචි රට' ලෙස 'සිංගප්පූරුව' සඳහන් කර ඇති තනි පුද්ගල නොවන සමූහයක් එසේ කිරීමේ දී ඊට සිංගප්පූරුවේ පදිංචිකාරකමක් ඇති බවට එකඟ වෙයි.

මීට අමතරව, ඔබ තනි පුද්ගලයකු හෝ පරම හිමිකරුවකු නම්, අප විසින් ඔබට පහත දැක්වෙන පරිදි සිංගප්පූරුවේ මූල්‍ය අධිකාරිය මගින් පළ කර ඇති ඉ-ගෙවීම් පරිශීලකයා ආරක්ෂා කිරීමේ මාර්ගෝපදේශය යටතේ ඔබට ඇති බැඳීම් පිළිබඳව දැනුවත් කිරීමට අවශ්‍ය වේ:

- මාර්ගෝපදේශවලින් අපට නියම කරන පරිදි ඔබ වෙත ගනුදෙනු දැනුම්දීම් එවීමට අපට ඔබගේ සබඳතා තොරතුරු සපයන්න. අවම ක්‍රියා මාර්ගයක් වශයෙන්, ඔබ SMS මගින් ගනුදෙනු දැනුම්දීමක් ලබා ගැනීමට තෝරා ගතහොත් ඔබ විසින් අපට ඔබේ සිංගප්පූරු ජංගම දුරකථන අංකය සැපයිය යුතු අතර ඔබ විසින් ඊමේල් මාර්ගයෙන් දැනුම්දීම් ලැබීමට තෝරා ගෙන ඇත්නම් ඔබ විසින් අපට ඔබේ ඊමේල් ලිපිනය සැපයිය යුතු ය;
- ඔබේ ගිණුමෙන් සිදු වන සියලු පිටතට යන ගනුදෙනු සඳහා සියලු ගනුදෙනු දැනුම්දීම් ලබා ගැනීමට ගනුදෙනු දැනුම්දීම් සක්‍රිය කිරීම හා අප විසින් ඔබේ ඊමේල් ලිපිනය වෙත එවන ලද ගනුදෙනු දැනුම්දීම් වැඩිදුර සිහි කැඳවීම් හෝ නැවත නැවත දැනුම්දීම් එවීමෙන් තොරව අධීක්ෂණය කරනු ලැබීමට ඔබ වග කිව යුතු වේ.

- ඉහතින් සඳහන් කර ඇති පරිදි, ඔබ විසින් ඔබේ මුරපදවලින් කිසිවක් කිනම් හෝ තෙවැනි පාර්ශ්වයකට ස්වේච්ඡාවෙන් අනාවරණය නොකළ යුතු ය (අප විසින් උපදෙස් දී ඇති පරිදි විනා). ඔබ විසින් ඔබේ ගිණුමේ, සත්‍යාපන උපාංගයේ හෝ ඔබේ ගිණුම සඳහා වන කිසිදු රඳවනයක ඇති ඔබේ මුරපදය හඳුනාගත හැකි ආකාරයික් අනාවරණය කිරීම හෝ තෙවැනි පාර්ශ්වයකට ඔබේ මුරපදය අවභාවිතා කිරීමට හැකි වන ආකාරයකින් ඔබේ මුරපදයේ වාර්තාවක් තබා ගැනීම සිදු නොකළ යුතු ය.
- ඔබ විසින් ඔබේ මුරපදවල වාර්තාවක් තබා ගන්නේ නම්, ඔබ විසින් ඔබේ වාර්තාව ආරක්ෂිතව තබා ගැනීම සඳහා සාධාරණ පරිශ්‍රමයක් දැරිය යුතු ය, උදාහරණ වශයෙන් ඔබ පමණක් දන්නා හෝ ඔබට පමණක් ප්‍රවේශ විය හැකි භෞතික ස්ථානයක් ඒවා තබා ගැනීම හෝ තෙවැනි පාර්ශ්වයක් විසින් ඒවා සොයා ගැනීමට නොහැකි ස්ථානයක තැබීමට කටයුතු කළ යුතු ය.
- යටත් පිරිසෙයින් ඔබේ ගිණුම ආරක්ෂා කර ගැනීම සඳහා ඔබ විසින් පහත දෑ සිදු කළ යුතු ය:
    - ඔබේ උපාංගයේ/උපාංගවල බ්‍රවුසරය ලද හැකි නවතම අනුවාදයට යාවත්කාලීන කිරීම,
    - ඔබේ උපාංගයේ/උපාංගවල මෙහෙයුම් පද්ධතිය ක්‍රමවත් ආරක්ෂක යාවත්කාල සමගින් ආරක්ෂිත කිරීම,
    - ඔබේ උපාංගයේ/උපාංගවල නවතම ප්‍රති වයිරස මෘදුකාංග ස්ථාපනය කර පවත්වාගෙන යාම සහ
    - අක්ෂර, අංක හා සංකේතවල සංයෝගයක් වැනි ප්‍රබල මුරපද භාවිතා කිරීම.
- කිනම් හෝ බලය නොලත් ගනුදෙනුවක් සඳහා ගනුදෙනු දැනුම්දීමක් ලැබුණු පසු හැකි තාක් ඉක්මනින් එය PayPal වෙත වාර්තා කිරීමට ඔබ විසින් කටයුතු කළ යුතු ය. වාර්තා කිරීමේ පමා වීමක් සිදුව ඇත්නම් සහ අප විසින් එම පමාවට හේතුව විමසා සිටින්නේ නම් ඔබ විසින් වාර්තා කිරීම ප්‍රමාද වීමට හේතු අපට සැපයිය යුතු ය. බලය නොලත් ගනුදෙනු සඳහා වාර්තා කිරීම ඉහතින් විස්තර කර ඇත. අපගේ හිමිකම් පෑම් පරීක්ෂණ ක්‍රියාවලිය සඳහා පහසුකම් සැපයීම පිණිස අප විසින් ඉල්ලා සිටින්නේ නම් ඔබ විසින් පොලිස් වාර්තාවක් සැපයීම අවශ්‍ය විය හැක.
- ඔබට PayPal ගිණුමක් ඇත්නම්, අපගේ ආරක්ෂක උපදෙස් අනුව එය භාවිතා කිරීමට ඔබට බලය ඇති බව (මෙම ගිවිසුම අනුව) අනෙක් පුද්ගලයන්ට දැන්වීම ද කළ යුතු ය.

අපගේ වගකීම් වනුයේ:

- ඔබේ අභිමතයන්ට යටත්ව ඔබේ ඊමේලයට හෝ එවැනි දැනුම්දීම් ලැබිය යුතු ලෙස ඔබ විසින් තෝරා ඇති සියලු ඊමේලයන්ට ඔබේ පිටතට යන ගනුදෙනුවලට අදාළ ගනුදෙනු දැනුම්දීම් ඔබ වෙත සපයන්නෙමු. මෙකී ගනුදෙනු එක් එක් ගනුදෙනුව සඳහා තත්කාලීන පදනමක් මත යවනු ලැබේ. අපි ඊමේල් ගනුදෙනු දැනුම්දීම සමග අපගේ වෙබ් අඩවියේ දී දැනුම්දීමක් සිදු කරන්නෙමු. දැනුම්දීමට පහත තොරතුරු ද අඩංගු වනු ඇත (අප විසින් රහස්‍යතාව රැක ගැනීම සඳහා ඉවත් කර ඇති තොරතුරුවලට අමතරව) ඔබට දැනුම්දීමට අවසර දී ඇති බව හඳුනා ගැනීම සඳහා:
    - ඔබට ඔබේ ගිණුම හඳුනා ගැනීමට ඉඩ සලසන තොරතුරු (උදා: ඔබේ ගිණුමේ නමින්),
    - ඔබට ලබන්නා හඳුනා ගැනීමට ඉඩ සලසන තොරතුරු,
    - අපට පසුකාලීනව ඔබව, ඔබේ ගිණුම හා ලබන්නාගේ ගිණුම හඳුනා ගැනීමට ඉඩ සලසන තොරතුරු,
    - ගනුදෙනු මුදල;
    - ගනුදෙනුවේ දිනය හා වේලාව,

- ගනුදෙනු වර්ගය,
- ගනුදෙනුව ව්‍යාපාරයක් මගින් සපයන භාණ්ඩ හා සේවාවන් සඳහා නම් වෙළෙන්දාගේ වෙළෙඳාම්කරණ නාමය හා ගනුදෙනුව සඳහා යොමු අංකය (හැකි අවස්ථාවන්හි).

ඔබේ දැනුම්දීම් අභිමතයන් බලය නොලත් ගනුදෙනු කලට වේලාවට හඳුනා ගැනීමට ඇති හැකියාවට සහ කිනම් හෝ බලය නොලත් ගනුදෙනුවක් සඳහා ඔබේ වගකීමට බලපෑම් ඇති කළ හැකි බව කරුණාවෙන් සලකන්න.

ඉහත ක්‍රියාවලීන්ට අමතරව, අපි ඕනෑම බලය නොලත් ගනුදෙනු හිමිකම් පෑමක විමර්ශනයකදී ඍජු පැමිණිල්ලක් වැඩ කරන දින 21 කින්ද සංකීර්ණ පැමිණිල්ලක් වැඩ කරන දින 45 කින්ද සම්පූර්ණ කරන්නෙමු. සංකීර්ණ පැමිණිලිවලට බලය නොලත් ගනුදෙනුවේ කිනම් හෝ පාර්ශ්වයක් විදේශයක පදිංචිව සිටීම හෝ පරීක්ෂණය සම්පූර්ණ කිරීම සඳහා ඔබ වෙතින් ප්‍රමාණවත් තොරතුරු නොලැබීම අයත් වේ. අප විසින් පරීක්ෂණයේ ප්‍රතිඵල සහ ඉන් ඔබේ වගකීමේ ඇගයීම පිළිබඳ ලිඛිත හෝ වාචික වාර්තාවක් සපයා පරීක්ෂණ වාර්තාව ඔබට ලැබුණු බව දන්වන ලෙස ඉල්ලනු ඇත. අප විසින් අපගේ හිමිකම් පෑම් නිරාකරණය කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කිරීමට පෙර පොලිස් වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස ඔබෙන් ඉල්ලීමට ද ඉඩ ඇත. ඔබ අපේ ඇගයීම සමඟ එකඟ නොවන විට අප විසින් වෙනත් ආකාරයේ මතභේද නිරාකරණ ක්‍රම ආරම්භ කිරීමට ඉඩ ඇත.

**තායිවානය**

ඔබගේ දේශීය බැංකු ගිණුමට ඔබගේ PayPal ශේෂය ආපසු ලබා ගැනීමට ඔබට ඇති හැකියාව තායිවානයේ PayPal හවුල්කාර බැංකුවක් ("හවුල්කාර බැංකුව") සමඟ බැංකු ගිණුමක් විවෘත කිරීම සහ එම හවුල්කාර බැංකුව ("ආපසු ගැනීමේ සේවාව") ලබා දෙන මුදල් ආපසු ගැනීමේ සේවාව භාවිතා කිරීම අවශ්‍ය විය හැකිය. ආපසු ගැනීමේ සේවයට අදාළ අමතර තොරතුරු සඳහා කරුණාකර හවුල්කරු බැංකුව සමඟ ඇති නියම සහ කොන්දේසි බලන්න.

කිසියම් හේතුවක් නිසා ඔබේ PayPal ශේෂය ආපසු ගැනීම ක්‍රියාවට නැංවිය නොහැකි නම්, ඔබේ අරමුදල් ඇ.ඩො. ලෙස ඔබට නැවත ලැබෙනු ඇත.

ඔබ නිසා කිසියම් අරමුදලක් ප්‍රමාද වී හෝ නොගෙවීම හේතුවෙන් ඔබ සහ හවුල්කරු බැංකුව අතර කිසියම් මතභේදයක් , ඉල්ලීමක්, ක්‍රියාමාර්ගයක්, නීතිමය ක්‍රියාමාර්ගයක් ("ආරවුල්") ඇති වුවහොත්, එවැනි ආරවුල් වලින් සිදුවන හානි, හිමිකම්, ගාස්තු, වියදම් සහ/හෝ අලාභ සම්බන්ධයෙන් ඔබ විසින් PayPal, PayPal හි අනුබද්ධ සහ එහි සේවකයින්ට මුක්තිදානය ලබාදිය යුතුය. ඔබගේ PayPal ගිණුමේ සිට හවුල්කාර බැංකුවට දැනටමත් මාරු කර ඇති අරමුදල් සම්බන්ධයෙන් PayPal ඔබට බැඳී නොසිටින බව ඔබ තවදුරටත් එකඟ වේ.

